السنهالية
١٧٧

يا باغي الخير أقبل

# ඉස්ලාම්

## හැඳින්වීමක්

# نبذة عن الإسلام



The Cooperative Office For Call & Guidance to Communities at Rawdhah Area
Under the Supervision of Ministry of Islamic Affairs and Endowment
and Call and Guidance -Riyadh - Rawdhah
Tel. 2492727 - fax.2401175 E.mail: mrawdhah@hotmail.com P.O.Box 87299 Riyadh 11642

طبع على نفقة : محمد بن إبراهيم بن عثمان العبيد رحمه الله : غفر الله له ولوالديه

# ඉස්ලාම්

## හැදින්වීමක්

කැදවීමේ හා මගපෙන්වීමේ සහයෝගී කාර්යාලය
අල් බදීයා - සමාජ ඒකකය
රියාද්. සවුදි අරාබියාව.

ح المكتب التعاوني بالبديعة ، ١٤٢٦ هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

المكتب التعاوني للدعوة والإرشاد بالبديعة

نبذة عن الإسلام – باللغة السنهالية / المكتب التعاوني للدعوة والإرشاد بالبديعة – الرياض ، ١٤٢٦هـ

٦٨ ص ؛ ١٤ X ٢١ سم

ردمك : ٨ – ٣٢– ٧٩٩ – ٩٩٦٠

١– الإسلام – مبادئ عامة    أ– العنوان

ديوي ٢١٠    ١٤٢٦/٢٤٣٠

رقم الايداع: ١٤٢٦/٢٤٣٠

ردمك: ٨ –٣٢–٧٩٩–٩٩٦٠

# පටුන


1 ඉස්ලාම විමසුම ඇසින්

2 අල් කුර්ආනය ගැන වියතුන්ගේ අදහස්

3 ඉස්ලාම් ගැන ඔවුන්ගේ අදහස්

4 මුහම්මද් (සල්) තුමා ගැන වියතුන්ගේ අදහස්

5 ඉස්ලාමීය සදාචාරය

6 මරණින් මතු ජීවිතය

7 නබිත්වය හා ඉස්ලාම

8 ඉබාදත් ඉස්ලාමීය වත්පිළිවෙත්

9 ඉස්ලාමහි ඒකදේවවාදය

10 ඉස්ලාමහි මානව අයිතිවාසිකම

# 1

# ඉස්ලාම්

# විමසුම් ඇසින්

## ඉස්ලාම් සහ මුස්ලිම්හු:

ඉස්ලාම් යනු අරාබි පදයකි. සාමය, අවනත වීම හා කීකරුවීම යනු එහි අදහසයි. අල්ලාහ්, ස්වකීය, නබි වූ මුහම්මද් රසූලුල්ලාහ් (සල්ලල්ලාහු අලයිහිව සල්ලම්) තුමා මාර්ගයෙන් හෙළිදරව් කළා වූ ධර්මානුශාසනා සහ මාර්ගෝපදේශයන් ඉඳුරා පිළිගැනීම, ඉස්ලාම් වේ.

අල්ලාහ්ට බැතිමත් වෙමින්, ඔහු ගේ මගපෙන්වීම හා රසූලුල්ලාහ් (සල්) තුමා ගේ දේශනාවන්(හදීස්) අනුව, ස්වකීය ජීවිතය මුළුමනින්ම හැඩගස්වා ගන්නේ, මුස්ලිම් වේ. එකී පදනම යටතේ මානව සමාජය ගොඩ නගනු සඳහා ද ඔහු ක්‍රියා ක්‍රියා කරයි. ඉස්ලාමය හඳුන්වනු පිනිස මුහම්මත් ආගම යනුවෙන් යෙදීම වරදක් වේ.එමඟින් ඉස්ලාම් හි හරයට ද පහරක් එල්ල වේ.

දෙවියන් වහන්ස - GOD-යන පදයට අරාබි වහරින් යෙදිය හැකි උචිතතම පදය 'අල්ලාහ්' යන්නයි. මීට බහුවචනයක් හෝ ස්ත්‍රී ලිංග වචනයක් හෝ නැත. එනයින් එය අනුපමේය හා අසහාය යෙදීමක් වේ.

## අඛණ්ඩව පහළ වූ පණිවුඩය:

ඉස්ලාම, අළුත් ආගමක් නොවේ. එහි සාරය වන්නේ, අල්ලාහ් විසින් සෑම නබිවරයෙකු වම හෙළිදරව් කළා වූ නිවේදනය හා මගපෙන්වීමයි.

'කියන්න, 'අපි අල්ලාහ් අදහමු, තවද, ඉබ්‍රාහිම -ABRAHAM , ඉස්මාඊල් -ISMAEL , ඉෂ්හාක් -ISSAK සහ යා'කුබ්-JACOB හා ගෝත්‍රිකයන්, මූසා MOSES ඊසා/JESUS CHRIST සහ සෙසු නබිවරුන්ටත් ඔවුන් ගේ ස්වාමියා විසින් හෙළි කෙරුණා වූ දහම, විශ්වාස කරන බවත් පවසන්න. ඔවුනතර කිසිදු විභේදනයක් සිදු නොකරන බවත්, පවසන්න.'
(අල් කුර්-ආන්-3:83).

මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාට හෙළි කළේ ඉස්ලාම හි සුබාවබෝධාත්මක, පරිසමාප්ත හා අවසාන ස්වරූපයයි.

## ඉස්ලාම හි පංචස්ථම්භක:

ඉස්ලාම, කුලුණු පහක් මත රැඳී ඇත.

(1) ඊමාන්- භක්ති ප්‍රකාශය :-

අල්ලාහ් හැර පිදුමට නිසි සෙස්සෙකු නැති බවත්, කියාමත් පරමාන්ත දවස දක්වා අල්ලාහ් ගේ දූතයා මුහම්මද් (සල්) තුමා ගේ නබිත්වය නිසා, මුස්ලිමුන්ට එතුමාගේ ආදර්ශමත් ජීවිතය අනුගමනය කළ හැකි වේ.

(2) සලාත්- නැමදුම:-

අල්ලාහ් හමුවේ ඉටුකෙරෙන වගකීමක් වශයෙන්, දිනකට පස් වෙලක් අල්ලාහ් නමදිනු ලැබේ. මෙ මගින් අල්ලාහ් කෙරේ වූ භක්තිය යළි යළිත් තහවුරු වී පුනර්ජීවයක් ලබයි. තවද, වැඩිපුර උසස් සදචාරයක් අත්කර ගැනීමෙහිලා, මිනිසා තුළ පෙළැඹවීමක් ඇති කෙරේ. සලාත් නිසා මනස පිවිතුරු වේ, සිත වරදට හා පවට යොමුවීමෙන් වළකී.

(3) සවම- රමළාන් මසෙහි උපවාසය :-

රමළාන් මස මුළුල්ලේ හිමිදිරි උදෑසනය සිට, අවරින් හිරුබැස යන තාක් කල්, දිවාකල ආහාර පානාදියෙන් හා ලිංගික සබඳතාවලින් වැළකී සිටිනු පමණක් නොව, වැරැදි අදහස් හා ආශාවන් ගෙන් ද, මුස්ලිම්හු වැළකී සිටිති. මෙමගින් ආදර

කරුණාව, විශ්වාසදායී භාවය හා කැපවීම් යනාදිය ප්‍රගුණ කෙරේ. තවද, සමාජය පිළිබඳ පුළුල් අදහස්, ඉවසීම, පරාර්ථකාමීත්වය හා අධිෂ්ඨාන ශක්තිය ද වැඩි දියුණු කෙරේ.

(4) සකාත්- අසරණ දන් :-

තම සමාජයේ දිළිඳු ජන කොටස් වෙනුවෙන් විය පැහැදම් කරනු පිනිස, ශේෂ ඉතිරිකිරීම වලින් සියයට දෙකහමාරක් (2 1/2%) වාර්ෂිකව දන්දීම ආගමානුකූල වගකීමක් වේ.

(5) හජ්- මක්කා පූජා ගමන :-

ආර්ථික හා කායික වශයෙන් පහසුකම ඇත්තෝ, දිවිහිමියෙන් එක් වරක් හජ් මෙහෙයය සඳහා මක්කාවට යායුතු වෙති.

තවද, අල්ලාහ් ගේ ප්‍රසාදය පිණිස වෙතියි අදහසින් ඉටු කෙරෙන සෑම ක්‍රියාවක්ම වතාවත් ගනයේ ලා ගැණේ.

අල්ලාහ් ගේ ඒකත්වය හා පරම සර්වාධිකාරය කෙරේ විශ්වාසය පිහිටුවන මෙන් ඉස්ලාම් මිනිසාට අණකර සිටී. මෙමගින් විශ්වය හා එතුළ තමා දරන තත්ත්වය මිනිසාට වටහා ගත හැකිය. මේ ඇදහිල්ලේ හේතුවෙන්, සර්වබලධාරී අල්ලාහ්, නිරන්තරයෙන්ම තමා අභියස සිටිතියි යන හැඟීම තහවුරු වේ. එනයින්, ඔහු කෙරේ පවත්නා අස්ථාන බියසැක හා මිථ්‍යා මතිමතාන්තර පහව් යයි. මේ විශ්වාසය වාචිකව ප්‍රකාශ විය යුතු අතර ක්‍රියාවෙන් සනාථවිය යුතුය. විශ්වාසය පමණක් ප්‍රමානවත් නොවේ. එකම අල්ලාහ් කෙරේ ඇති භක්තිය නිසා, විශ්වය ප්‍රමුඛ සකල සංස්කාරයකම නිර්මාතෘ, ආරක්ෂක, පෝෂක හා සර්වබලධාරී වූ අල්ලාහ් යටතේ සමස්ත මානව සංහතියම එකම පවුලක් වශයෙන් සැලකිය යුතුවේ. කිසියම් නියමිත පිරිසක ගේ පිහිටෙන් භක්තිය දියුණු කර ගනිමින් මෝක්ෂය සෙවීමේ ක්‍රියාව, ඉස්ලාම් හෙළාදකී. අතර මැදියෙකු ගෙන් තොරව, අල්ලාහ් හා සෘජුසම්බන්ධතා පවත්වා ගත යුතුය.

## නිදහස් මිනිසා:

අල්ලාහ් ගේ විශිෂ්ඨතම නිර්මානය, මිනිසාය. මිනිසාට ඉස්තරම හැකියාවන් හා කුශලතාවන් හිමිකර දී ඇත. නිදහස් සිතුම් පැතුම්, ක්‍රියා හා තීයි මහ තෝරා බේරා ගැනීමෙහිලා මිනිසාට පූර්ණ නිදහස ඇත. අල්ලාහ් විසින් ඔහුට සෘජු මාවත දක්වා

ඇත. මිනිසා ගේ ජයග්‍රහණය හා විමුක්තිය රැඳී ඇත්තේ එකී කරුණු දෙවය පිළිපැදීමෙනි. ඉස්ලාම්, මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වය ගැන උගන්වයි. ජාති, කුල, දේශ, භාෂා, ලිංග හෝ වර්ණ දී භේද කිසිත් නොතකා සෑම මිනිසෙකුටම සම තැන පුදකරයි. අල්කුර්ආනයේ සඳහන් අල්ලාහ් ගේ අණපනත් සහ රසූලුල්ලාහ් (සල්) තුමා ගේ ජීවිතාදර්ශය, සෙසු සියල්ල අභිභවමින් උත්කෘෂ්ඨ ස්ථානයක් දරයි. උසස් පහත්, පාලක, පාලිත රජපුත් ගොවිපුත් යනාදීන් කාටත් එය පොදුවේ.

## අල්කුර්ආන් සහා අල්හදීස්:

අල්ලාහ් ගෙන් පරිසමාප්තව පහළ වුණේ අල් කුර් ආනයයි. එය ඉස්ලාමීය දේශනා හා අණ පනත්වල මූලසාරය වේ. ආගම, සදාචාරය, මානව ඉතිහාසය, වතාවත් ඥානය, ප්‍රඥව, අල්ලාහ් හා මිනිසා ගේ අන්තර් සම්බන්ධය, ඇතුළු ව, සමාජ යුක්තිය, ආර්ථිකය, දේශපාලනය, ව්‍යවස්ථා, අධිකරණය, නීතිය හා ජාත්‍යන්තර සම්බන්ධය සඳහා ඉවහල් වන අර්ථාන්විත ඉගැන්වීම් යනාදිය අල්කුර් ආනයේ අඩංගු වැදගත් කරුණු වේ.

මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමා අකුරු නොදත්හ. කියවීමට හෝ ලිවීමට නුපුළුවන, එහෙත් නබි අනුගාමිකයන් සහාබාවරුන් විසින් රසූලුල්ලාහ් (සල්) තුමාගේ උපදෙස් යටතේ අල්කුර් ආනය කට පාඩම් කිරීමත්, ලේඛනගත කිරීමත් සිදුවිය. මේ අනුව අල්කුර්ආනය පහළ වූ ප්‍රකාරයෙන්ම පහළ වූ ප්‍රකෘති භාෂාවෙන්ම (අරාබි) ඕනෑම කෙනෙකුට ලබාගත හැකිව ඇත. එහි අරුත් සඳහන් පරිවර්තන ග්‍රන්ථ භාෂා රැසකින්ම පළවී ඇත. අල් හදීස් යනු රසූලුල්ලාහ් (සල්) තුමා ගේ දේශනා, අදහස් හා ක්‍රියාවන්ය. ඇප කැපවූ සහාබාවරුන් විසින් මෙවා ඒකරාශි කරන ලදී. හදීස්වලින් අල්කුර් ආනිය පාඨයන් ප්‍රවේශමෙන් විග්‍රහවේ.

## වතාවත්හි අරමුණ:

ඉස්ලාම් හුදෙක් චාරිත්‍රානුකූල ප්‍රතිපත්ති වතාවත් පමණක් අනුමත කරන්නේ නොවේ. එමගින් අධිෂ්ඨානය හා ක්‍රියාව අවධාරනය කෙරේ. අල්ලාහ් නැමදීම යනු, ඔහු පිළිබද අවබෝධය, ඔහුකෙරෙහි වාත්සල්‍යය හා ජීවිතයේ සෑම කාර්යාවලියකදීම, කාර්යාංශයකදීම, ඔහුගේ අණසකට අනුකූලව ජීවත් වීමයි. යහපත සිදුකරමින්, ඔහු තහනම් කළාවූ ක්‍රියා හා හිංසාවලින් වැළකී, සිල්වත් හා යුක්ති ගරුකව ජීවත්වෙමින්, මිනිස් වර්ගයාට සේවය කිරීම මාර්ගයෙන් අල්ලාහ්ට සේවය කළ යුතුය.

අල්කුර්ආනයෙන්, මෙ අරමුණ මෙසේ විනීත ලෙස විස්තර කෙරේ."පෙරදිගට හෝ බටහිරට ඔබ ගේ මුහුණ හැරවීම ශීලයක් නොවේ. ශීලය වන්නේ, අල්ලාහ්,කියාමත් පරමාන්ත දවස, මළක් වරුන් සුරදූතයන්, ආගම හා නබිවරුන් කෙරේ විශ්වාසය පිහිටුවීමයි. අල්ලාහ් කෙරේ සෙනෙහසින්, ඥතින් අනාථයන් හා දිළින්දන්, මගීන් හා යාචකයන්ට ස්වකීය වස්තුවෙන් විය පැහැදීම කිරීම; වහලුන් නිදහස් කරවීම; අදාළ වතාවත් පිරීම; සකාත් ගෙවීම; පොරොන්දු ඉටුකිරීම; දුක්පීඩාදී බෙදයන්හි දී ඉවසීම යනාදියයි. මෙවැන්නෝ සැදැහැවත්හු වෙති. මෙවැන්නෝ අල්ලාහ්ට බියැත්තෝ වෙති."

(අල්කුර්ආන් 2:177)

## ඉස්ලාමීය ජීවන රටාව:

ඉස්ලාම මගින්, ජනතාවගේ විවිධ ක්ෂෙත්‍රයන්ට අදළ අත්දමින් මාර්ගෝපදේශ සපයමින්, ස්ථිරසාර ජීවන රටාවක් ඉදිරිපත් කෙරේ. එමගින් ලැබෙන මගපෙන්වීම ඉතා පැහැදිලිය. අවබෝධයට පහසුය. ජනතාවගේ සාමාජික, ආර්ථික, දේශපාලනික, සදචාරාත්මක හා අධ්‍යාපනික ජීවිතය ද ඊට ඇතුළත් වේ. අල්කුර්ආනය මගින් මිනිසාට, මෙලෝ ජීවිතයේ පරමාර්ථය, ඔහුගේ යුතුකම හා වගකීම; තමන් මෙන්ම ස්වකීය ලේ ඥතින්, සමාජයේ සහෝදර මිනිස් වර්ගයා, ස්වකීය මැවුම්කාරයා විෂයයෙහි යුතුකම් හා වගකීම් යනාදිය සිහිපත් කරවනු ලැබේ; අර්ථාන්විත ජීවිතයකට අදළ මූලික මගපෙන්වීම සැපයේ. පසුව, ඒ උසස් පරමාර්ථය ප්‍රායෝගික වශයෙන් මුදුන්පත් කරගනු පිනිස, මනුෂ්‍ය භාවය නම් අභියෝගයකට ලක් කෙරේ. ඉස්ලාමීය, මිනිස් ජීවිතය විෂම තරඟකාරී අංශ වලින් තොරව, ජීවිතය ඒකීය වශයෙන් සම්පූර්ණ වේ. ගිහි හා පැවිදි වශයෙන් මිනිසකු තුළ විෂම අංශ දෙකක් නැත. මනුෂ්‍ය ස්වභාවය වශයෙන්, එතුළ මේ අංශ දෙකම ඒකරාශි වේ.

## ඓතිහාසික නිරවද්‍යතාවය

මුහම්මද් (සල්) තුමා, ක්‍රි. ව. 570 දී, අරාබියේ මක්කා නගරයේ ප්‍රභූ පවුලක උපත ලැබූහ. එතුමාට හතළිස් වන වියවන කල, ප්‍රථම වහී දිව්‍ය හෙළිකිරීම පහළ වන්නට විය. එතුමා ධර්මානුශාසනාවන් ඇරඹූ වහාම එතුමාට හා අස්හාබින්ට අනේක ප්‍රකාර අවහිර බාධා එල්ල විය. ඔවුහු නානා හිංසා අතවරයනට මුහුණ දුන්හ. මේ නිසා අල්ලාහ්ගේ අභිමතය අනුව, ඔවුහු අරාබියේ සෙසු නගරයක් වූ මදීනාවට හිජ්රත් කළහ. වසර 23 ක තරම් සුළු කාලයක් තුළ එතුමා තම නබිත්වයේ වගකීම සියල්ල මුදුන්පත් කොට වයස අවුරුදු 63 දී මෙලොවින් තුරන් වූහ. එතුමා අල්කුර්ආනයේ

ඉගැන්වීම් වලට අනුකූලව, සමස්ත මානව සංහතියටම ආදර්ශමත්වූ, පරිපූර්ණ ජීවිතයක් ගත කළහ.

## ඉස්ලාමිහි යථාර්ථවාදී කරුණු:

ඉස්ලාම හී සත්‍ය දෙසීම පැහැදිලි හා නොවක් සෘජු මාර්ගය නිසා, සත්‍යය සොයන වුන්ට එමගින් බෙහෙවින් අනුග්‍රහයන් අත්වේ. මෙය, ජීවිතයේ සව්කාර ගැටළුවකටම විසඳුමක් වේ. මහගු සාර්ථක හා අංගසම්පූර්ණ ජීවිතයක් සඳහා, සෑම අවස්ථාවකදීම සකළ සංස්කාරකම නිර්මාතෘ සව්බලධාරී, පරම දයාබර වූ අර්ක්ෂකයා වන අල්ලාහ් ගේ මග පෙන්වීම ලැබේ.

## මුස්ලිම් ජනග්‍රහණය (1975 දී කළ ගණනයකි.)

අප්‍රිකාව -දශලක්‍ෂ 224. 20
ආසියාව -දශලක්‍ෂ 575. 30
යුරෝපය -දශලක්‍ෂ 20. 00
උතුරු හා දකුණු අමෙරිකාව-දශලක්‍ෂ සහ ඕස්ට්‍රේලියාව 4.00

එකතුව- 823. 50

මුස්ලිම් ජනගහණ වර්ධනය හා ඉස්ලාමය වැළද ගැනීමෙහිලා ජගත් ව්‍යාප්ත ප්‍රවරණතාවය සලකා බලන කල, 1975 න් වසර නවයකට පසු, ලෝක මුස්ලිම් ජනගහණය කෝටි සියය ඉක්මවා ඇතැයි විශ්වාස කෙරේ.

රටේ බහුජනතාව වශයෙන් එනම 50% කට වඩා මුස්ලිම් ජනකායක් වෙසෙන රාජ්‍යයන් 58 ක් ඇත.

## නූතන ගැටළුවලට විසඳුමක් වන ඉස්ලාම්:

මානව සහෝදරත්වය

නූතන මිනිසාට මුහුණ පෑමට සිදුව ඇති ප්‍රධාන ගැටළුවක් නම් ජාතිවාදයයි. ආර්ථික වශයෙන් සංවර්ධිත රටවල, මිනිසුන් සඳට සංක්‍රමණය කලත්, මිනිසා සිය සහෝදර මිනිසා කෙරේ දක්වන වෛරය හා සටත්කාමිත්වය වලක්වාලීමට ඒ රටවල් සමත්වී

නැත.අනෙක් අතට ඉස්ලාම් ඉකුත් වසර 1400 තුළ ජාතිවාදය තුරන් කළ හැකි අන්දම ක්‍රියාවෙන් ඔප්පු කළේය. සෑම වසරකදීම හජ් සමයෙදී ඉස්ලාමීය සහෝදරත්වය නමැති හාස්කම, සියැසින් දැකගත හැකිය. එහිලා සෑම ජාතියකම, දේශයකම දනෝ තම සහෝදරත්වය ක්‍රියාවෙන් විදහා දක්වති.

## නොබිඳුණු ජීවිත දර්ශනය

මිනිසා, ස්වකී මනුෂ්‍යත්වයේ පරමාර්ථයට අනුව ජීවත් වේ. තවුස් දිවියකට ආවඩන සමාජ මගින්, ජීවිතයේ විවිධ හා විෂම ක්ෂේත්‍රයන් හි පවත්නා අවශ්‍යතාවයන් ඒකරාශී කළ නොහැකිය. තපෝ වෘත්තිය හා ආගමික හාවද්ධ, විද්‍යාත්මක හා ආධ්‍යාත්මික හාවයද අතර ගැටුම් පවතී. මේ ගැටුමට ඉස්ලාමයෙන් අවසානයක් දැක්වේ. එමගින් මිනිස් ජීවිත දර්ශනයට පිටුවහලක් අත්වේ.

# 2

# අල් කුර්ආනය

# ගැන වියතුන්ගේ අදහස්

## අල් කුර්ආනය ගැන වියතුන්ගේ අදහස්:

මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන්, දිව්‍යමය මාර්ගෝපදේශ, දෙයාකාරයකින් පහළ විය.

(1) අල්ලාහ්ගේ වදන් මගින්,

(2) මිනිස් වර්ගයා හා සබඳතා පවත්වා ගනු පිණිස අල්ලාහ් විසින් තෝරා ගන්නා ලද නබිවරුන් මගින්,

මෙ දෙවැදෑරුම කරුණු කවදත් සමගාමීව පවතී. ඉහත සඳහන් කළ කවර කරුණක් හෝ නොසලකා හැරිය කළ, අල්ලාහ්ගේ මනාපය කවරෙක් දැයි දැනගැනීමෙහිලා නොමග යාමක් සිදුවේ. හින්දු භක්තිකයෝ නබිවරුන් ගැන නොසලකා, ඒ නබිවරුන්ගේ පොත් දහම් වලට පමණක් අවධානය යොමු කළහ. මෙ නිසා, ඒවා හුදෙක් වාක්‍ය ප්‍රහේළිකාවන් බවට පත් වී ඉඳුරා අතර මං විය. මෙ අන්දමින් ම ක්‍රිස්තියානීන් විසින්, අල්ලාහ්ගේ පොත ගැන නොසලකා, සෑම වැදගත් කමක්ම යේසුස් වහන්සේ වෙත යොමු කරන ලදි. මෙ අනුව උන්වහන්සේට දිව්‍යත්වයක් ආදේශ කළ අතර, බයිබලයේ සාර ධර්මය එනම් අල්ලාහ්ගේ ඒකීයත්වය හඟවන තව්හිදය අමතක කොට දමන ලදි.

මේ හේතුවෙන් අල්කුර්ආනය පහල වන්නට පෙරාතුව පහළ වූ දිව්‍ය හෙළිකිරීම -වහී-තිදසුනක් වශයෙන්, පැරණි තෙස්තමේන්තුව සහ ශුභාරංචි යනාදිය ග්‍රන්ථාරූඪ වූයේ ඒ නබිවරුන්ගේ ඇවෑමෙන් බොහෝ කලකට පසුවය. එයද සිදුවූයේ පරිවර්තන වශයෙනි. හේතුව මූසා නබි(MOSES) (අලයි) තුමාගේ හෝ ඊසා නබි (JESUS CHRIST) (අලයි ) තුමාගේ අනුගාමිකයින් විසින්, ඒ නබිවරුන් ජීවතුන් අතර සිටියදී ම ඔවුන්ගේ ධර්මානුශාසනාවන් ආරක්ෂා කිරීම සඳහා, සැලකිය යුතු වෑයමක් නොදැරීමයි. ඒ නබිවරුන්ගේ මරණයෙන් බොහෝ කලකට පසුව, ඒවා ලේඛන ගත විය. මේ අනුව, අද අප අතර බයිබලයේ ස්වරූපයෙන් පැරණි හා අලුත් තෙස්තමේන්තු පවත්නා ග්‍රන්ථය අදාළ නබිවරුන්ගේ ප්‍රකෘති ධර්මානුශාසනාවන්, අනුගාමිකයන් විසින් ආදේශ කිරීම, ඉවත් කිරීම සිදුකලා වූ පෞද්ගලික කර්තව්‍යයකි. අනෙක් අතට, අවසාන දිව්‍ය හෙළිකිරීම සිදුකලා වූ පෞද්ගලික කර්තව්‍යයකි. අනෙක් අතට අවසාන දිව්‍ය හෙළිකිරීම වලින් සමන්විත අල් කුර්ආනය ප්‍රකෘති ආකාරයෙන්ම පවතී. එහි ආරක්ෂාව අල්ලාහ් විසින් ම දරනු ලැබේ. මේ නිසා මුහම්මද් නබි ( සල්) තුමාගේ ජීවිත කාලය තුළදීම, තල්පත්, සත්ව සම හා ඇටකටු යනාදීන් හි වෙන්වෙන් වශයෙන් වුවද, ඒවා ලේඛනගත විය. මේ හැර, මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාගේ ලක්ෂ සංඛ්‍යාත සහාබාවරුන් (අනුගාමිකයන්) විසින් සම්පූර්ණ කුර්ආනයම කටපාඩම් කරගන්නා ලද අතර රසූලුල්ලාහ් (සල්) තුමාගේ පශ්චිම අවධියේ එතුමා ජිබ්රීල් (Gabriel)(අලයි) හමුවේ වසරකට වරක් හෝ දෙවරක් කියවා ඉදිරිපත් කළහ. ඉන්මතු, පළමු කලීෆා වූ අබූබක්ර් (රළි) තුමාගේ මෙහෙයීමෙන් සම්පූර්ණ කුර් ආනයම ඒක රාශිකොට, තනි ග්‍රන්ථයක් වශයෙන් සකස් කරන ලදී. රසූලුල්ලාහ් (සල්) තුමාගේ වෘත්තීය ලේඛකයා වූ සයිද් ඉබ්නු තාබිත් (රළි) තුමා, මෙය ලේඛනාරූඪ කළහ. අබූබක්කර් (රළි) තුමාගේ මරණීය මොහොත දක්වා, එය එතුමන්ගේ භාරයේ පැවතියේය. අනතුරුව දෙවන කලීෆා වූ උමර් (රළි) තුමාගේ භාරයෙත්, එතුමාගේ ඇවෑමෙන් හෆ්සා (රසූලුල්ලාහ් සල් තුමාගේ මෙහෙසිය) තුමිය ගේ භාරයෙත් පැවතුණි. තෙවන කලීෆා වූ උස්මාන් (රළි) තුමා, කුර්ආනයේ මුල් පිටපත් ඇසුරින් පිටපත් කිපයක් කරවා, ඉස්ලාමීය අධිරාජ්‍යයේ ප්‍රධාන නගරයට යැවූහ.

අල්කුර්ආනය, මෙසේ සූපරීක්ෂාකාරීව සුරකිනු ලැබුණේ, මානව සංහතියේ මතු පරම්පරාවලටද එමගින් මග පෙන්වීම සැලසීමේ පරමාර්ථයෙනි. එය පහළ වූ මාතෘ-අරාබි-භාෂාවෙන්, ආමන්ත්‍රණය නොතේරෙන්නේ එබැවිනි. එමගින්, පොදුවේ මිනිසුන්ට ආමන්ත්‍රණය කෙරේ.

''මනුෂ්‍යය ඔබ ඔබේ ස්වාමියා ගෙන් ඉවත් කරවන්නේ කවරෙක්ද?''

මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාගේ හා ලොව පුරා වෙසෙන මුස්ලිම් සත්දනන්ගේ ජීවිතාදර්ශයෙන් කුර්ආනීය ඉගැන්වීම් තහවුරු කෙරේ. අල්කුර්ආනයේ විශිෂ්ටත්වය වන්නේ, පොදු යහපත උදෙසා පහසුවෙන් ග්‍රහණය හා ආදේශ කරගත හැකි අවවාදනුශාසනාවන් ඉදිරිපත් කිරීමයි. කවර මිනුම් ක්‍රමයකින් වුවද, පරිසමාප්ත ඥානය වන්නේ, කුර්ආනීය ඥානයයි. එමගින් ශරීරය පිළිකුල් කොට කොන්කර දැමීමක් හෝ එයට ආත්ම වධ වේදනාවන් පැමිනවීමක් නොකරෙයි. ආත්මය ගැන නොසලකා හැරීමක්ද නොකෙරේ. මනුෂ්‍යයෙකුට දිව්‍යත්වය හෝදෙවියකුට මනුෂ්‍යත්වය හෝ ආදේශ නොකෙරේ. මවනු ලැබුවා වූ පරිද්දෙන්ම, සමස්ත සංස්කාරයක්ම ඒ ඒ ස්වභාවයේ ලා සලකනු ලැබේ.

සැබැවින්ම අල්කුර්ආන්හි ප්‍රබන්ධකයා මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමා යයි මතය දරණ විශාරදයන් විසින්ම, අල් කුර්ආනයේ, පුහුදුන් මිනිසෙකු විසින් සිදු කළ නොහැකි අසාමාන්‍ය අනුභාවයක් පවත්නා බව පිළිගැණේ. සයවන ශත වර්ෂයේ විසූ පුරුෂයෙකු විසින් කුර්ආන්හි සඳහන් වන්නාක් බඳු, විද්‍යාත්මක සත්‍යයන් විග්‍රහ කළ හැකිවේද? ගර්භාශයක් තුළ කලලයක් භ්‍රමණය වන ක්‍රමය නූතන විද්‍යාඥයෙකු මෙන් ඒ තිසා තිවැරදි ලෙස වර්ණා කළ හැකිවේද?

දෙවනුව, ස්වකීය සතලිස් වන විය දක්වා, ඉඳුරා අවංක විශ්වාසවන්ත භාවයට නමගිය මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාට, අරාබියේ කාලීන වියත් කවීන් හා කථිකයන්ටත් නුපුළුවන් වූ තරමෙ අනුපමෙය සාහිත්‍ය කෘතියක කර්තෘවරයා විය හැකියැයි පැවසීම තර්කානුකූල විය හැකිද?

අවසාන වශයෙන්, අවංක හා විශ්වාසවන්ත භාවය නිමිත්තෙන් 'අල් අමීන්' නම විරුදවලිය ලත්, ස්වකීය සමාජයේ හා නොමුස්ලිමුන්ගේ ද ගරුබුහුමනට ලක්වූ පුරුෂයෙකු, ව්‍යාජ නිවේදනයක් සහිතව ඉදිරිපත් වෙමින්, භූතලය මත අතිශ්‍රේෂ්ඨ සමාජයක් ගොඩනැංවිය හැකි තරමෙ සුශික්ෂිත, අවංක හා විශ්වාස දයක පිරිසක් සූදනම් කළේ කෙසේදැයි විමසා බැලිය යුතුය.

සැබැවින්ම, අල්කුර්ආනය අල්ලාහ් හෙළිදරව් කළ ·ග්‍රන්ථය බැව් අවංක හා අපක්ෂපාති විමර්ශකයන් අදහනු ඇත.

සැබැවින්ම, අල් කුර්ආනය අල්ලාහ් හෙළිදරව් කළ ග්‍රන්ථය බැව් අවංක හා අපක්ෂපාති විමර්ශකයන් අදහනු ඇත.

අල්කුර්ආනය සම්බන්ධයෙන් සුප්‍රසිද්ධ නොමුස්ලිම් වියතුන් දරන අදහස් එමටය. ඒවා අවශ්‍යයෙන්ම පිළිගතයුතු නැතත්, ඔවුන්ගේ ඇතැම් අදහස් මෙහිලා සඳහන්

කිරීම වරී. නූතන ලෝකය, අල්කුර්ආනයේ සත්‍යතාවයට කොතරම් සමීපව සිටින්දැයි මෙමගින් පැහැදිලි වේ. ඉහත සඳහන් කරුණු සිතෙහි රඳවා ගෙන, අල් කුර්ආනය පරිශීලනය කරන ලෙස, විවෘත මනසක් පිහිටි විද්‍යතුන්ගෙන් ඉල්ලා සිටිමු. කුර්ආනය, සාමාන්‍ය පුරුෂයෙකු විසින් රචනා කළ නොහැක්කක් වග ඔවුන්ට ප්‍රත්‍යක්ෂ වන බව නිසැකය.

"අල් කුර්ආනය කියවන විට, මුලදී අමිහිරිව, පසුව සෑම අවස්ථාවකදීම, නැවුම් වෙමින්, කුල්මත් කරවමින්, විශ්මයට පත්කරවමින්, අවසානයේදී එය කෙරෙහි ගරුසරු ආකල්පයක් ඇතිකරයි..... එහි ලතාව , ශෛලිය, අඩංගු කරුනු අතර පවත්නා එකඟත්වය, හා අචල අරමුණ ප්‍රශංසනීය වේ. ඒ කෙරෙහි සදාකාලික වූ සැබෑ අවනතභාවයක් හටගනී. මෙසේ මේ ග්‍රන්ථය මතු සෑම වකවානුවක දීම විශිෂ්ඨ බලපෑමක් පවත්වා ගන්නේය."

ගෝයත් (T. P. Hughes' Dictionary of Islam- පිටුව 526)

"ජගත් ධර්ම ග්‍රන්ථ අතුරින් කුර්ආනය ඇත්තෙන්ම විශිෂ්ඨ ස්ථානයක් උසුලයි. ඉතිහාසය ගොඩනගන සාහිත්‍ය ක්ෂේත්‍රයේ ළාබාලතම තැන දැරුවත්, මේ මගින් විශාල ප්‍රමාණයක මිනිස් සමාජ බිහිකොට ඇත. මිනිස් ආකල්පයන්හි ඉඳුරා නව මුහුණුවරක් මෙන් ම නව ජීවන රටාවක් ද බිහිකර ඇත.

මුලින් ම, අරාබි අර්ධද්වීපයේ, කාන්තාරය ප්‍රමාණාතික්‍රාන්ත විවිධ ගෝත්‍රිකයන්, එකම වීර ජාතියක් බවට පත් කළේය. පසුව, මහම්මදීක ලෝකයේ විශාලතම දේශපාලන හා ආගමික සංවිධානයක් වශයෙන් පෙරමුණ ගත්තේය. මෙය වත්මන් යුරෝපයේ හා පෙරදිග රටවල විශාලතම බලවේගයක් වශයෙන් සැලකේ."

G. මාර්ගෝලියත්- J. M. රොඩ්වෙල්ගේ The Koran පොතෙහි හැඳින්වීම- New York - Every Man's Library 1977- පිටුව 7.

"ශ්‍රේෂ්ඨ කාව්‍යයක්! පසුව, දුරින් හා කාලයෙන් ඈත එපිට වසන්නන් තුළ, තර්ක විරහිත හැඟීම් උදකරන, ඊටත් වඩා මානසික සංවර්ධනයක් හට ගන්වන ශ්‍රේෂ්ඨ කාව්‍යයක්! කියවීමේ අරුචිය තුරන් කොට ඉතා ඔනෑකමින් කියවන්නට ඉවහල් වන්නක්! මිනිස් සිතකින් නිපැදවූ ඉස්තරම කෘතියක්ය යන අහිතකර ආකල්පය පහව්, විමතියක් හා ඒ කෙරේ තදඇල්මක් ද හටගනී."

Dr. ස්ටෙයින්ගාස්- T. P. Hughes Dictionary of Islam පිටුව 526-7

"අල්කුර්ආනය මුහම්මද් තුමන්ගේ කෘතියකැයි පවසන්නන්ගේ කල්පිතය, සාවද්‍ය සහගත බව, ඉහත සඳහන් කරුණුවලින් පෙනේ. අකුරු නොදත්තෙකු විසින්, මුළු මහත් අරාබි සාහිත්‍යයේ විශිෂ්ටතම සාහිත්‍යධරයා විය හැක්කේ කෙසේද? තත්කාලයේ අත් කිසිදු මිනිසෙකු නොදැන සිටි තරමේ අල්ප මාත්‍ර වරදකින් තොරව, එබඳු විද්‍යාත්මක සත්‍යයන් හෙළිදරව් කළ හැක්කේ කෙසේද?"
Maurice Bucaille - The Bible, The Quran and Science 1978(පිටුව 125)

"එමනිසා මෙහිලා පරිවයක් හෝ අනුද්‍ෘතිමකින් තොරව, සාහිත්‍ය කෘතියක් සම්බන්ධයෙන් කරන රශාස්වාද මිම්මක් නොකල යුතුය. කුර්ආනය මගින් මුහම්මද් තුමාගේ ප්‍රතිවාදීන් හා රටවැසියන් තුළ ඇතිකලා වූ ප්‍රතිපලයන් ගැන සැලකිළිමත් විය යුතුය. ශ්‍රාවකයන් තුළ ඒසා ශක්තිමත් බලපෑමක් ඇතිකොට, සුදන දුදනන් සියල්ල එකම බැම්මකින් බැඳ, මහඟු සංවිධානාත්මක සමාජයක් ගොඩනැගිය හැකිවූවානම්, එහි භාෂා ශෛලීය අංග සම්පූර්ණ වේ. ඇත්තෙන්ම අල්කුර්ආනය මගින් අශිලාචාර ගෝත්‍රිකයන් තුළින් ශිලාචාර ජාතියක් බිහිවිය. ඉතිහාසයේ ගොරෝසු, නොනැමෙන ජේදයකින් නවමු නම්‍යතාවයක් හට ගත්තේය."

Dr. Steingass හියුස් ගේ Dictionery of Islam (පිටුව - 528)

"මට පෙරවූවත් දැරූ ප්‍රයත්න තවදුරටත් දියුණු පිණිසත් අරාබි අල්කුර්ආනයේ අති විශිෂ්ඨ හා පූජනීය වූ භාෂා කෞශල්‍යතාවය සම්බන්ධයෙන් පිළිගත හැකි යම කි ඵවක් ගෙනහැර දැක්වීම පිණිසත් මමද අල්කුර්ආනය පරිශීලනය කිරීමෙහිලා වෙහෙස ගත්තෙමි. එහි විවිධාකාර වූ විසිතුරු ශෛලියක් ගෙනහැර පාන පණිවිඩයට අතිරේකව, මිනිසාගේ ශ්‍රේෂ්ඨතම සාහිත්‍ය මාධ්‍යය වශයෙන් උසුලන අනභිභවනීය ස්ථානයත් සැලකුව මනාය. අල්කුර්ආනය කියවන කළ, ශ්‍රවනය කල පමණින්, දැසින් කඳුළු ගලන බවත්, අධ්‍යාත්මික වශයෙන් උත්තරීතර ඵලයක් අත්වන බවත්, එය අදහන්නෝ ප්‍රකාශ කරති. මෙ අදහස පූර්ව පරිවර්තකයන් විසින් ඉදුරා නොසලකා හැර ඇත."

Arther J. Arberg-The Koran Interpreted, London - Oxford University Press 1964-පිටුව 10

අල්කුර්ආනය, නූතන විද්‍යාත්මක පහතින් මනා ලෙස පිරික්සීමේ දී ඒ දෙක අතර පවත්නා අන්‍යොන්‍ය ඒකභතාවය සක්සුදක් සේ පැහැදිලි වේ. මෙ බැව් මීට පෙර බොහෝ අවස්ථාවල ගෙන හැර දැක්වීමු. මුහම්මද්ගේ දවස පැවති දැනුම මට්ටම

අනුව, මෙබඳු වගන්ති සඳහන් කෘතියක, ප්‍රබන්ධකයාවීමෙ හැකියාව මිනිසකු තුල පැවතුනේ යැයි කොහෙත්ම සිතාගත නොහැකිය. අල්කුර්ආනයට එකී උත්තුංග ශ්‍රේෂ්ඨත්වය හිමිවන්නේ ඊට භෞතිකවාදී විග්‍රහයක් කිරීමෙහිලා මධ්‍යස්ථ මතධාරී විද්‍යාඥයෙකුට හැකියාවක් නැතිවන්නේත් ඒ හේතුවෙති.

Maurice Bucaille- The Quran and Modern Science- 1981 පිටුව - 18

# 3

# ඉස්ලාම් ගැන ඔවුන්ගේ අදහස්

මුහම්මද් රසූලුල්ලාහ් (සල්ලල්ලාහු අලයිහිව සල්ලම්) තුමාට පහළවූ ඉස්ලාමය, පෙර පහළ වූ සෑම ආගමකම එකතුවක් හා සමාප්තයක්වේ. මෙනයින්, එය සෑම යුගයකට මෙන්ම සෑම ජන කොටසකට මපොදුවේ පහළ වී ඇත. මෙය අගනා සාධක වලින් සනාථ වේ.

පළමුව, මේ ශුද්ධ වූ ග්‍රන්ථයේ - කුර්ආනයේ අන්තර්ගත කරුණුවලට හා එහි තිමාවට සරිලන අන් කිසිදු ග්‍රන්ථයක් පහළ වී නැත. දෙවනුව, සෙසු කිසිදු දහමක් සෑම යුගයකට මෙන්ම, මිනිස් ජීවන රටාවේ සෑම ක්ෂෙත්‍රයකට ම ගැලපෙන ලෙස පහළ වී නැත. මානව සංහතියට පළල් ආකාරයකින් අමතමින් සියලුම මානව ගැටළුවලට මූලික මගපෙන්වීමක් ඉදිරිපත් කරන්නේ ඉස්ලාම් පමණි. මේ සියල්ලට වඩා, ඉස්ලාම්, මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාගේ නායකත්වයෙන් මෙන්ම, ඉනික්බිති පුරා ශත වර්ෂ දහ හතරක් මුළුල්ලේම, ආදර්ශවත් සමාජ ගොඩනගමින් එහි විශිෂ්ටත්වයද ලොවට සනාථ කර ඇත.

ප්‍රමාණවත් භෞතික සම්පත්වල ආධාරයකින් තොර ව, ස්වකීය ප්‍රතිවාදීන් පවා ඉස්ලාමීය තුරුළට ගැන්මෙහිලා, මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමා ලත් ජයග්‍රහණය, ඇත්තෙන්ම හාස්කමකි. ප්‍රතිමා වන්දකයෝ, මුතුන්මිත්තන්ගෙන් ගතානුගතික පූජා වතාවත් අන්ධානුකරණය කළෝ, ගෝත්‍රික වාද භේද වර්ධනයකළෝ මානව ගරුත්වය හා රුධිරය අය ඨාඅන්දමින් කෙලෙසමින් විසූවෝ, ඉස්ලාම් හා එහි නබිතුමන් යටතේ අතිසුශික්ෂිත දනන් බවට පරිවර්තනය වූහ. ඉස්ලාම් මිනිසාට අධ්‍යාත්මික ශ්‍රේෂ්ඨත්වයත්, මනුෂ්‍යාභිමානයත් අත්කර දුන්නේය. මිනිසුන්ගේ සාමාජික, සංස්කෘතික, සදචාරාත්මක, ආර්ථික යනාදී සෑම

කටයුත්තකට ම අදාළ මූලික නීති රීති හා පිළිවෙත් ඉස්ලාමය මගින් සකසා දෙන ලදී. මේවා මනුෂ්‍ය ස්වභාවය හා කොතරම් ගැලපේද යත් කවර යුගයකටත් ,එය යෝග්‍ය වන්නේය.

මුල් අවධියේදී ඉස්ලාම් හි සුවිශේෂ සාර්ථකත්වය වටහා ගනු වෙනුවට බටහිර ක්‍රිස්තියානිහු ඉස්ලාමය තමන් තරග වදින්නට බිහි වූ ධර්මයක් වශයෙන් සලකන්නට වූහ . මෙකී ආකල්පය කුරුස යුද්ධ සමයේදී තවත් බලවත් විය. මේ නිසා ඉස්ලාමය වනසා ලන අරියෙන් දහස් සංඛ්‍යාත පොත් පත් පල කලහ. එනමුත් ඉස්ලාම් හි ඉස්තරම් ශ්‍රේෂ්ඨත්වය නූතන විශාරදයන්ට හෙළිදරව් වීමෙන් පසු, ඔවුහු ඉහත කී රීතියා පක්ෂග්‍රාහී ලේඛකයන් ගේ චෝදනා සපුරා සාවද්‍ය බව, ලොවට පැහැදිලි කරන්නට වූහ.

නූතන සමයේ, ඇතැම් සුප්‍රකට මුස්ලිම් නොවන විශාරදයන්, ඉස්ලාම් සම්බන්ධයෙන් දරන අදහස් සැලකිල්ලට ගත මනාය. ඇත්තෙන්ම සත්‍යයේ සත්‍යතාවය සනාථ කරනු පිණිස බාහිර ආධාරෝපාකාර අවශ්‍ය නැත. එහෙත් කාලාන්තරයක් මුළුල්ලේ දියත් කළා වූ දූෂමාන ව්‍යාපාර හේතුවෙන් ස්වාධීන හා සත්‍යවාදී චින්තකයන් ගේ චිත්ත සන්තානයේ ද වැරදි ආකල්ප රෝපනය වී පැවතිය හැකිය. ඉස්ලාම් හි තත්වාකාර අගය පහත සඳහන් නිරීක්ෂණ තොරතුරු මගින්, අවබෝධවනු ඇතැයි උදක් ම අපේක්ෂා කරමු.

"මෙය - ඉස්ලාම් - පූජක භාවය වෙනුවට මනුෂ්‍යභාවය ස්ථාපනය කළේය. මෙමගින් වහලුන්ට අපේක්ෂා සහගත විශ්වාසයත්, මානව සංහතියට සහෝදරත්වයත්, මනුෂ්‍ය ස්වභාවයේ මූලිකාංග පිළිගැනීමක්ද සිදුකෙරේ" Canon Tayior 1887.10.07 දවල්වර් හැම්ටන් ගිබ් පූජකසභාවේදී කළ ප්‍රකාශයක්.The Preaching of Islam (පිටුව 71-72 ) Arnold විසින් උපුටා දක්වන ලදී.

"ඉස්ලාම් හි මහඟු පිළිවෙත්වලින්, විශිෂ්ටතම අංගයක් වනුයේ, සාධාරණත්වය පිළිබඳ හැඟීමයි. මා කුර් ආනය කියවන කල, එකී උතුම් පිළිවෙත හුදෙක් ව්‍යාජයක් නොව, දෛනික මනුෂ්‍ය ජීවිතයේ පැවැත්මට උචිත වූ ප්‍රායෝගික ජීවන ධර්මයක් බව පැහැදිලි වේ. මෙය, මුළු මහත් ලෝකයටම යෝග්‍ය වේ."

සරෝජිනි නායුඩු - ඉස්ලාම් හි පිළිවෙත් නැයින් කරන ලද දේශන Speaches And Writings of Sarojini Naidu Madras 1918 පිටුව 167.

"සටන්කාමී මුස්ලිමුන් විසින් අසිපත් තුඩින්, ලොව පුරා ඉස්ලාමය - බලයෙන් - කාවද්දන ලදැයි ඉතිහාසඥයන් නොකඩවා කළ ප්‍රකාශය බැරෑරුම් මුසාවක් වන

වග කෙසේ හෝ ඉතිහාසයෙන් ම සනාථ වේ". De Lacyo'leary Islam at the Crossroads- London 1923පිටුව 8.

"මනුෂ්‍ය ශුභසිද්ධිය පිණිස, ඉස්ලාමයෙන් ඉටුවිය යුතු තවත් වැඩ කොටසක් ඇත. යුරෝපයට වඩා, ඉස්ලාම් පෙරදිගට සමීප ව ඇත. මෙ මගින් සමාජාන්තර වශයෙන්, මනා අන්‍යොන්‍ය අවබෝධයක් හා සහයෝගිතාවයක් පවත්වාගෙනඇත. විවිධ ජනසමාජ අතර සමානාත්මතාවය හා සමාන වරම, අයිතිවාසිකම් පුද එක්සත් කිරීමෙහි ලා, සෙසු කිසිදු සමාජයක් මෙබඳු සාර්ථක වාර්තාවක් පිහිටුවා නැත. ජාති හා පාරම්පරික අසමගිකම්වලින් ගැටෙන ජන සමාජයක් සමගි සම්පන්න කිරීමෙ ශක්තිය, තවමත් ඉස්ලාමයට ඇත. බටහිර හා පෙරදිග මහා ජන සමාජයන් අතර පවත්නා විරුද්ධවාදීකම, සාමකාමී මුහුණුවරකින් තුරන් කළ හැක්කේ නම්, ඉස්ලාමය ඒ සඳහා යෝග්‍යතම මාධ්‍යය වේ. පෙරදිග ජාතීන් හා සම්බන්ධතා පවත්වා ගැනීමෙහි ලා යුරෝපීය ජාතීන් මුහුණ දෙන්නා වූ ගැටළුවලට සර්වප්‍රකාර වූ සාර්ථක විසඳුම රැඳී ඇත්තේ ඉස්ලාමයෙහිය. මෙ ජාතීන් සමගි සම්පන්න වූවා නම්, නොගිණිය හැකි අගයක් ඇතිවේ. නමුත්, යුරෝපීය ජාතීන් විසින් ඉස්ලාම් හි සහයෝගය පිටු දකිනු ලබන්නේ නම්, ඉස්ලාමය එහි ප්‍රතිවාදීන් අතට පත්කරනු ලබන්නේ නම් යථෝක්ත සාම සම්මුති දෙපක්ෂයේම විනාශයට තුඩුදිය හැකිය." H.A.R.ගිබ් - Wither Islam -London 1932(පිටුව 379).

"මුහම්මද් තුමාගේ ආගමෙ පවත්නා විශිෂ්ට පැවැත්ම සම්බන්ධයෙන් මම කවදත් උසස් අදහස් දරමි. සෑම යුගයකටම ගැලපෙන මහඟු චර්යාධර්මයකින් යුත් එකම ධර්මය ඉස්ලාම් බව මට පෙනේ. එතුමා ශ්‍රේෂ්ඨ පුරුෂයකු බව මනා ව වටහා ගතිමි. ක්‍රිස්තියානි විරෝධියකු නොවෙමින් පවසනවා නම්, එතුමා මානව සංහතියේ ගැලවුම් කාරයාය. එබඳු පුරුෂයකු, නූතන ලෝකයේ ඒකාධිපති පාලනය අත්කර ගත හොත් දැනට පවත්නා සෑම ගැටළුවක් මතිරාකරණය වෙමින් , ලොවට බෙහෙවින් අවශ්‍ය ව ඇති සාමය හා සතුට අත්වන බව මම තරයේ විශ්වාස කරමි. වත්මන් යුරෝපය විසින්, මුහම්මද් (සල්) තුමාගේ ධර්මය පිළිගත හැක්කක් බවට හැගෙන්නට වී ඇත. අනාගත යුරෝපයට ද එය ආදේශ විය හැක්කක් බව මගේ අනාවැකියයි." G.B.ෂෝ The Genuine Islam - Vol.1 -No 8(1936).

"මුස්ලිමුන් අතර ජාතිවාදී අදහස් නොපවත්නා තත්ත්වය වූ කළී ඉස්ලාමයේ ඉස්තරම දායාදයකි. වත්මන් ලොවෙ සිදුවෙමින් පවත්නා සිද්ධීන් ගැන සැලකීමේදී, ඉස්ලාමීය ශීලය දැවෙන අවශ්‍යතාවයක් වී ඇත." A.J. Toynbee- Civilization on Trial - New York- 1948 (පිටුව 205).

"ඉස්ලාමීය උදව වූ කලී, ඇතැම් විට මානව ඉතිහාසයේ, අති විශ්මය ජනක සිද්ධිය

වශයෙන් සැලකිය හැකිය. අප්‍රසිද්ධ ජන කොටසකින් කාන්තාරය තුළින් ඉස්මතු වී (ශතවර්ෂයක තරම් කාලයක් තුළ පැටිච්යේ අඩකට වඩා ප්‍රදේශයක් තුළ විසිර ව්‍යාප්ත වූ) මහා අධිරාජ්‍යයක් බිහි කළේය. කාලාන්තරයක් පුරා පැවති ආගම් මති මතාන්තර ඉවත ලා නව ජන සමාජයක් පුනරුත්ථාපනය කළේය. අලුත් ම ලෝකයක් ගොඩ නැගුවේය.

මෙකී ප්‍රගතිය සියාරු, තවත් තියුණු ලෙස විමසා බැලුවා නම් එහි පවත්නා අස මාන්‍යය විශේෂත්වය දිස්වේ. සෙසු ප්‍රධාන ආගම් සාර්ථකව ප්‍රචලිත වූයේ සෙමිනි. ඒ සඳහා ද මහත් පරිශ්‍රමයක් දැරිය යුතු විය.

අන්තිමේදී සාර්ථක වූයේ,බලවත් රාජ්‍ය නායකයන් එකී දහම් වැළඳ ගැනීමෙන් අනතුරුවය . ක්‍රිස්තියානි ධර්මයට කොන්ස්තන්තීන්ද, බෞද්ධ ධර්මයට අශෝක අධිරාජයාද, සරතුශ්‍ර ධර්මයට සයිරස් රජද සිටියහ. මෙ කවුරුත් තමන් තෝරාගත් දෘෂ්ටිය වෙනුවෙන්, මෙලෝ වශයෙන් හිමිව පැවති බලය යොමු කළහ. ඉස්ලාම් හි එවැන්නක් සිදු වී නැත. ජන ශූන්‍ය කාන්තාරයේ, නැතින් නැත යමින් ජීවත් වූවා වූ, ඉතිහාසයේ ඊට පෙර කිසිදු වැදගත් තැනක් නොලද්ද වූ ජන කොටසක් තුල ඉස්ලාම් පහළ විය. එය ඉදුරා මනුෂ්‍ය අනුබලයකින් තොර ව, කටුක, භෞතික බාධාවන් මැඩගෙන අති වේගයකින් පෙරට ගියේය. පිරනීස් කඳුවැටිය සිට හිමාලය කඳුවැටිය දක්වාත්, මධ්‍යම ආසියාතික කාන්තාරවල සිට මධ්‍යම අප්‍රිකානු කාන්තාර දක්වාත් වූ ප්‍රදේශය තුළ, පවනට බඳු වේගයෙන් ජයග්‍රාහී ලෙස පැතිරී ගියේය.''
A.M.L.Stoddard, Islam - The Religion of All Prophets පොතින් ගත් උපුටනය Begum Bawani Waqf- Karachchi Pkistan (පිටුව 56)

''වෘත්තාන්ත හා ඓතිහාසික වශයෙන් පුළුල් ලෙස සලකා බලන කල්හි, ඉස්ලාම, අනිවාර්යෙන් ම යථාර්ථවාදී ධර්මයකි. ආගමික දෘෂ්ටියකට පදනම් වන්නා වූ ප්‍රබුද්ධිමත් යථාර්ථවාදී නිර්වචනය, සෑම ප්‍රකාරයෙන් ඉස්ලාමයට ගැලපේ. සාන්තවරුන් පිළිපැදීම, ආගමික යැයි සලකා නොයෙකුත් මිථ්‍යා විශ්වාස, නාගුණ වැල්,යන්ත්‍ර මන්ත්‍ර භාවිතය යනාදිව මුස්ලිමුන් අතර නැත්තේ නොවේ. නමුත් ඉස්ලාම්හි බලවත් ප්‍රගතිය මධ්‍යයේ, නබි (සල්) තුමාගේ ධර්මානුශාසනාවන්ට සපුරා එකඟව, කුර්ආනය එහි ප්‍රකෘති තත්වයේ ම පවතී. එමගින් අල්ලාහ්ගේ ඒකීයත්වය 'තව්හිද්' පිළිබඳ පිළිවෙත ඉතා විශිෂ්ට ගාම්භීර පාරිශුද්ධ හා දැඩි අධිෂ්ඨානශීලීව අවධාරණය කෙරේ. මෙකී මූලික ප්‍රතිපත්තිය කෙරෙහි ඇති දැඩි බැඳීයාව සහ මෙම ධර්මප්‍රචාරකයන් තුළ පැවති තද බල උද්යෝගය යනාදිය මුහම්මද් තුමාගේ සාර්ථක ධර්මදූත ව්‍යාපාරයට බෙහෙවින් තුඩුදුන් බව කිව හැකිය.

''මෙ සා අගනාවුත්, ආගමික විස්තරවලින් පොහොසත් වූත්, සාමාන්‍ය මිනිසුන්ගේ

ද පහසු අවබෝධය පිණිස වූත් දහමක්, මිනිස් සිත් සතන් ඇද ගැන්ම අරුමයක් නොවේ."Edward Monte La Propande Chretienne et Ses - Advesaries Musulmans- Paris 1890 -T.W.Arnold ගේ Preaching of Islam- London 1913 හි උපුටා දක්වන ලද්දකි.(පිටුව 413- 414).

"සාමාන්‍ය විග්‍රහයට අනුව මම මුස්ලිමෙකු නොවෙමි. නමුත් අල්ලාහ්ට (God) අවනත වුවෙකු වශයෙන් මම ද මුස්ලිම් වෙමි. කුර්ආනයේ හා ඉස්ලාමීය සෙසු විෂයයන්හි දී දිව්‍යමය සත්‍ය රාශියක් අඩංගුව පවත්නා බව මම අදහමි. ඒවායින් , මාද, සෙසු බටහිර ජාතීන් ද උගත යුතු දේ තවත් අනන්තවත් ඇත. අනාගතයේ, එකම ආගමක් පිණිස වූ අවශ්‍ය සෑම අංගයක්ම - තොරතුරක්ම- ඉස්ලාමහි අන්තර්ගතව ඇත."W.Montegomery Watt, Islam and Christianity today- London 1983 (පිටුව 9).

# 4

# මුහම්මද් (සල්) තුමා ගැන වියතුන්ගේ අදහස්

කුරුස යුද්ධ සමයේදී, මුහම්මද් (සල්) තුමාට එරෙහිව විවිධාකාර අපවාදයන් සෙවීමෙහිලා ප්‍රතිවාදීහු අතිශයින් උනන්දු වූහ. නමුත් ආගම ඉවසීමේ හා නිදහස් චින්තන සහිත නූතන යුගයේ උදාවත් සමග, රසූලුල්ලාහ් (සල්) තුමාගේ ජීවන රටාව හා චරිතය විග්‍රහ කිරීමෙහිලා බටහිර ලේඛකයෝ නැඹුරු වූහ. ඇතැම් නොමුස්ලිම් වියතුන් විසින් මුහම්මද් (සල්) තුමා සම්බන්ධයෙන් දරන අදහස්, මතු සඳහන් කෙරේ. ඒ මගින්, එතුමාගේ ශ්‍රේෂ්ඨත්වය ලෝකයා හමුවේ තවත් තහවුරු කෙරේ.

එනමුත් මුහම්මද් (සල්) තුමා, සත්‍යය හා මනුෂ්‍ය ජාතිය වෙනුවෙන් පහළ කළා වූ අල්ලාහ්ගේ පරිසමාප්ත නබිය යන වැදගත්ම සත්‍යය වටහාගනු පිණිස බටහිර ජාතීන් තවත් පියවරක් ඉදිරියට යායුතුය. එතුමාගේ අසහාය බව හා නබීත්වය අවධානයට ලක්විය යුතු කරුණකි. එහෙත් එය වටහා ගනු සඳහා බටහිර ජාතීන් අවංක හා විධිමත් වෑයමක් දරා නැත. එතුමාගේ ශ්‍රේෂ්ඨත්වය හා සාර්ථකත්වය උණුසුම් ලෙසින් පිළිගැනෙතත්, එතුමා අල්ලාහ්ගේ නබී බව පැහැදිලි වශයෙන්ම, නො එසේ නම් විමසා නොබලා, පිටුදැකීම ඇත්තෙන්ම මවිත විය යුතු තරම් කරුණකි. ඔවුන්ගේ යටිහිත ගැන සොයා බැලිය යුත්තේත් ඔවුන් දරන අදහස් පුනරාවලෝකනය කළයුතු අවශ්‍යතාවයක් පැන නගින්නේත් මෙහිදිය, මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාගේ ජීවිතය හා සම්බන්ධ ඇතැම් තොරතුරු පහත සඳහන් වේ. මෙවා එතුමාගේ නබීත්වය සම්බන්ධයෙන් අපක්ෂපාතීවූත්, තර්කානුකූලවූත්, ස්වාධීනවූත් නිගමනයකට එළෙඹීමෙහිලා උපකාරී වනු ඇත.

සතලිස් වන විය දක්වා, මුහම්මද් (සල්) තුමා පාලකයෙකු, දේශකයෙකු හෝ කථිකයෙකු වූයේ නැත. ස්වභාව ධර්මතාවය, ආගම දහම, නීතිය දේශපාලන හෝ සමාජ විද්‍යාව පිළිබඳ කිසිදු පිළිසඳරක යෙදී නැත. එතුමා කෙරෙහි ශ්‍රේෂ්ඨ ජීවන රටාවක්, සිත්කලු පැවතුම, උසස් ගුණදහම හා ශික්ෂණයක් පැවැති බව නිසැකය. ඒ වුවත්, මතු දවස ඉමහත් පෙරළියක් සිදුකල හැකි තරම් ගැඹුරු වූ හෝ සුවිශේෂ වූ අසාමාන්‍ය ගතිලක්ෂණයක් එතුමා තුළ නොවිය, ඒ වුවත් නව නිවේදනයක් සහිතව හිරා ගුහාවෙන් පිටත් වූ කල, එතුමා ඉඳුරා වෙනස් වී සිටියහ. එබඳු පැවැත්මක් ඇති පුරුෂයෙකු, කඩිමුඩියේ මුසාවාදියෙකු වශයෙන් පෙරළී අල්ලාහ්ගේ නබි වශයෙන් ආත්ම හැඳින්වීමක් කර ගනිමින්, ස්වකීය ජනතාව කුපිතයට පත්කරනු ඇත්ද? කවර හේතුවක් නිසා, එතුමා ඒසා දුක්කරදර ඉවසා දරා ගත්තේදැයි පැනයක් නැගේ. තම ධර්මානුශාසනාවන් නතර කළේ නම්, රටේ කිරුළ පැළඳවීමටත්, සියළුම සම්පත් එතුමාගේ පාමුල ගොඩගැසීමටත් රට වැසියෝ ඉදිරිපත් වූහ. එකී ප්‍රබෝධවත් පඩුරු පරිත්‍යාග සියල්ල පිළිකුළෙන් ප්‍රතික්ෂේප කල එතුමා, ඒක පුද්ගලයෙකු වශයෙන් නැගී සිට, තමා ගේ ම බන්ධු ජනයාගේ, විවිධාකාර අවමන් අපවාද ඉවසා දරා ගනිමින්, සමාජයෙන් කොන්කරනු ලබමින්, කායික වධ බන්ධනයට ද මුහුණ දෙමින් ධර්මානුශාසනාවන් හි නිරත වූහ. අල්ලාහ්ගේ ම අනුබලයක් නොවේ නම්, මානව සංහතියේ එකම ගැලවුම් මග ඉස්ලාමය යන එතුමා ගේ අචල අධිෂ්ඨානය ද නොවේනම්, එතුමා තම ජීවිත පරදුවෙන් ඉදිරිපත්වනු ඇත්ද? තවද, ක්‍රිස්තියානීන්ට හා යුදෙවුන්ට විරෝධි වූ කිසියම් රටාවක් එතුමා විසින් ඉදිරිපත් කෙරුණේද? එසේ නම් ඉස්ලාමීය ඊමානය භක්තිය සම්පූර්ණවීමේ අවශ්‍යතාවයක් වශයෙන්, මුස්ලිමයන් ඊසා නබි Jesus Christ (අලයි), මූසා Moses නබි (අලයි) ප්‍රමුඛ සියලුම නබි වරුන් පිළිබඳ විශ්වාසය පිහිටුවා ගත යුතුයැයි ප්‍රකාශ කරනු ඇත්ද? කියවීමට හෝ ලිවීමට නොදත්තකු පුරා වසර හතළිහක් මුළුල්ලේ සන්සුන් දිවියක් ගතකළ අයෙකු ස්වකීය ධර්මානුශාසනාවන් ප්‍රාරම්භ කළ අවස්ථාවේ, මුළු මහත් අරාබිකරයම විශ්මිත වී, එතුමාගේ භාෂා කෞශල්‍යතාවය ට වාග් චතුර්යය කෙරේ වසඟවීම, එතුමාගේ නබිත්වය සනාථ කරන්නාවූ පැහැදිලි සාක්ෂයක් නොවේ ද? මුළු මහත් අරාබි කරයේම විසූ ප්‍රවීන කවියන් කථිකයන් හා දේශකයන් ට පවා ඒ හා සමාන කෘතියක් කළ නොහැකි විය. මේ හැර, එදවස කිසිදු වියතෙකු විසින් විග්‍රහ කළ නොහැකි තරමේ, ස්වභාව ධර්මය පිළිබඳ විද්‍යාත්මක තොරතුරු කුර්ආනයෙහි- ගෙනහැර දැක්වූයේ කෙසේද?

බලය හා ආධිපත්‍යය හිමි වීමෙන් පසුවත් එතුමා, දුෂ්කර වාම ජීවන රටාවක් සලසා ගත්තේ මක්නිසාද? එතුමාගේ මරණාසන්න මොහොතේ කළ ප්‍රකාශය ගැන විමසා බලනු වටී. ''නබි වංශයට අයත් අපට උරුමකම ලැබී නැත. අප ඉතිරි කර යන දේ දන පරිත්‍යාග පිණිස වේ.''

මෙ අනුව, මෙ භූතලය මත, මානව සමාරම්භයේ සිට, විවිධ දිග් භාගවල, කලින් කල පහල වූ නබිවරුන්ගේ දම්වැලේ, අත්‍යන්ත පුරුක, මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාය.

"පරමාර්ථයේ ශ්‍රේෂ්ඨත්වය, මාර්ගයේ පහසුව හා විශ්මය ජනක ප්‍රතිඵල යන තෙවැදෑරුම් සාධකයන් මගින් පුරුෂෝත්තම භාවය මනිනු ලැබේ නම්, නූතන ඉතිහාසයේ, මුහම්මද් (සල්) තුමා හා සැසඳිය හැකි පුරුෂෝත්තමයෙක් වෙත නැත. අතිශයින් සුප්‍රසිද්ධ පුද්ගලයෝ, එක්කෝ අවි ආයුධ තැනීම, නීති ව්‍යවස්ථා සම්පාදනය නැත්නම් අධිරාජ්‍යයන් පමණක් ස්ථාපනය කලහ. ඔවුන් විසින් සොයාගනු ලැබූ කිසිවක් වේ නම්, ඒ, ඔවුන්ගේ දෙනෙතට වසන්ව පැවති කිසියම් භෞතික බලවේගයක් වේ. මෙ උදර මනුෂ්‍යයා-මුහම්මද් (සල්) තුමා-තැනුවේ, හමුදාවන්, ව්‍යවස්ථාවන්, අධිරාජ්‍යයන්, මනුෂ්‍ය සමාජ හා පරම්පරාවන් පමණක් නොවේ. එ දවස විසූ ලෝකවාසීන් ගෙන් තුනෙන් එක් කොටසක පමණ වූ කෝටි සංඛ්‍යාත මිනිසුන් තැනූහ. ඊට වඩා (පූජාසන) අල්තාර, දෙවිදේවතාවුන්, ආගම් දහම්, අදහස් උදහස් සංඛ්‍යාවක්ද විශ්වය හා ආත්මයන්ද සෙළ වූහ. ජයේදීත් එතුමාගේ සන්සුන් ස්වභාවය, අධිරාජ්‍යයක් ගොඩනැගීමෙ අභිලාෂයක් කොහෙත්ම නැති, එකම පරමාර්ථයක් සඳහා කැපවූ එතුමාගේ අධිෂ්ඨාන බලය, එතුමාගේ අඛණ්ඩ නැමදුම්- සලාත්- අල්ලාහ් සමග කළා වූ ගුප්තමය සංවාද, එතුමාගේ මරණය හා පශ්චාත් ජයග්‍රහණ යනාදී සියල්ලෙන් සනාථ වන්නේ ව්‍යාජත්වයක් නොව, ස්වකීය ප්‍රතිපත්තිය ස්ථාපනය කරවීමෙහිලා දැක්වූ ස්ථිර අධිෂ්ඨාන ශක්තියෙන් අත් වූ ජයග්‍රහණයයි. මෙ ප්‍රතිපත්තිය කරුණු දෙකකින් සමන්විත වේ. එනම් (1) අල්ලාහ්ගේ (God) ඒකීයත්වය හා (2) අල්ලාහ්ගේ අභෞතික භාවයයි. පළමුවැන්නෙන් අල්ලාහ් ගැන විග්‍රහ කෙරේ. මෙ දෙවැන්න, එනම් ව්‍යාජ දෙවියන් තුරන් කිරීමෙහිලා අසිපත් බලයත්, මුල්කරුණු ස්ථාපනය කිරීමෙහිලා වාග්බලයත් යොදා ගන්නා ලදී.

දාර්ශනිකයකු, කථිකයෙකු, ආගම් ධර්මානුවරයෙකු, ව්‍යවස්ථාදායකයෙකු, සෙබලෙකු, අදහස් ජයගන්නේකු, රූපයක් රහිත දහමකින් ප්‍රතිපත්ති ස්ථාපනය කරන්නෙකු, මෙර මා අධිරාජ්‍යයන් විස්සක්ද, පරලෝ අධිරාජ්‍යයක්ද ස්ථාපනය කිරීමෙ පුරෝගාමියෙකු, ඒ මුහම්මද් (සල්) තුමා වෙති, මනුෂ්‍ය විශිෂ්ටත්වය තීරණය කරන්නා වූ සියලුම සාධකයන් ගැන සලකන කල, මෙතුමාට වඩා ශ්‍රේෂ්ඨ පුරුෂයෙක් සිටින්දැයි ප්‍රශ්න කළ හැකිය."- Lamartine - Histoire de la Turquie- Paris 1854- Vol. II- (පිටුව 276-77)

" අප විශ්මයට පත්කරන්නේ අති විශාල බැතිමතුන් සංඛ්‍යාවක් නොව, එතුමාගේ ධර්මයේ ස්ථාවරත්වයයි, ශත වර්ශ දොළහක් (12) පුරා, ඉන්දියාව, අප්‍රිකාව හා

තුර්කියේ බැතිමතුන් විසින් පරිවය කළ පසුව වුවද, මුලදී එය, (කුර්ආනය) මක්කාවේ හා මදීනාවේ කෙටුම්පත් වූ ප්‍රකෘති ආකාරයෙන්ම තවමත් පවතී. ආගම කෙරේ තම භක්තිය හෝ කැපවීම නොඅඩුව රැකගැන්මෙහිලා මුස්ලිම් අය එක්සත් ව උත්සුක වූහ. 'ඇත්තේ එකම දෙවියෙන් වහන්සේ බවත් මුහම්මද් (සල්) තුමා උන්වහන්සෙගේ දූතයා බවත් මම විශ්වාස කරමි.' යනු ඉස්ලාම් හි සරල හා නොවෙනස් ඇදහිල්ලයි. ප්‍රඥවට ගෝචර විය යුතු දිව්‍ය භාවයට, දෘශ්‍යමාන වූ කිසියම් රූපාකාරයක් දෙමින් දිව්‍යභාවය පහත්කර නැත. නබිවරුන්ට දිය යුතු ගරුත්වය මානව පුද සත්කාර මගින් කඩකර නැත. එතුමාගේ ජීවිතාදර්ශයෙන් ම දැනුම හා ආගමෙ සීමාව යටතේ අනුගාමිකයෝ සෑහීමකට පත්වූහ."Edward Gibbon and Simon Ocklay, History of the Saracen Empire - London 1870 -(පිටුව 54)"එතුමා තුල සීසර් සහ පෝප්වහන්සේ යන දෙදෙනාම අරක් ගෙන සිටියහ. එතුමා පෝප් වූයේ පෝප් වහන්සේගේ බාහිර ඇඟවීම් වලින් තොරවය. සීසර් වූයේ හමුදා බල ඇණිවලින් තොරවය, ආත්මාරක්ෂක සෙබළුන් රහිතවය, මහල් මාලිගා විරහිතය, ස්ථාවර ආදායමක් නැතිවමය. දිව්‍ය අනුග්‍රහයෙන් පාලනයෙහි යෙදුණේයැයි යම් කිසිවෙකු ගැන පවසතොත්, ඒ මුහම්මද්ය. අදාළ අවි ආයුධ නැති වුවත්, ඒවායේ උපකාරයක් නොලදත් සෑම බලයක්ම හිමිව තිබුණු බැවිණ."Bosworth Smith, Mohammad and Mohammadanism London 1874 (පිටුව 92)

"අරාබියේ ශ්‍රේෂ්ඨ නබිතුමා ගේ ජීවිත කථාව හා ජීවන රටාව පිළිබඳව අධ්‍යයනය කරන්නෙකුට, එතුමා කෙරේ සම්මානනීය ගරුත්වයක් හටගනී. හේතුව, එතුමා අතිශ්‍රේෂ්ඨ පුරුෂයකු මෙන්ම වැදගත් දූතයකු බව හැඟී යාමයි. ඔබට මා කවර අන්දමින් පැවසුවත්, කවර අවස්ථාවක වුවත්, යළි යළිත් එතුමන්ගේ චරිතය කියවන කල්හි ඒ සෑම අවස්ථාවකම, ඒ මහා ආචාර්යවරයා කෙරේ මාතුළ නව සෙනෙහසක් ගරුසරු හා හැඟීමක් හටගනී."Annie Besant - The Life and Teachings of Muhammad - Madras 1932(පිටුව 4)

ස්වකීය දෘෂ්ඨිය වෙනුවෙන් වධ වේදනා දරාගැනීමට සූදානම් වීම, එතුමා කෙරේ විශ්වාසය පිහිටුවා තම නායකයා වශයෙන් තෝරාගත්තවුන් තුළ පිහිටි උසස්තම සදචාරය සහ එතුමා ලද සකල ජයග්‍රහණයකම විශිෂ්ටත්වය යනාදී සියල්ලම, එතුමාගේ මූලික ශ්‍රේෂ්ඨත්වය විදහා දක්වයි. මුහම්මද් තුමා ව්‍යාජ නබිවරයෙකු ලෙස හැඳින්වීමෙ දී ගැටළුවිසඳනවා වෙනුවට තවත් ගැටළු, බහුල වශයෙන් මතුවේ. මෙ හැර බටහිර ජාතින්ගේ ඓතිහාසික පුරුෂයන් අතරින් සේසු කිසිවෙකුට, මුහම්මද් තුමාට බඳු පහත් සැලකීමක් දක්වා නැත." W. Montgomery Mohammed at Mecca,Oxford 1953(පිටුව 52)

"ඉස්ලාමය දියත් කළ ජනකාන්ත පුරුෂයකු වූ මුහම්මද් (සල්) තුමා ක්‍රි. ව. 570 දී අරාබියේ ප්‍රතිමා වන්දක ගෝත්‍රයක උපන්හ. අනාථයෙකු වශයෙන්, නිරන්තරයෙන්ම තැති බැරි දුගීන්, වැන්දඹුවන් හා අනාථයන් වහලුන් හා පීඩිතයන් කෙරේ විශේෂයෙන් අනුකම්පා කළහ. වයස අවුරුදු විස්සේදී සාර්ථක වෙළෙන්දෙක් වූහ. පසුව ධනවත් වැන්දඹු කාන්තාවකගේ ඔටු තවලම් මුළක් මෙහෙයවූහ. එතුමාගේ ප්‍රශංසනීය චාරිත්‍රය දුටු එතුමියගේ විවාහ යෝජනාව අනුව, තමන්ට වඩා වසර 15 කින් වැඩිමහලු වුවත් එතුමා, එතුමිය හා විවාපත් වූහ. එතුමිය ජීවතුන් අතර සිටින තාක් කල් ඇපකැපවූ ස්වාමිපුරුෂයෙකු වශයෙන් ක්‍රියා කළහ. අල්ලාහ්ගේGod පණිවිඩය ජනතාව අතට පත් කිරීමට පෙර, ස්වකීය නොහැකියාව මෙනෙහි කොට, පෙර විසූ සියලුම ප්‍රධාන පෙළේ නබිවරුන් මෙන් එතුමාද ලැජ්ජා වූහ. එහෙත් සුරදූත තෙමේ (ජිබ්රීල් අලෙයි) කියවන්නැයි අණ කළේය. අප දත් පමණින් එතුමාට කියවීමට හෝ ලිවීමට නුපුළුවන. එහෙත් ඒ ආකර්ෂණීය වදන් ඒ අයුරින්ම කියවන්නට වූහ. 'ඇත්තේ එකම දෙවියෙක් අල්ලාහ්-පමණි' මෙ මගින් මහ පොළොව මත විශාල ප්‍රදේශයක් තුල ඉමහත් පෙරළියක් සිදුවිය.

"සෑම ක්‍රියාවකදීම, මුහම්මද් (සල්) තුමා අවංක වශයෙන්ම ප්‍රායෝගික වූහ. එතුමාගේ දයාබර පුත්, ඉබ්‍රාහිම් මළගිය අවස්ථාවේ අහසේ සූර්ය ග්‍රහණයක් ඇතිවිය. 'මෙ මගින් අල්ලාහ්ගේ ශෝකය ප්‍රකාශවෙති'යි, ජනතාව තුළ රාවයක් පැතිර ගියේය. එකල මුහම්මද් (සල්) තුමා "සූර්ය ග්‍රහණය සවභාව ධර්මයේ විපරීත සිද්ධියකි, එය මිනිසකුගේ මරණය හෝ උපත නිසා සිදුවුණේ යැයි සැලකීම මුළාවකි" යි ප්‍රකාශ කළහ.

"මුහම්මද් (සල්) තුමාගේම ඇවෑමෙන් එතුමාට දිව්‍ය ස්වභාවයක් ආදේශ කිරීමට කිසියම් වෑයමක් ගනු ලැබුණි. එහෙත් එතුමාගේ ඇවෑමෙන් පත්වූ පරිපාලක තුමා විසින් කෙරුණු ඓතිහාසික වැදගත් බවක් උසුලන්නාවූ ශ්‍රේෂ්ඨ දේශනයක් මගින් එකී වෑයම ව්‍යර්ථ කෙරුණි. "ඔබ අතර මුහම්මද් (සල්) තුමාට වතාවත් කරන්නන් වේ නම් ඔහුට විනාශය අත්වේ. අල්ලාහ්ට වතාවත් කරන්නන් වෙත් නම් ඔහු සදහටම ජීවත් වෙති."James A Michener - Islam; the Misunderstood Religion - Readers Digest (American Edition) May 1955, (පිටුව 68-70).

"ලෝකයේ අධික බලපෑම් සහිත පුරුෂයන්ගේ නාම ලැයිස්තුව සැකසීමේ දී, ම විසින් එහි ප්‍රධානතම ස්ථානය මුහම්මද් තුමන්ට දෙන කල, ඇතමුන් මවිත විය හැකිය. තව සමහරෙකු ප්‍රශ්න නගනු ඇත. එහෙත් ඉතිහාසයේ, ලෞකික හා ලෝකෝත්තර යන දෙයාකාරයෙන් ශ්‍රේෂ්ඨතම සාර්ථකත්වය උසුලන එකම පුරුෂයා එතුමාය."Michael H, Hart, the 100; A Ranking of the Most influential persons in History- New York - 1978(පිටුව 37)

# 5

# ඉස්ලාමීය සදාචාරය

ඉස්ලාමහි, මානව හිතසුව පිණිස වූ මූලික අයිතිවාසිකම් රැසක් දක්වේ. සෑම මොහොතකදීම ඊට ගරු කල යුතුය; ඒවා පිළිපැදිය යුතුය. යථෝක්ත අයිතිවාසිකම් අත්කර ගැනීම උදෙසා, නීත්‍යානුකූල රැකවරණය පමණක් නොව, ඵලදායී සදාචාරාත්මක සැලැස්මක්ද ඉස්ලාම්, ඉදිරිපත් කරයි. මෙසේ පෞද්ගලික හා පොදු යහපත පිණිස සිදුකරන්නා වූ සියල්ලක්ම සදාචාරාත්මක වශයෙන් යහපත් වේ. අල්ලාහ් කෙරේ දක්වන ජනාදරයට අතිශය වැදගත්කමක් හිමිකරන ඉස්ලාම්, ගතානුගතිකත්වයට වහල් ව සිටීමේ ක්‍රියාවට එරෙහිව අනතුරව අඟවයි. අල් කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

"පෙරදිගට හෝ බටහිරට මුහුණ හැරවීම ශීලයක් නොවේ. ශීලය වන්නේ අල්ලාහ්, කියාමත් දවස, හා මලක් වරුන්, ආගම හා නබිවරුන් කෙරේ විශ්වාසය පිහිටුවීම, අල්ලාහ් කෙරේ ස්නේහයෙන් ලේ ඥාතීන්, අනාථයන්, දිළින්දන්, මගීන් හා යාචකයන් වෙනුවෙන් ස්වකීය වස්තුවෙන් විය පැහැදම් කිරීම, වහලුන් නිදහස් කරවීම, අදළු වතාවත් පිරීම, සකාත් ගෙවීම, පොරොන්දු ඉටුකිරීම හා දුක් පීඩා බෙදයන්හි දී ඉවසා සිටීම යනාදියයි. මෙවැන්නෝ සැදැහැවත්හු වෙති; මෙවැන්නෝ අල්ලාහ්ට බියැත්තෝ වෙති." (2:177)

මෙකී පාඨයන්ගෙන්, සිල්වත් හා අල්ලාහ් කෙරේ බියැත්තන් පිළිබඳව විසිතුරු විග්‍රහයක් කෙරේ. මිනිසා විනයාචාර ධර්ම පිළිපැදිය යුතු අතරම අල්ලාහ්ට හා හුදී ජනතාවට සෙනෙහවත් වීමෙහි ලා නිරතුරු සැළකිලිමත් විය යුතුය. මෙහිලා අවශ්‍යතා සතරක් ඉදිරිපත් කෙරේ.

(1) අපේ ඊමාන්- භක්තිය- අව්‍යාජ විය යුතුය; අවංක විය යුතුය.

(2) සහෝදර ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වශයෙන් දන පරිත්‍යාග කළ යුතුය.

(3) සමාජ සංවිධාන යනාදියට ඇප උපකාර කරමින් හොඳ පුරවැසියන් විය යුතුය.

(4) සෑම විටෙකම, සෑම මොහොතකම චිත්ත ස්ථාවරත්වය පවත්වා ගත යුතුය.

කිසියම හැසිරීමක්- කල් ක්‍රියාවක්- යහපත් හෝ අයහපත් යැයි තීරණය කෙරෙන්නේ ඉහත සඳහන් කරුණු පදනම් කරගනිමිනි. සෑම සදාචාරාත්මක පැවැත්මක්ම මෙකී විනිශ්චය ක්‍රමය වටා භ්‍රමණය වේ. මිනිසෙකු කෙරෙහි සදාචාරාත්මක අණපනත් පැනවීමට පෙරාතුව, ඔහුගේ සෑම කටයුත්තක්, ක්‍රියාවක් ම මෙන්ම සෑම තැනකදීම, සෑම මොහොතකදීම අල්ලාහ් ඔහු දෙස දෘෂ්ටිය හෙළමින් සිටින බව, මුළු ලෝකයෙන්ම සැඟවුණත් අල්ලාහ්ගෙන් මුවා විය නොහැකි බව, අන් සියල්ලන්ම මුළා කළත් අල්ලාහ් මුළා කළ නොහැකි බව කවරෙකුගේ ග්‍රහණයෙන් මිදුනත් අල්ලාහ්ගේ ග්‍රහණයෙන් මිදිය නොහැකි බව යනාදිය මිනිසාගේ සිතෙහි තහවුරු කිරීම සඳහා ඉස්ලාම් වෙරදරයි. මෙසේ, අල්ලාහ්ගේ ප්‍රසාදයට ඉවහල් වූ දේ මිනිස් ජීවිතයක පරමාර්ථය විය යුතු බව තීරණය කොට, ඉස්ලාම් මගින් සදාචාරාත්මක වශයෙන්වූ උසස් තත්ත්වයද සලසා දෙනු ලැබේ. මානව සදාචාරාත්මක සංවර්ධනයෙහි අසීමිත අගයක් ඇතිකිරීමෙහිලා මෙය ඉවහල් වේ. දිව්‍යමය හෙළිකිරීම -වහී- යනු ඥානයේ මූල සාරය වශයෙන් සලකා, මෙ සදාචාරාත්මක තත්ත්වයනට අනම්‍ය බව හා ස්ථාවරත්වය ලබා දෙනු ලැබේ. සාධාරණ හේතු සහගත ලෙස චර්යාවේ හැඩගැස්වීම අභ්‍යාස කිරීම හා වෙනස් කිරීම කරගත හැකිය. එහෙත් හිතාමතා සිදුකරන වරදක් වශයෙන්, බැරෑරුම් වෙනසක් සිදුකිරීමක් හෝ සදාචාරය ලිහිල් කරවීමක් හෝ පවත්නා අඛණ්ඩභාවය කඩකරන්නක් වශයෙන් එබඳු වෙනසක් කළ නොහැකිය. අල්ලාහ් කෙරේ ඇල්ම හා බිය හේතුවෙන් වූ සදාචාරයනට මෙ මගින් අනුමැතිය ලැබේ. මෙ නිසා බාහිර බල පෑමකින් තොරව මිනිසා සදාචාරය ඔස්සේ යවනු ලැබේ. අල්ලාහ් සහ කියාමත් දවස පිළිබඳ ඇදහිලි සහිතව ඉතා ඕනෑකමින් හා උනන්දුවෙන්ද අවංකව එමෙන්ම හෘදයංගම ලෙස සදාචාරාත්මක පැවතුම සකසා ගනු පිණිස, මිනිසාට හැකියාවක් ඇතිවේ.

මෙ සදාචාර නීතිරීතින්හි අව්‍යාජ ස්වභාවයක් නැත; අමුතු ආටෝපද නැත; සාමාන්‍ය සදාචාර පැතුම වලින් ඈත් කිරීමක් ද නැත; හේතු විරහිත ලෙස හෝ අතිශයෝක්තියෙන් කිසියම් අංශයක් අමතක කොට හැර දමා නැත. ව්‍යවහාරයේ ඇති සියලු ම සදාචාර විනයන් ගැන සලකා ඇත. ඒ ඒ තන්හි එකිනෙක උචිත ලෙස

පිහිටුවා, ජිවන සැලැස්මක් තුළ සමස්ථයක් වශයෙන් සපුරා ක්‍රියාත්මක වන අන්දමින් වග බලාගෙන ඇත. මෙ මගින් මිනිසාගේ පෞද්ගලික හා සාමූහික ජිවන අරමුණු පුළුල්කරවනු ලැබේ. මිනිසා ගේ ගෘහස්ථ හැසිරීම, පෘථග්ජන පැවතුම මෙන්ම, දේශපාලනික, ආර්ථික, අධිකරණ අධ්‍යාපනික හා සාමාජික ක්‍ෂෙත්‍රයන් හි ක්‍රියා කටයුතු වලදී පිළිපැදිය යුතු සදචාර විනය ධර්මයන් විග්‍රහ කෙරේ. ඉස්ලාමීය සදචාරයෙන්, මිනිස් ජිවිතය තිවසින් සමාජය දක්වාත් කැම මෙසයේ සිට යුද පිටිය හා සාම සම්මේලන දක්වාත්, කොටින්ම තොට්ල්ලේ සිට සොහොන් බිම දක්වා සැකසිය යුතු ආකාරය ඉගැන්වේ. ඉස්ලාමීය සදචාරය තුළින් කිසිදු අංශයක් ගිලිහි නැත. කිසිදු ක්‍ෂෙත්‍රයක් මගහැරී නැත. එය අවබෝධයටද පහසුය. එමගින් ජිවිත කාර්යාවලිය උතුම් පරමාර්ථ සහිතව ඉටුකරවනු ලැබේ. මෙහිලා ආත්මාර්ථකාමි හෝ පහත් ලාභාපේක්‍ෂාවෙන් ගෙවන ජිවිතයකට ඉඩ නැත.

ඉස්ලාමීය විනයෙන් යහපත් පැවතුම සහිත, අයහපත් පැවතුම වලින් මිදුණාවූ සාර්ථක ජිවිතයක් සඳහා පෙළඹවීම සිදු කෙරේ. සිල්වත් ශික්‍ෂාකාමී සඳහා පමණක් නොව, එකී යහ ගුණ ප්‍රගුණ කිරීමටත් කෙලෙස් දමනය කොට ශුභ ගුණදහම් පුහුණු කිරීමටත් අශුභ ගුණදහම් තුරන් කිරීමටත් පොළඹවනු ලැබේ. හෘදය සාක්‍ෂියට එකඟ වූ දිවිපෙවෙතක් සකසා ගැනීමත්, කවර අවස්ථාවක් යටතේ වුවද වරදට යොමුවීමෙන් වැළකී සිටීමටත් ඉස්ලාමීය සදචාරයේ අරමුණු වේ. මෙ ඇරයුමට ප්‍රතිචාරයක් දක්වන්නෝ, ඒකීය සමාජයක් වශයෙන් එක්රැස් කරනු ලැබ 'මුස්ලිම්' යන නමින් හඳුන්වනු ලැබෙති. මෙ සමාජයේ(උම්මාහ්)සාමූහික වශයෙන් එක්සත් වෙමින් යහපත ස්ථාපනය කිරීමට හා අයහපත මුලිනුපුටා දැමීමට වෙර දැරිය යුතුය. මුස්ලිමෙකු ගේ ජිවිතයේ විවිධ අංශයන් හිදී බලපාන අයුරින් උගන්වන ලද සදචාර මූලධර්මයන් කීපයක් මෙහිලා සඳහන් කෙරේ.

## අල්ලාහ් පිළිබඳ මතකය:

මෙ වූ කලී, මුස්ලිමෙකු තුළ පිහිටිය යුතු උසස්තම ලක්‍ෂණය වශයෙන් කුර්ආන්හි සඳහන් වේ. " ඔබ අතුරින් අතිශය සම්මානනීය අය වූ කලී, අල්ලාහ් අබියස, අල්ලාහ් පිළිබඳ මනා සිහියක් සහිත පුද්ගලයාය." (අල් කුර්ආන් 49:13)

අවනත භාවය, සන්සුන් තැන්පත් භාවය, ආත්ම දමනය, සත්‍යවාදී භාවය, අවංක භාවය, විනීත භාවය, ඉවසිලිවන්ත භාවය, ස්ථාවරත්වය හා පොරොන්දු ඉටුකිරීම යනාදිය අල්කුර්ආනයෙන් පුන පුනා ඉගැන්වෙන සදචාර විනයන්ය, අල්කුර්ආන්හි මෙසේ සඳහන් වේ.

"තවද අවංක හා ස්ථාවර වූවන්ට අල්ලාහ් ඇලුම් කරයි." (අල්කුර්ආන් 3:146)

''යහපත සිදුකරන්නන්ට අල්ලාහ් යහපත සලසන බැවින් ඔබේ රක්ෂකයාගෙන් ක්ෂමා භාජනය පිණිසත් ඔහු පිළිබඳ මතකයෙන් යුතුව ඇති කල්හි හා නැති කල්හි දන්පින් කරන්නා වූත්, කෝපය දමනය කරගන්නා වූත්, සහෝදර දනන් (ගේ වරද)ට සමාව දෙන්නා වූත් පින්වතුන් සඳහා, වෙන් කොට ඇති ස්වර්ග සම්පත්තිය පිණිසත් ඔබ තරඟකාරීව ඉදිරිපත් වන්න.'' (අල්කුර්ආන් 3:133-134)

"තිසි කල සලාත් හි යෙදෙන්න, යුක්තිය ඉටුකරන්න, වරදින් මිදෙන්න, කුමක් සිදුවෙතත් ඉවසිලිවන්ත වන්න, එය වෙනස් නොවන සුළු ධර්මතාවයකි'' අනුන් අබියස අහංකාර නොවන්න. මහ පොළොව මත අවිනීත ලෙස ගමන් නොකරන්න. අල්ලාහ්, උඩඟු හා පුරසාරම් දොඩන්නන් නොරුස්සයි. ඔබ ගේ (පා) පියවර අතර සාමාන්‍ය ප්‍රමාණයේ පරතරයක් තබා ගන්න. කට හඬ පහත් කරගන්න. උස් හඬින් කරන කතාව, ඇත්තෙන්ම බූරුවාගේ බෙරිහන් බඳු වේ.''(අල්කුර්ආන් 31:18-19)

මුස්ලිමෙකු ගේ විනයගරුක හැසිරීම ලූහුඩින් දක්වන විලාශයෙන් රසූලුල්ලාහ් (සල්) තුමා මෙසේ ප්‍රකාශ කරති. ''මගේ ආරක්ෂකයා මට අණපනත් නවයක් පවරා ඇත. එනම් හුදෙකලාව හෝ සාමූහිකව සිටියත් නිරන්තරයෙන්ම අල්ලාහ් පිළිබඳ සිහිය, කෝපාවිෂ්ටව හෝ සතුටු සන්සුන්ව සිටියත් යුක්තිය නෙපලීම, දුප්පත් හෝ ධනවත්ව සිටියදීත් නැත්පත්වීම, මගෙන් ඉවත් වූවත් යළි ළංකරගැනීම, මා පිටුදකින උදවියටත් උදව් උපකාර කිරීම, නිසොල්මන්ව සිටියදී චින්තනයෙහි නිරතවීම, මා බලන බැල්ම අවවාදනුශාසනාවක් වීම, සහ නිවැරදි දේ අවධාරණය කරවීම යන නවයයි, ඒ.''

## සමාජයීය වගකීම:

ඉස්ලාමීය ඉගැන්වීමට අනුකූලව, සාමාජික වගකීම වනාහි කරුණාව හා පරාර්ථය පිණිස විය යුතුවේ. විශේෂ අවස්ථාවන්හි දී කරුණාව පිළිබඳ වූ මෙකී පුළුල් ශීලය නොසලකා හරිනු ලබන බැවින්, විවිධ අවස්ථාවන් පිළිපැදිය යුතු කරුණාව පිළිබඳ විශේෂ ක්‍රියාවන්, වගකීම හා සම්බන්ධතා පිළිබඳව විග්‍රහ කෙරේ. සම්බන්ධතා පිළිබඳව පුළුල්ව සැලකීමේ දී අපගේ මූලික වගකීම වනුයේ, දෙගුරුන්, සැමියා, අඹුදරුවන් හා ඉතික්බිති ව සෙසු ඥාතීන්, අසල්වැසියන්, මිතුරන් හා දන්නා හඳුනනවුන් අනාථයන් හා වැන්දඹුවන්, ස්වකීය සමාජයේ දිළින්දන්, සහෝදර මුස්ලිමුන්, සකල මිනිසුන් හා සත්වයින් ද කෙරෙහිය.

### දෙගුරුන්:

මව් පිය දෙදෙනට ගරුකිරීම හා උපස්ථාන කිරීම, ඉස්ලාම් හි අවධාරණයෙන් ඉගැන්වේ. මෙය ඉස්ලාමීය භක්තියට ඉවහල් වන, වැදගත් අංශයක් වේ.

"ඔබේ ආරක්ෂකයා තමා හැර සෙස්සෙකු නොපුදන ලෙසත් දෙමව්පියන්ට කරුණා දයාව දක්වන ලෙසත් ඔබට අණකරයි. ඔබේ ජීවිත කාලය තුළ ඔවුන්ගෙන් කෙනෙකු හෝ දෙදෙනාම මහළු විය පත්වුවාතම්, ඔවුන්ගේ සිත් රිදවන කිසිදු වදනක් පැවසීම හෝ ඔවුන් කොන් කිරීම නොකරන්න. ඔවුන්ට ගරුසරුව කතා කරන්න. කාරුණික ලෙස කිකරු වන්න. පසුව පවසන්න.

"මගේ ආරක්ෂකයාණෙනි, මා කුඩා කල ඔවුන් මා කෙරේ දැක්වූ සෙනෙහස මෙන් ඔවුන් කෙරේ ඔබේ පරම දයාව දක්වන්න." (අල්කුර්ආන් 17:26)

## සෙසු ඥතීන්:

"දිළින්දන් මගින් මෙන්ම බන්දුන්ට ද හිමිවිය යුතු උරුමකම ප්‍රදානය කරන්න. තවද නාස්ති කාරයෙකු මෙන් ඔබේ වස්තුව විනාශ නොකරන්න." (අල්කුර්ආන් 17:26)

## අසල්වැසියන්:

රසූලුල්ලාහ් (සල්) තුමාණෝ මෙසේ වදරති. "අසල්වැසියා, සාගින්නෙන් පිඩා විඳින කල, කුසපුරා ආහාර ගන්නා, මුස්ලිමෙක් නොවේ. තවද ස්වකීය නොපනත් පැවතුම් නිසා අසල්වැසියා අනාරක්ෂිත තත්වයේ පසු වෙනම් ඔහු ඊමාන් ධාරියෙකු - ශ්‍රද්ධාවන්තයෙකු නොවේ."

සැබවින්ම කුර්ආනයට හා සුන්නාහ් වට අනුකූලව, මුස්ලිමෙකු විසින් සදචාරාත්මක වගකීම් ඉටුකළ යුතුවන්නේ, ස්වකීය දෙගුරුන් නෑ හිතවතුන් හා අසල්වැසියන්ට පමණක් නොවේ. සමස්ත මානව සංහතියම, සකල ප්‍රාණයෙකුම, එලදයි ගස්, පැලෑටි වස්තූන් කෙරේද ඉටුකළ යුතු වගකීම් ඇත. විනෝදය සඳහා සත්ව හා කුරුළු දඩයම යනාදියට අවසරයක් නැත. එසේම උග්‍ර අවශ්‍යතාවයකින් තොරව එල දරන වෘක්ෂලතාවන් කපා හැරීමද තහනම් කොට ඇත. මෙසේ, මුලික සදචාරාත්මක පැවැත්මේදී ඉස්ලාම් මගින් උසස් සදචාරාත්මක විනයක් ගොඩනගා ඇත. ඒවායේ ශ්‍රේෂ්ඨත්වය, මිනිසාට පහසුවෙන්ම අවබෝධවනු ඇත. ඉස්ලාම් මගින්, මිනිසුන් කෙරෙන්, ආත්ම වර්ණනාව, දුෂ්ඨ පාලනය, අයිස්කිත

හා අවිනීත භාවය යනාදිය කෙලෙස් දුරු කැරවේ. ඒ වෙනුවට, අල්ලාහ් කෙරේ බියැති, ශ්‍රද්ධාවත් ප්‍රතිපත්තිගරුක අමද්‍යප හා වරදෙහි නොබැඳෙන පුරුෂයන් ගොඩනගනු ලැබේ. සදාචාරාත්මක වශයෙන් වූ වගකීම පිළිබඳ හැඟීම පුබුදුවන්නා වූ අතරම ආත්ම සංයමයට ඉවහල් වන හැකියාවද වඩවයි. ඉස්ලාම මගින් සෑම විටෙකම, කරුණාව, දයාව ත්‍යාගශීලී භාවය, අනුකම්පාව, සමාදානය, අනුන්ගේ සෙත් පැතීම, විනීත භාවය හා සියලු සත්වයන් කෙරෙහි සත්‍යවාදී භාවය පිහිටුවා ගැන්මේ හැඟීම පෝෂණය කෙරේ. එමගින්, යහපත සැලසෙන සෑම උතුම් කාර්යයක් සඳහා ම අනුබලය ලැබේ.

# 6

# මරණින් මතු ජීවිතය

මරණින් මතු ජීවිතයක් ඇත්දැයි යන ගැටළුව විද්‍යාත්මක නිගමනයකට අදාළ වූවක් නොවේ. හේතුව, විද්‍යාව මගින් කෙරෙන්නේ ඉන්ද්‍රියයන්ට විෂය වූ දත්තයන් විශ්ලේෂණය කිරීමක් පමණි. එපමණක් ද නොවේ. නූතන වහරින් පවසතොත්, මිනිසා විද්‍යාත්මක නිරීක්ෂණ හා පර්යේෂණයන් හි නිරත වන්නට වූයේ, ඉකුත් ශතවර්ෂ කිපය තුළ පමණි. මරණින් මතු ජීවිතය පිළිබඳ පිළිවෙත, ඔහුට දුරාතීතයේ සිට හුරුපුරුදු වූවකි. සෑම නබිවරයෙක්ම තම ප්‍රජාව අමතා අල්ලාහ් අදහන ලෙසත්, මරණින් මතු ජීවිතය පිළිබඳ විශ්වාසය පිහිටුවන ලෙසත් දෙසූහ. ඔවුන් මොනතරම් අවධාරණයකින් එය ඉගැන් වූවාද යත්, මරණින් මතු ජීවිතයක් නැති කල එමගින් නැඟෙන්නේ අල්ලාහ්ට පිටුපෑමක්, සෙසු ඕනෑම විශ්වාසයක් නිශ්ඵල වන බවත් තරයේ ප්‍රකාශ කළහ. අල්ලාහ්ගේ සෑම නබිවරයෙක්ම, මරණින් මතු ජීවිතය පිළිබඳ ව ඒකා කාරව , ඒගැන අතිශය ඇදහිලි සහිතව කරුණු සඳහන් කළහ. ඒ නබිවරුන් විසූ වකවානු අතර දහස් සංඛ්‍යාත වසරක පරතරයක් පැවතියත් මරණින් මතු ජීවිතය සම්බන්ධයෙන් ඔවුන්දත් දැනුම් ප්‍රමාණය සමාන විය. නිදසුනක් වශයෙන්-''වහී''- දිව්‍ය හෙළිදරව්- දැක්විය හැකිය.මරණින් මතු ජීවිතය පිළිබඳ විශ්වාසයක් නොවූ බැවින්, ඒ සෑම නබිවරයකුම සමකාලීන ජනතාවගේ ගැරහුමට ලක්වූ බව අපි දනිමු. ඒ ගැරහුම, විරෝධතා මධ්‍යයේ වූවද, ඒ නබිවරුන්ට අවංක අනුගාමිකයෝ බෙහෙවින් ඒක රාශි වූහ. මෙහිදී පැනනගින ප්‍රශ්නයක් නම්, තත් සමාජයෙන් කොන්කරනු ලැබීම පවා නොතකා, තදින් කාවැදී තිබුණු විශ්වාස, මතිමතාන්තර හා මුතුන්මිත්තන්ගේ සිරිත් විරිත්, ගතානුගතික මතිමතාන්තර යනාදිය දුරුලන්නට තරම් මොවුන් පෙළඹවූයේ කවරක්ද යන්නයි. මීට සරලම පිළිතුර නම්, ඔවුන් සත්‍යය වටහාගැන්මෙහිලා දැඩි අවශ්‍යතාවයකින් තම සිත්සතන් යොමුකිරීමයි. ඔවුන් එය වටහාගත්තේ අනුදැනුමක් සහිතවද? එසේ විය නොහැකිය.

මරණින් මතු ජීවිතය පිළිබඳ අනුදැනුමක්, අත්දැකීමක් පිහිටිය නොහැකිය. අත්දැකීමට අමතරව, අල්ලාහ් විසින් මිනිසාට, යථාර්ථවාදී සෞන්දර්යාත්මක හා සදචාරාත්මක හැඟීම් හිමිකර දී.ඇත.සත්‍යය මත මිනිසාට මගපෙන්වීමක් ලබාදෙන්නේ මෙකී හැඟීමයි. ඉන්ද්‍රියයනට ගෝචර වූ දත්තයන් මගින් එය විග්‍රහ කළ නොහැකිය. අල්ලාහ්ගේ නබිවරුන්, අල්ලාහ් සහ මරණින් මතු ජීවිතය ගැන විශ්වාසය පිහිටුවන මෙන් තම ජනතාව කැඳවන අතරම සෞන්දර්යාත්මක, සදචාරාත්මක හා යථාර්ථවාදී හැඟීම් ද ඒ හා ආදේශ කළහ. නිදසුනක් වශයෙන් මක්කාවේ ප්‍රතිමා වන්දකයන් විසින් මරණින් මතු ජීවිතය පිළිබඳ පිළිවෙත නොපිළිගත් අවස්ථාවේ, ඔවුන් ගේ දුබලකම හුවා දක්වනු පිණිස අල්කුර්ආනයෙන් තර්කානුකූල හා යථාර්ථවාදී විග්‍රහයක් මගින් එය සනාථ කෙරුණි.

''තවද ඔහු අපට ආදේශකයින් පිහිටුවයි. ඔහුගේ මැවීම ගැන අමතක කොට ''මෙ ඇටකටු දිරාපත්වූ පසු එයින් යළි මතුකරන්නේ කෙසේදැ'යි (විමසයි) පවසන්න, ප්‍රාරම්භයේ දී එය නිපදවූ ඔහුම යළි මතුකරන්නේය. තේතුව ඔහු සියලු නිර්මාණයක් ගැනම දනී. හරිත වෘක්ෂයක් තුළින් ඔබට ගින්දර සැපයුවේ කවිද? ඔබ එයින් දල්වන්නේහි. ආකාශ හා මහ පොළොව මැව්වේ කවිද? ඒ අන්දමින් මැවිය හැක්කේ කාටද? සැබැය. ශ්‍රේෂ්ඨතම මැවුම්කාරයා ඔහුය. ඔහු සර්වඥනීවේ.'' (අල්කුර්ආන් 36: 78- 81).

කාෆිර් වරුන් මරණින් මතු ජීවිතය නොඅදහා සිටීමෙහි ලා කිසිදු පදනමක් නැති බව, සෙසු අවස්ථාවකදී විස්තර කෙරේ.

''මෙලෝ ජීවිතය හැර වෙනත් ජීවිතයක් නැතැයි ඔවුහු පවසති. 'අපි මරුමුවට පත්වෙමු . අපි ජීවත්වෙමු.කාලය විනා අප වනසන සෙසු කිසිවක් නැත.' ඒ ගැන ඔවුන්ට කිසිදු දැනුමක් නැත. ඔවුන් දරන්නේ හුදෙක් උපකල්පන පමණි. අපේ වහී ඔවුන්ට දේශනාකරන විට, ඔවුන්ගේත් එකම තර්කය වන්නේ මෙයයි. 'ඔබ ඇත්ත දෙඩවනවානම් අපේ පියවරුන් (යළි) මතු කරන්න. ගෙනත් පෙන්වන්න.' යන්නයි''
(අල් කුර්ආන් 45: 24- 25)

නියත වශයෙන්ම මළගිය සියල්ල, අල්ලාහ් යළි මතු කරන්නේය. එහෙත් අල්ලාහ්ට ස්වකීය සැලැස්මක් තිබේ. මෙ මුළු මහත් විශ්වන් මණ්ඩලයම විනාශයට පත්ව, මළගිය සියල්ල අල්ලාහ් හමුවේ නැගීසිටින දිනයක් උදවනු ඇත. එය ජීවිතයේ ආරම්භක දවසයි. එමතු අවසානයක් නැත. තවද, එදින සෑම පුද්ගලයෙකුටම ඔවුනොවුන් කළ කුශල් හා අකුශලයට අදල ඵල විපාක ප්‍රදානය කෙරේ.

මරණින් මතු ජීවිතයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් මිනිසා ඉල්ලා සිටින විග්‍රහය, අල්කුර්ආනයෙන් සැපයේ. ඇත්තෙන්ම මරණින් මතු ජීවිතයක් නැත්නම්, අල්ලාහ් කෙරේ පිහිටුවන ඇදහිල්ල නිෂ්ඵල වනු ඇත. නැත්නම් අල්ලාහ් පිළිබඳ ඇදහිල්ල පිහිටුවා ගත්තත්, මිනිසුන් මවා ඔහුගේ ඉරණම නොවිසඳන ඒ අල්ලාහ් අසාධාරණ හා පක්ෂග්‍රාහී අල්ලාහ් කෙනෙකුයි හැඟෙනු ඇත. නිසැක වශයෙන්ම අල්ලාහ් සාධාරණය. ශත සංඛ්‍යාත අහිංසක ජනතාව ඝාතනය කරමින් සමාජයේ දූවැන්ත දූෂණ දුරාචාරයන් හි නිරත වෙමින්, තමන්ගේ වැඩකටයුතු කරවා ගනු පිණිස අසංඛ්‍යාත දනන් වහල් භාවයේ යොදවා ගනිමින් යනාදි වශයෙන් සීමාතික්‍රාන්ත සාපරාධී කටයුතු වල යොමුවූවන්ට අල්ලාහ් දඬුවම් කරන්නේමය. මෙ මිහිතලය මත ඉතා ලසු ජීවිත කාලයක් ගතකරන මිනිසාට අඩු තරමින් මෙ භෞතික ලෝකය පවා සදාකාලික නොවන කල, ඔහු කළ කුශලාකුශලයනට අදළ ඵල විපාක පමුණුවාලීමට තරම්, කාලය ප්‍රමාණවත් නොවේ. යුක්තිය විනිශ්චය කරන දිනයක් උදාවියයුතු බවත්, එහිදී සෑම ආත්මයකම ඉරණම, ඔවුනොවුන් ඉදිරිපත් කරන සටහන් වාර්තා අනුව, අල්ලාහ් විසින් යුක්තිය විනිශ්චය කෙරෙන බවත් නොඅනුමානය.

''කාෆිර්හු මෙසේ කියති: 'ඒ මොහොත අපට කිසිදු උදා නොවේ.' පවසන්න. 'නැත. මගේ ස්වාමියාගේ නාමයෙන්, එය නිසැක වශයෙන්ම ඔබටත් උදාවන්නේය. (ඔහු) අවිද්‍යමාන දේද දකී. පරමාණුවක තරම් නැත්නම් ඊට වැඩි හෝ අඩුබරක් වුවද ආකාශයන්හි හෝ පෘථිවිය මත (ඔහුගේ දෘෂ්ටියෙන්) මුවා විය නොහැකිය. එය පැහැදිලි සටහනේ සඳහන් වේ. ඔහු අදහා යහපත සිදුකරන්නන්ට ඔහු තිළිණ ප්‍රදානය කරයි, ඔවුන්ට සමාව හා විශාල තිළිණ ද ඇත.''

''එහෙත් අපේ වහී වලට එරෙහිව අභියෝග කරමින් කලබල කරනවුන්ට පීඩාකාරී දඬුවම් හා (දේව) උදහස හිමිවේ.'' (අල් කුර්ආන් 34: 3-5)

යළිමතුවන- කියාමත්- දිනය වූකලී, අල්ලාහ්ගේ පරම සාධාරණත්වය හා පරම කරුණා දයාව යන දිව්‍ය ගුණාංග සපුරා පිරී උතුරා යන දවසයි. තමන්ට සදාකාලික සංතුෂ්ටිය ලැබෙනැයි අදහා, ලෞකික ජීවිත සමයේ අල්ලාහ් වෙනුවෙන් දුක් පීඩා දරාගත් දනන් කෙරේ ඔහු විශිෂ්ඨතම මෛත්‍රී මහිමය හලනු ඇත. එහෙත් මතු දිවියක් සම්බන්ධයෙන් නොසැලකිල්ලෙන්, අල්ලාහ්ගේ අණසක කඩකළවුන් ඛේදනීය ශෝකාන්තයකට පත්වෙති.මෙකී උභය පාර්ශ්වයම සංසන්දන කරමින් අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

"මොවුන් එක හා සමානද? අපේ මහඟු පොරොන්දු ලැදවුන් එය අත්කරගනු පිණිස ළඟාවන්නේ කවුද? අප විසින් මෙලෝ මත සුව පහසු ජීවිතයක් ලැදවුන් (දඬුවම් පිණිස) ගෙනෙනු ලැබුවන් හා සිටින්ද?" (අල් කුර්ආන් 26:61)

ලෞකික ජීවිතය වූකලී, මරණින් මතු සදාකාලික ජීවිතය සඳහා, සූදානම් වීම පිණිස වූවකි. මරණින් මතු ජීවිතය ප්‍රතික්ෂෙප කරන්නා, ස්වකීය තණ්හා ආශාවන්ට වහල් වෙමින් සිල්වත් හා අල්ලාහ් කෙරේ බියැත්තන්ට උපහාස කරති. මෙවැන්නෝ තම වරද වටහා ගන්නේ මරණාසන්න මොහොතේය. එහිදී මෙලෝ ජීවිතය සඳහා තවත් වැඩි අවස්ථාවක් ලැබේවායි පතමින් වැලපෙති. ඔවුන්ට එබඳු අවස්ථාවක් උද නොවේ. මරණාසන්න මොහොතේ ඔවුන් පසුවන ශෝකාතුරු තත්ත්වය හා කියාමත් පරමාන්ත දවසේ, ඔවුන් පසුවන වේදනීය විලාශය හා අවංක මුමින් වරුන් සඳහා සහතික වූ සදාකාලික ආශිර්වාදය ගැන අල් කුර්ආනයේ මැනවින් විස්තර කෙරේ. "ඔවුනතුරින් කෙනෙකු මරණාසන්න වූවිට, මගේ ස්වාමීනි! මා ආපසු යවන්න. මවිසින් නොකරන ලද කුශල් පුරන්නේමි'යි පවසයි. නමුත් නැත. එය ඔහු දෙඩන වදනක් පමණි. එවැන්නවුන්ගේ පසුපස, යළි මතුකරනු ලබන දිනය තාක් සම්බන්ධයක් පවතී. සූර් - නලාව පිඹින කල ඔවුනතර එදින නෑ සබඳතා නොදිස්වේ. එකිනෙකාගෙන් ඉල්ලාගත හැකි කිසිවක් නැත මිණුම් තාරාදිය බරවන්නේ කාගේද, ඔහු ජයග්‍රාහී වේති. තරාදිය සැහැල්ලුවන්නේ කාගේද ඔහු ආත්මය නරකාදියට පත්කර ගතිති. ඔවුන්ගේ මුහුනු නරකාදියෙන් පිළිස්සෙයි. ඔවුහු එතුළ අඳුරින් මැලවෙති." මරණින් මතු ජීවිතය පිළිබඳ ඇදහිල්ලෙන් මතු ජීවිතය සාරවත් වනවා පමණක් නොව, මිනිසුන්ගේ ක්‍රියාකලාප සම්බන්ධයෙන් අතිශය වගකීම හා ආකල්ප ඇතිවීමෙන් මහ පොලෝ මතද සාමය හා සතුට රජකරයි.

අරාබියේ ජනතාව ගැන සිත යොමුකරන්න. මරණින් මතු ජීවිතය පිළිබද ඇදහිල්ලක් නැති අවධියේ, සුරාව, සූදුව, ගෝත්‍රික සටන්, ආරවුල්, මං පැහැරීම් හා මිනිස් ඝාතන යනාදිය ඔවුන්ගේ වැදගත් ක්‍රියාකලාපවිය. එහෙත් එකම අල්ලාහ් හා මරණින් මතු ජීවිතය පිළිබදව ඔවුන් අදහන්නට පටන්ගත් වහාම, ඔවුහු සමස්ත ලෝකයේ ම දැහැමි ශීලාචාර සම්පන්න ජාතියක් බවට පත්වූහ. ඔවුහු දුසිරිත් අත්හළහ. දුකේදී එකිනෙකාට පිහිටවූහ. තමන්ගේ සෑම අර්බුදයක්ම ගැටළුවක්ම යුක්තියෙන් සාධාරණත්වයෙන් හා ස මානාත්මතාවයෙන් නිරාකරණය කර ගත්හ. එසේම මරණින් මතු ජීවිතය පිළිබද අවිශ්වාසය නිසා, එලෝ වශයෙන් පමණක් නොව මෙලෝ වශයෙන්ද අනර්ථකාරී ප්‍රතිඵල ගෙන දේ. මුළු මහත් රාජ්‍යයක්ම එය ප්‍රතික්ෂෙප කරන්නේ නම්, ඒ සමාජය තුල සවිකාර දුසිරිත් හා දූෂණවලින් පිරිකිර්

ගොස්. එය මුළුමනින්ම විනාශ වියනු ඇත. අල් කුර්ආනයෙන්, ආද් හා සමූද් වරුන්ට මෙන්ම ෆාරාවෝ වරුන්ට අත්වූ පරිහානිය තරමක් විස්තර කෙරේ.

"සමූද් හා ආද් (වාර්ගිකයෝ) මතු සිදුවන ධර්මාධිකරණය ගැන නොඇදහූහ. සමූද් වරු අකුණු සැරයෙන්ද, ආද් වරු බියකුරු කුනාටුවකින්ද විනාශ කරනු ලැබූහ. අල්ලාහ් එය ඔවුන් කෙරේ පුරා දින අටක් හා රාත්‍රී හතක් මුළුල්ලේ ම පහත් කළේය. මේ නිසා එහි දනෝ කපා හෙළන ලද ඉඳිගස් මෙන් දරදඬු බවට පත්වූහ.

"දැන් ඔවුන්ගේ සිදු වූ බේදය දුටුවෙහිද? ෆාරාවෝ ද පෙර දී එසේම වූහ. (එයද) ඔවුන්ගේ පුරවරද විනාශ කරන ලදී. ඔවුහු වරද සිදුකළහ. අල්ලාහ් යැවූ නබිවරයාට එරෙහිව කඩාකප්පල් කාරී ක්‍රියාවන් කළහ. එනිසා අල්ලාහ් ඔවුන් දැඩිලෙස ග්‍රහණය කළේය. ජලය උතුරා ගැලූ විට අපි ගමන් ගන්නා නැවක් තුලට ඔබ දැමුවෙමු. එමගින් ඔබට සිහිපත් කරවීමක් හා සාවධානව ශ්‍රවණය කරවීමක් සඳහාය. එ නිසා 'සූර්' නලාව වරක්නාද කළ විට පෘථිවිය හා කඳු පර්වත එසවී, තිමේෂයකින් (එක්වරම) සුණු විසුණු වී යයි. පසුව එදින හිති භ්‍රාන්තය රජකරයි, එදින අහස කැඩී බිඳී දුබල වී යයි. එවිට පොත සුරතෙහි ලද්දෝ 'මෙන්න, මගේ පොත, රැගෙන කියවන්න." ඇත්තෙන්ම මා කළ දේ වල ප්‍රතිඵලය මට ලැබෙතියි ඇදහුවෙමි. එමනිසා, ඔහුට පැද්දෙන උතුම් උයනේ ජීවිතය අත්වනු ඇත. මැනවින් කා බී සැනසෙන්න. ඔබ එවැන්නක් කළේ බොහෝ කලකට පෙරය."

"එහෙත් පොත වමතෙහි ලත් අය මෙසේ පවසනු ඇත. 'මට මගේ පොත ලැබුණේ නැහැ නොවැ. එනිසා මාකළ දේවල ප්‍රතිඵලය මාදන්නේ නැහැ. නොවැ, මෙ අවසානයද? අහෝ! මගේ වස්තුවෙන් මට පිහිටක් නැත. මගේ ආධිපත්‍යය- බලය මගෙන් ගිලිහී ගොස්ය.
(අල්කුර්ආන් (69:4-39)

මරණින් මතු ජීවිතය ඇදහීමට ඉවහල්වූ මෙබඳු අවබෝධාත්මක කරුණු කුර්ආනයේ අඩංගු වේ.

පළමුවා:- මරණින් මතු ජීවිතය ගැන විශ්වාසය පිහිටුවන මෙන් සෑම නබි වරයෙක්ම දේශනා කළහ.

දෙවනුවා:- මේ විශ්වාසයේ පදනමින් සමාජයක් ගොඩ නැඟුණු කල, එය සාමූහික හා සදාචාරාත්මක දෙසින් තොරව ශ්‍රේෂ්ඨතම සාමකාමී සමාජයක් වනු ඇත.

තෙවනුව:- නබිතුමාගේ අඛණ්ඩ අනතුරු ඇඟවීම්වලින් පසුවත්, ජන කොටසක් සාමූහික වශයෙන්මෙ ඇදහිල්ල ප්‍රතික්ෂේප කළේ නම්, අල්ලාහ් විසින් මෙලොවෙහිදීම ඒ ජනකොටස වනසා දමන බව ඉතිහාසයෙන් ස්ඵුට වේ.

සිව්වනුව:- මිනිසාගේ සදචාරාත්මක යථාර්ථවාදී හා සෞන්දර්යාත්මක අනුදැනීම මගින් මරණින් මතු ජීවිතය ගැන වටහා ගත හැකිය.

පස්වනුව:- මරණින් මතු ජීවිතයක් නැත්නම්, අල්ලාහ්ගේ යුක්ති සාධාරණත්වය හා කරුණා මෛත්‍රියෙහි අර්ථයක් නැත.

# 7

# නබීත්වය හා ඉස්ලාම්

දෙව්ලොවින් පහත් වූ බුද්ධ, ක්‍රිස්තියානි යනාදී දහම් වලට නබීත්වය අමුත්තක් නොවේ. එහෙත් ඉස්ලාම් හි ඊට සුවිශේෂ තත්වයක් හා වැදගත් කමක් ප්‍රදානය කෙරේ.

ඉස්ලාමයෙන් ඉගැන්වෙන පරිදි අල්ලාහ් විසින් මිනිසුන් මවනු ලැබුණේ උතුම් අරමුණක් සඳහාය. මිනිසුන් අල්ලාහ් නැමදීම හා සිල්වත් ජීවිතයක් සකසා ගැනීම, ඒ අරමුණයි. ඒ සඳහා අල්ලාහ්ගේ ඉගැන්වීම හා මග පෙන්වීම සලසා ඇත. එකී අරමුණ, පැහැදිලි හා ප්‍රයෝගිකවූ උපදෙස් වලින් තොරව, මිනිසා දැනගන්නේ කෙසේද? නබීත්වයේ අවශ්‍යතාවයක් මතු වන්නේ මෙහිදීය. ස්වකීය පණිවුඩය ජනතාවට ඉදිරිපත් කරනු පිණිස, සෑම ජනකොටසක් ජාතියක් තුළින්ම, අල්ලාහ් නබිවරයෙකු හෝ කිහිප දෙනකු තෝරා ගෙන ඇත.

අයෙකු මෙසේ විමසනු ඇත. 'නබිවරුන් තෝරාගනු ලැබුණේ කෙසේද? එකී ශ්‍රේෂ්ඨ සම්මානය හිමිවිය හැක්කේ කවරෙකුටද?

නබීත්වය වූ කලී, අල්ලාහ්ගේ මනාපයට අනුව, ස්වකීය කරුණා මෛත්‍රියට පාත්‍රවූවන්ට පුද කරන්නෙකි. ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී, විවිධ නබිවරුන් තුළ පොදුවේ පිහිටි තෙවැදෑරුම් ස්වභාවයන් ගෙන් නබිවරයෙකු හඳුනාගත හැකිය. (1)සදචාරාත්මක හා ප්‍රබුද්ධත්වය අතින්, එතුමාණෝ තත් සමාජයේ උසස්තම ස්ථානය උසුලති. මෙ ගුණාංගය පිහිටන්නේ, නබිවරයෙකුගෙන් අනුගාමිකයන්ට ආදර්ශයක් සලසනු පිණිසය. එතුමාගේ පෞරුෂ ලක්ෂණ නිසා, ජනතාව එකී නිවේදනය පිළිගන්නා සුළු විය යුතුය. එතුමාගෙන් දනන්ගේ දුරස්ථවීමක් නොවිය යුතුය. නිවේදනය නබිවරයා අතට පත් වූ පසු, එතුමාගේ ජීවන රටාව නොකෙළෙස් විය යුතුය.

එනම් කිසිදු අකුශල කර්මයක් සිදු නොවිය යුතුය. සුළු ප්‍රමාණ වරදක් සිදුවන කල, ඒවා `වහි´ මගින් නිදෙස් කරවනු ලැබේ.
(2) එතුමා ව්‍යාජ නබිවරයෙකු නොවන වග සනාථ කරනු පිණිස, ප්‍රාතිහාර්ය, හාස්කම් පෑමේ හැකියාව එතුමාට හිමිවේ. මෙකී ප්‍රාතිහාර්ය ශක්තිය හා අවසරය පවරන්නේ අල්ලාහ් විසිනි. මේ ප්‍රාතිහාර්ය බලය නිසා එකී නබිතුමාණෝ ජනතාව අතර සුවිශේෂ ගණයේ ලා සැලකෙති. මේ බැව් ලෝකයේ ප්‍රධාන පෙළේ ආගම් තුනක් වන, ජුදෙව්, ක්‍රිස්තියානි හා ඉස්ලාම් හි නබිවරුන් විසින් පාන ලද වැදගත් හාස්කම් මගින් පැහැදිලි වේ. මූසා(MOSES) නබි (අලයි) තුමාගේ දනෝ විජ්ජාවන්හි සමත් වූහ. එනිසා එතුමාගේ මූලික ප්‍රාතිහාර්යය වූයේ, එදවස ඊජිප්තුවෙ විසූ දක්ෂතම විජ්ජාකරුවන් පරාජයකිරීමයි. ඊසා නබි (Jesus Christ) (අලයි) තුමා ගේ දනෝ දක්ෂ වෛද්‍යවරු වූහ. එබැවින් එතුමාගේ ප්‍රතිහාර්යය වූයේ, මළවුන් නැගිට වීම හා සුවකළ නොහැකි ආබාධ සුවපත් කිරීමයි. මුහම්මද් නබි (සල්) තුමාගේ අරාබි ජනතාව චතුර කථිකත්වයට හා කාව්‍ය නිර්මාණයට සුපතලව සිටියහ. එබැවින් මුහම්මද් (සල්) තුමාගේ ප්‍රධානතම ප්‍රතිහාර්යය වූයේ, අල්කුර්ආනයයි. නොකඩවා කළ අභියෝග වලින් පසුවත්, එය සමස්ත අරාබියේ කිසිදු ප්‍රවීණ කවියෙකුට හෝ කථිකයෙකුට නුපුළුවන් වූ තරමේ කෘතියකි. තවද, මුහම්මද් (සල්) තුමාගේ පෙළහරෙහි පවත්නා විශේෂත්වයක්ද ඇත. මුලදී සෙසු නබිවරුන් දැක්වූ ප්‍රාතිහාර්යයන් තත් කාලයට හා ස්ථානයට පමණක් සීමා විය. එනම් එකී හාස්කම් දක්වනු ලැබුණේ නිශ්චිත පිරිසක් අබියස නිශ්චිත අවස්ථාවකය. මුහම්මද් (සල්) තුමාගේ හාස්කම එනම් අල්කුර්ආනය එසේ නොවේ. එය විශ්ව ව්‍යාප්ත වූවකි. සදාකාලික වූවකි. එහි ශෛලිය, ප්‍රාතිහාර්යාත්මක ස්වභාවය, අන්තර්ගත කරුණු එමගින් අත්වන අධ්‍යාත්මික ඵලය යනාදියට පූර්ව පරම්පරා සාක්ෂි දරති. අනාගත පරම්පරාද සාක්ෂි දරනු ඇත. දැනුදු මේ බව පිරික්සා බැලිය හැකිය. මේ අනුව, අල්කුර්ආනයේ දිව්‍යමය සම්භාවය කවදත් ඔප්පුවෙමින් පවතී.

(3) සෑම නබිවරයෙක්ම, තමන් ලද පණිවිඩය ස්විය නිර්මාණයක් නොවූ බවත්, මානව ශුභ සාධනය පිණිස අල්ලාහ් විසින් පවරන ලද්දක් බවත් වදාළහ. තමන්ට පෙරාතුව පහළ වූත්, තමන්ගේ පසුව පහළවන්නා වූත් දහම් පිළිබඳව ද ඔවුහු කරුණු දැක්වූහ. නබිවරයෙකු මෙලෙස කරන්නේ, තමන් හුදෙක් එකම සත්‍ය වූ අල්ලාහ් ගෙන්, සෑම ජන කොටසකටම සෑම අවධියකම පොදු වූ නිවේදනය ජනතාව අතට පත්කරන බව පෙන්වා දීමටය. මේ අනුව නිවේදනයේ සාරධර්මය හා අභිමතාර්ථය කවදත් එක සමානය. මේ නිසා නිශ්චිත නබිවරයෙකුට පෙරාතුව පහළ වූ හෝ පසු කලෙක පහළ වන්නාවූ එබඳු දහමක් පිටු දැකිය යුතු නැත.

අල්ලාහ්ගේ උපදෙස් හා මග පෙන්වීම මානව වර්ගයාට ඉදිරිපත් කිරීමෙහිලා නබිවරු අවශ්‍ය වෙති. අප මවන ලද හේතුව දැනගැනීමේ මාර්ගයක් නැත. මරණින් මතු

අපට සිදුවන්නේ කුමක්ද? මරණින් මතු ජීවිතයක් තිබේද? එනම් ලෞකික ජීවිතයේදී අප කල කී දේ වල ආනිශංස හෝ ආදීනිව ඇත්ද? අප ඒ ක්‍රියාවනට වගකිව යුතුද? මෙබඳු ගැටළු හා අල්ලාහ්, මළක්වරුන්, දෙව්ලොව, අපාය යනාදිය සම්බන්ධයෙන්, අසහාය මැවුම් කාරයාවූත්, සැඟවුණු දේ දන්නා වූත් අල්ලාහ්ගේ ඍජු හෙළිදරව් කිරීමකින් තොරව, පිළිතුරු ලබාගත නොහේ. එකී පිළිතුර සැබෑවිය යුතුය. අපගේ විශ්වාසය හා ගෞරවාදය දිනාගත් පුරුෂයන් විසින් ම සැපයෙන පිළිතුරක් විය යුතුය. නබිවරුන්, තත් සමාජයෙන් ම සදාචාර සම්පන්න, බුද්ධිමය කුශලතාවයන් සමන්විත වූවන් අතරින් තෝරා ගනු ලබන්නේ එබැවිනි.

මෙ අනුව බයිබල් පුරාවෘත්තයන්හි, ඇතැම් ශ්‍රේෂ්ඨ නබිවරුන් සම්බන්ධයෙන් කෙරෙන ව්‍යාජ කතන්දර මුස්ලිම් වරුන් විසින් පිළි නොගැනේ. නිදසුනක් වශයෙන්, ලූත් (Lot)නබි-අලයි- තුමා බීමත්ව ස්වකීය දියණියන් හා අනාචාරයේ හැසුරුණු ආරංචිය, දවූද් නබි (David)අලයි තුමා ස්වකීය බිරිඳ පාවාගනු පිණිස තම නායකයෙකු මරාදැමීම බඳු තොරතුරු දැක්විය හැකිය. මෙ කතන්දර වලින් ගෙන දක්වන අන්දමට වඩා, මුස්ලිම් වරු නබිවරුන් උසස් තත්හි ලා සලකති. ඉස්ලාමීය දෘෂ්ඨි කෝණයෙන් විමසන කල, ඒකී කතන්දරය සත්‍ය විය නොහැකිය.

නබිවරු ශුද්ධතමය වශයෙන් අල්ලාහ්ගේ පිහිට ලබති. දිව්‍ය නිවේදනය නොකඩවා ගෙන යනු පිණිස අල්ලාහ්ගෙන් උපදෙස් ලබති.

මානව සංහතිය වෙනුවෙන් නබිවරයෙකු ඉදිරිපත් කරන නිවේදනයක අඩංගුවන කරුණු සැකෙවින් මෙසේය.

(1)අල්ලාහ් පිළිබඳ පැහැදිලි පිළිවෙත; ඔහුගේ පරම ගුණාංග; ඔහු ගේ මැවීම; ඔහුට ප්‍රිය හා අප්‍රිය දේ.

(2)නුදුටු ලෝකය, මළක්වරුන්, ජින්වරුන් (භූතයින්), ස්වර්ග ලෝකය හා නරකාදිය පිළිබඳ පැහැදිලි අදහස.

(3) අල්ලාහ් අප මැව්වෙ මක්නිසාද? අපෙන් ඔහුට අවශ්‍යවන්නේ කුමක්ද? ඔහුට කීකරු හෝ අකීකරු වූ කල අපට හිමිවන විපාක කවරේද?

(4)ඔහුගේ මනාපයට අදාළ ව,අපගේ සමාජ පවත්වා ගත යුත්තේ කෙසේද? එනම් අවංක ව හා නිවැරදිව ක්‍රියාත්මක කළවිට ප්‍රීතිමත් හා ආදර්ශවත් සමාජයක් ගොඩනැංවීමට ඉවහල් වන්නාවූ පැහැදිලි උපදෙස් හා නීති රීතින් කවරේද?

ඉහත කළ සකාච්ඡාවෙන් අපට පැහැදිලිව පෙනීයන්නේ නබිවරුන් වෙනුවට අන් කිසිවකු ආදේශ කළ නොහැකි බවයි. විද්‍යාත්මක දියුණුව පවත්නා අද පවා, උත්තරීතර ලෝකය පිළිබඳව විශ්වාස දායක තොරතුරු ලැබිය හැකි එකම මාර්ගය වහිය. විද්‍යාවෙන් හෝ ගුප්තමය ආනුභාවයිකින් මගපෙන්වීමක් ලබාදිය නොහැකිය. පළමුවැන්න, ප්‍රමාණය ඉක්මවා ලෝකායත වේ. සීමාසහිත වූවක් වේ. දෙවැන්න, ප්‍රමාණය ඉක්මවා විෂයානුබද්ධ වේ. විටින් විට නොමග යවන්නක් වේ.

දැන්, ඇතමෙකු මෙසේ විමසිය හැකිය. අල්ලාහ් විසින්, මානව සංහතිය වෙනුවෙන් නබිවරු කී දෙනෙක් යවනු ලැබුවෝද?

මෙ ගැන අපි නිසැක වශයෙන් නොදන්නේමු. ඇතැම් මුස්ලිම් විශාරදයෝ, නබිවරුන් ගේ සංඛ්‍යාව දෙලක්ෂ හතලිස් දහසකැයි (240000) දක්වති. අල්කුර්ආනයේ සඳහනට අනුකූලව අල්ලාහ් සෑම ජාතියක් වෙනුවෙන් ම නබිවරයෙකු (හෝ වැඩි සංඛ්‍යාවක්) එවා ඇත. හේතුව, කළයුතු හා නොකළ යුතු දේ පිළිබඳ විග්‍රහයක් නොකොට, අපගේ කාර්යයන් සඳහා වගකියන මෙන් පනවා නැති බැවිනි. අල්කුර්ආනයෙහි නබිවරුන් (25 ක්) විසිපස් දෙනෙකු පිළිබඳ ව සඳහන් වේ. මුහම්මද් (සල්) තුමන්ට නොදන්වන ලද තවත් නබිවරුන් සිටි බවද එහි දැක්වේ. ඒකී නබිවරුන් විසිපස්දෙනා අතර, නූහ්(Noah)-, ඉබ්‍රාහිම්(Abraham)-, මූසා(MOSES)-, ඊසා(Jesus Christ) (අලයි) සහ මුහම්මද් (සල්) තුමා ද අඩංගු වෙති. මෙකී නබිවරුන් පස්දෙනා, අල්ලාහ්ගේ ප්‍රධානතම නබිවරු වශයෙන් ගැණෙති.

නබීත්වය පිළිබඳ ව ඉස්ලාමීය ඇදහිල්ලේ ප්‍රසංශනීය අංගය වනුයේ, මුස්ලිම් වරු කිසිදු නබිවරයෙකු අත නොහැර, ඒ සියල්ලන්ම නබි වරුන් වශයෙන් ඇදහීමයි. සෑම නබිවරයෙකුම මානව සංහතිය අල්ලාහ් වෙතට මග පෙන්වීමේ එකම අරමුණ සඳහා- එකම අල්ලාහ් විසින් එවනු ලැබූවා නම්, ඒ සියලු නබිවරුන් ගැන ඇදහීම අත්‍යවශ්‍ය මෙන් ම තර්කානුකූල ද වේ. කෙනෙකු පිළිගෙන, සෙස්සකු පිටුදැකීමේ ක්‍රියාව, එක්කෝ ඒ නබිවරුන් පිළිබඳ වැරදි අවබෝධය නිසා, නොඑසේනම් ජාතිවාදය නිසා විය යුතුය. භක්තියේ අනිවාර්ය අංගයක් වශයෙන්, සියලු ම නබිවරුන් කෙරේ විශ්වාසය පිහිටුවන්නෝ ලෝකයේ ම මුස්ලිම් වරුන් පමණි. යුදෙව් හු, ඊසා නබි (යේසුස් වහන්සේ) හා මුහම්මද් (සල්) තුමන් ප්‍රතික්ෂේප කරති. එසේම ක්‍රිස්තියානි හු මුහම්මද් (සල්) තුමන් පිටු දකිති. මූසා නබි (අලයි) තුමා ගේ අණපනත් වලට තමන් බැඳී නැති නිසා ම ඒ නබිතුමන්ද ඔවුනු පිටු දකිති. ඒ මේ සියලුම නබිවරුන්, මානව සුබසෙත තකා මගපෙන්වනු පිණිස, අල්ලාහ් විසින් එවනු ලැබූවන් වශයෙන් මුස්ලිම්වරු පිළිගනිති. කෙසේ හෝ, ඒ නබිවරුන් අල්ලාහ් ගෙන් ගෙනා, වහී-දිව්‍ය හෙළිකිරීම ඒ දනන් විසින් කිසියම් ක්‍රමයකින් හෝ ක්‍රමවලින් කෙළෙසන ලදී.

සියලු ම නබිවරුන් කෙරෙ විශ්වාසය පිහිටුවන මෙන් අල් කුර්ආනයෙන් මුස්ලිමුන්ට විධානය කෙරේ.

"කියන්න (මුස්ලිම වරුනි)" අපි අල්ලාහ් අදහමු. ඔහු අපට හෙළිකළාවූත් ඉබ්‍රාහිම්- ඉස්මායිල් සහ ඉෂ්හාක්, යාකූබ් සහ ඔහු ගේ දරුවන්, මූසා සහ ඊසා යනාදීන්ට ලැබුණා වූත්, අල්ලාහ්ගෙන් සෙසු නබිවරුන්ට ලැබුණාවූත්, අල්ලාහ්ගෙන් සෙසු නබිවරුන්ට ලැබුණාවූත් දේ ගැන විශ්වාස කරමු අපි, ඔවුන් අතර කිසි විභේදනයක් නොකරමු. අප අවනත වන්නේ ඔහුටය"(අල් කුර්ආනය :- 2-136)

මෙය සත්‍ය හා අපක්ෂපාති ඇදහිල්ලක් බව මුස්ලිම්වරුන්ට දක්වනු පිණිස, අල් කුර්ආනයෙන් වැඩිදුරටත් විග්‍රහ කෙරේ. සෙසු ජාතින්ද මෙය අදහන්නේ නම් ඔවුහු ඍජු මාවතෙහි ගමන් ගනිති. එසේ නොවේනම්, ඔවුහු හිතුමතේ ක්‍රියා කරති. අල්ලාහ් ඔවුන් ගැන සලකා ගනු ඇත. මෙ බැව් අල් කුර්ආනයෙන් වැඩිදුරටත් විග්‍රහ කෙරේ. සෙසු ජාතීන්ද මෙය අදහන්නේ නම් ඔවුහු හිතුමතේ ක්‍රියා කරති. අල්ලාහ් ඔවුන් ගැන සලකා ගනු ඇත. මෙ බැව් අල් කුර්ආනයේ මෙසේ දැක්වේ.

"ඔබ අදහන දෙය ඔවුන් අදහන්නේ නම්, ඔවුහු නිසි මග සිටිති. ඔවුන් පිටුපාන්නේ නම් ඔවුහු භේද ව සිටිති. ඔවුන් ට එරෙහි ව අල්ලාහ් ඔබෙන් සෑහීමට පත්වන්නේය. ඔහු සර්ව ශ්‍රාවකයාය; සර්වඥය. මෙය අල්ලාහ් ගේ ධර්මයයි. තවද අල්ලාහ් හැර ධර්මයන්හි කවරු ශ්‍රෙෂ්ඨ ද? (අල්කුර්ආනය :2:137-138)

නබිත්වය පිළිබඳ ව විග්‍රහ කළ යුතු වැදගත් කරුණු අඩුවශයෙන් දෙකක් ඇත. එනම්, නබිවරුන් වශයෙන් ඊසා නබි(අලයි) හා මුහම්මද්(සල්) තුමාගේ චරිත ගැන පොදු වේ වැරදි අවබෝධයක් පවතී.

අල්කුර්ආනයේ විග්‍රහය මගින්, ඊසා නබි(අලයි) තුමාගේ 'දිව්‍යත්වය' හා 'දිව්‍ය පුත්‍ර' භාවය ඉඳුරා ප්‍රතික්ෂේප කෙරේ. යේසුස් වහන්සේ ද ඊසා නබි-අල්ලාහ් ගේ නබිවරයෙකු වශයෙන්, කුර්ආනයෙන් ඉදිරිපත් කෙරේ. පියෙකු ගෙන් තොර ව උපන් නිසා උන් වහන්සේ අල්ලාහ්ගේ පුත්‍රයා(Son of God) විය නොහැකිය. පියෙකු හා මවක් ද රහිත ව උපන් ආදම් නබි අලයි - තුමා ගැන ද මෙහි දී නිදසුන් දැක්වේ.

"ඇත්තේන්ම අල්ලාහ් හමුවේ, ඊසා ගේ තත්ත්වයත්, ආදම් ගේ තත්ත්වයත් සමානය. ඔහු මොහු පඨවියෙන් මැව්වේය. පසු ව 'වේවා' - කුන් - යැයි කීවේය. මොහු (ඇති) විය." (අල්කුර්ආනය :3:59)

සෙසු නබිවරුන් මෙන් ඊසා නබි-අලයි-තුමාද හාස්කම් පෑහ. නිදසුනක් වශයෙන් මළවුන් නැගිටුවීම, අඳ හා බරවා රෝගීන් සුවපත් කිරීම, යනාදිය දැක්විය හැකිය. එහෙත්, මෙ හාස්කම් සියල්ල ම අල්ලාහ් ගෙන් ලත් දෙයක් බව එතුමා නිරතුරුව ම වදාළහ.

ඇත්තෙන්ම ඊසා නබි- අලයි- තුමා ගේ පෞරුෂය හා ධර්මප්‍රචාරය වරදවා වටහා ගැනීමෙහිලා තුඩුදුන්නේ, එතුමන් ගේ ධර්මානුශාසනාවන් (වහී) එතුමා ගේ ජීවිත කාලයේ ම, ලේඛනාරූඪ කිරීමෙහිලා අනුගාමිකයන් යුහුසුළු නොවීමයි. ඒවා ලේඛනාරූඪ වූයේ, එතුමාගේ ඇවෑමෙන් සිය වසරකට පමණ පසුවය. කුර්ආනයේ සඳහනට අනුව, එතුමා ඊස්රායිල්වරුන්ගේ දරුවන් වෙත එවනු ලැබූහ. මූසා නබි අලයි- තුමාට පහළ වූ තව්රාත්හි-(යුදෙව් දහම) වලංගු භාවය තහවුරු කළ ඊසා නබි තුමා මතු පැමිණෙන නබි තුමන් ගැන ද අනාවරණය කළහ.

"පසුව මෙරිගේ පුත් යේසු." ඊස්රායිල් වරුන්ගේ දරුවෙනි, මට පෙරාතුව පහළ වූ තව්රාත් (Torah) - දහම තහවුරු කරමින්, මගෙන් පසු පැසසුම් ලද්ද යන නමින් යුතුව දූතයෙකු පැමිණෙතියි යන සතුටුදායක නිවේදනය සහිතව, මම ඔබ වෙත පැමිණියා වූ දූතයා වෙමි." (61:6) අරාබි පදය 'අහ්මද්' යනුයි. ඒ, මුහම්මද් තුමාගේ උතුම් නාමයකි.

එහෙත්, යුදෙවුන් ගෙන් බහුතරය, යේසුස් වහන්සේගේ ධර්මප්‍රචාරය ප්‍රතික්ෂේප කළහ. උන්වහන්සේගේ ජීවිතයට හානි පැමිණවීම සඳහා කුමන්ත්‍රණය කළහ. ඔවුන්ගේ අදහස පරිදි, උන්වහන්සේ කුරුසියෙහි ඇණ ගසා මරා දමනු ලැබූ සේක. එහෙත් මෙ මතය, අල්කුර්ආනයෙන් ප්‍රතික්ෂේප කෙරේ. යුදෙව්වන් විසින් ඊසා නබි තුමා (අලයි) කුරුසියේ ඇණගසනු ලැබුවේ හෝ මරාදමනු ලැබුවේ නැත. අල්ලාහ්, ඒ, නබිතුමන් තමන් වෙත ඔසවා ගත්තේය. ඊසා නබි (අලයි) තුමා යළිත් පැමිණෙන බවත්, එතුමා ගේ ජීවිත කාලය තුළ දීම සියලු ම ක්‍රිස්තියානීන් හා යුදෙවුන් එතුමාගේ දහම (ඉස්ලාමය) පිළිගන්නා බවත්, අල් කුර්ආනයේ පාඨයකින් දැක්වේ. මෙ බව, මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාගේ හදීසයකින් ද පැහැදිලි කෙරේ.

අල්ලාහ්ගේ පරිසමාප්ත නබි වූ මුහම්මද් (සල්) තුමා සයවන ශතවර්ෂයේ (ක්‍රි.ව.) අරාබියේ උපන්හ. එතුමාට සතලිස් වන විය දක්වා, මක්කා වාසීන් විසින් දැන හැඳින සිටියේ, ශ්‍රේෂ්ඨ චාරියාවක් ඇති, ශීලාචාර සම්පන්න ගුණදහම් හා ගති පැවතුම් පිහිටි පුරුෂයෙකු වශයෙන් පමණි. මෙ නිසා එතුමා විශ්වාසදායකයා යන අරුත් දෙන 'අල් අමීන්' නමින් හඳුන්වනු ලැබූහ. තමා, අල්ලාහ් ගේ නබි වී, ඔහුගේ 'වහී' ලබන්නෙකු වෙතියි එතුමා පවා දැන සිටියේ නැත. එතුමා මක්කාවේ ප්‍රතිමා

වන්දකයන් අමතා, එකම දෙවියා වූ අල්ලාහ් අදහන මෙන්ද, තමා ඔහුගේ නබි බව පිළිගන්නා මෙන් ද ඉල්ලා සිටියහ. එතුමා ට පහළ වූ වනී, තත් ජීවිත කාලය තුළදී ම අනුගාමිකයන් විසින් කට පාඩම් කරනු ලැබ, තල්පත්, සත්වසම් යනාදියේ ලේඛනගත කරනු ලැබ සුරක්ෂා කරන ලදී, මෙසේ, අද අප අතර දක්නට ඇති අල් කුර්ආනය, එදා එතුමාට පහළ වූ පියවි ආකාරයෙන්ම, වචනයක් හෝ එමෙ නොවී පවතී. එහි ආරක්ෂා ව අල්ලාහ් විසින්ම සහතික කෙරේ. එය සෑම කාලයක් හි දී ම වෙසෙන මුළු මහත් මානව සංහතිය උදෙසා පහළ වූවක් බවත් අල්ලාහ්ගේ පරිසමාප්ත නබි, මුහම්මද් (සල්ලල්ලාහු අලයිහිව සල්ලම්)තුමා බවත් අල් කුර්ආනයේ අවධාරණය කෙරේ.

# 8

# ඉබාදත්

# ඉස්ලාමීය වත්පිළිවෙත්

ඇතැම මුස්ලිම්වරුන් ඇතුළුව බොහෝ අය, ඉස්ලාමීය ඉබාදත් වත් පිළිවෙත් ගැන වරදවා වටහා ගෙන සිටිති. පොදුවේ, ඉබාදත් වශයෙන් සැලකෙන්නේ, අස්සලාත් නැමදුම, අස්සවම උපවාසය, අස්සකාත් අසරණ දන යනාදී චාරිත්‍රානුකූල ක්‍රියාවන්ය. මෙ වූ කලී, ඉබාදත් පිළිබඳ සීමිත අවබෝධයක් පමණි. එනම්, ඒ චාරිත්‍රානුකූල ඉබාදත් වනාහි ඉස්ලාමීය ඉබාදත් වල එක්තරා අංශයක් පමණි. ඉස්ලාමීය ඉබාදත් සම්බන්ධයෙන් යථෝක්ත පරම්පරානුගත අර්ථ කථනය සිදු කෙරෙන්නේ, ඒ චාරිත්‍රානුකූල ඉබාදත් වල, කෙනෙකු ගේ ජීවන කාර්‍යාවලියට අදාළ කරුණු සියල්ල ම අඩංගුවන බැවින්, සුබාවබෝධාත්මක විවරණයක් වශයෙනි. එකී විවරණයෙන් මෙබඳු යමකිසිවක්ද සඳහන් වෙ. ''කෙනෙකුගේ අභ්‍යන්තර හා බාහිර වශයෙන් වූ, අල්ලාහ්ගේ මනාපයට අදාළ සියලුම කථන හා ක්‍රියාවන් ඉබාදත් වේ.''

අන් ලෙසකින් පවසනවානම, අල්ලාහ්ගේ ප්‍රසාදයට ඉවහල් විය හැකි සෑම වචනයක්ම, ක්‍රියාවක්ම ඉබාදත් වේ. මෙහිලා චාරිත්‍රානුකූල ඉබාදත් මෙන් ම ඇදහිලි සමාජ සේවා සහ සහෝදර මිනිස් වර්ගයාගේ හිත සුව පිණිස වූ පෞද්ගලික කැපවීම සියල්ලද අඩංගු වේ.

ඉස්ලාම, පුද්ගලයෙකු ගැන සලකන්නේ සමස්තයක් වශයෙනි. මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාට අල් කුර්ආනය මගින් දැක්වූවාක් මෙන්, මිනිසා ගෙන් අල්ලාහ් කෙරේ සම්පූර්ණ කැපවීමක් අපේක්ෂා කෙරේ. ''පවසන්න (මුහම්මද්

නබිවරයාණෙනි!) මගේ නැමදුම, මගේ කැප කිරීම, මගේ ජීවිතය හා මගේ මරණය අල්ලාහ් සතුවේ. ඔහුට හවුල් කරුවෙකු නැත. මම අවනත වූවන් මුස්ලිම් වරුන් අතර සිටීමට අණ ලදිමි." මෙසේ අවනත වීමෙන් සිදුවන ස්වාභාවික ප්‍රතිඵලය වන්නේ, අල්ලාහ්ගේ උපදෙස් වලට අනුකූලව මිනිසාගේ සෑම ක්‍රියා කලාපයක්ම හැඩගැස්වීමයි. ඉස්ලාමීය ජීවන රටාවෙන් අපේක්ෂා කෙරෙන්නේ, සැදැහවතුන් ගේ ආගමික හා සෙසු සෑම ක්‍රියා කලාපයක්ම එහි ඉගැන්වීම් වලට අනුකූලව ආදර්ශවත් වීමයි. ආගම වූ කලී, බාහිර චාරිත්‍රානුකූල වතාවත් මගින් මිනිසා හා අල්ලාහ් අතර සම්බන්ධතා පවත්වා ගන්නා මාර්ගයක් පමණකැයි අදහස් කරනවුන්ට මෙය විමතියට කරුණක් වනු ඇත.

මිනිසුන් කෙරේ, අභ්‍යන්තර වශයෙන් බලපෑමක් සිදු කළ නොහැකි යාන්ත්‍රික වූ චාරිත්‍රානුකූල වතාවත් පිළිබඳව ඉස්ලාම වැඩි තැකීමක් නොකරයි. කිබ්ලාවෙහි දිශාව වෙනස් වීම සම්බන්ධයෙන් විවිධ මත පළවූ අවස්ථාවේ, ඉස්ලාමීය සැදැහවතුන් හා අසල්වැසියන් අමතා, අල් කුර්ආනයේ පාඨයකින් මෙසේ ප්‍රකාශ කෙරේ.

"පෙරදිගට හෝ බටහිරට ඔබගේ මුහුණ හැරවීම යහපතක් නොවේ. යහපත් ක්‍රියාව වන්නේ, අල්ලාහ්, කියාමත් දවස, මලක්වරුන්, ආගම හා නබිවරුන් කෙරේ විශ්වාසය පිහිටුවීමයි. අල්ලාහ් කෙරේ ස්නේහයෙන් ඥතීන්, අනාථයන් හා දිළින්දන් මඟීන් හා යාචකයන් යනාදීන්ට ස්වකීය වස්තුවෙන් විය පැහැදම් කිරීම, වහලුන් නිදහස් කරවීම අදාළවතාවත් කිරීම, සකාත් ගෙවීම, පොරොන්දු ඉටුකිරීම, දුක් පීඩා අවදානම් වලදී ඉවසිලිවන්ත වීම යනාදියයි. මෙවැන්නෝ සැදැහැවත්හුය. අල්ලාහ්ට බියැත්තෝය. ( 2 : 177 )

ඉහත සඳහන් කුර්ආන් පාඨයෙන් දැක්වෙන ක්‍රියාවන් ධාර්මික වේ. ඒවා ඉබාදත්වල එක්තරා අංශයක් පමණි. රසූලුල්ලාහ් (සල්) තුමා විසින්, ඉබාදත් වල පදනම ඊමාන් භක්තිය - වශයෙන් දක්වා ඇත. ඉබාදත් වල කොටස් හැටකි.(60) එහිලා ප්‍රධානතම ස්ථානය උසුලන්නේ අල්ලාහ් ගේ ඒ කීයත්වය පිළිබඳ භක්තියයි. එනම්, අල්ලාහ් හැර නැමටම තිසි සෙසු කිසිවක් හෝ කිසිවෙක් නැත. යන ඊමානයයි. ඉබාදත් හි අවසාන තැන ගන්නේ ජනයා ගමන්කරන මාවතක ඇති කටු කොහොල් බාධකාදිය ඉවත්කිරීමයි."

යහපත් රැකියාව - සම්‍යක් කර්මාන්ත ද ඉබාදත් ක්‍රමයක් බැව් ඉස්ලාමයෙන් සලකනු ලැබේ. "සන්ධ්‍යා යාමය වන විට, ස්වකීය වෘත්තිය නිසා විඩාපත්ව සිටින්නාගේ සියලු ම අකුශල් අල්ලාහ් විසින් කමා කරනු ලැබේ." යි රසූලුල්ලාහ් (සල්) තුමාණෝ පැවසූහ. ඥාන ගවේෂණය ද උසස්තම ඉබාදත් ගණයේ ලා සැලකේ." දැනුම

සෙවීම, සෑම මුස්ලිම්වරයෙකු කෙරෙහි ම පැවරී ඇති ආගමික වගකීමකි.''තවත් අවස්ථාවක එතුමාණෝ මෙසේ සඳහන් කළහ. ''සැත්තෑ වසරක් මුළුල්ලේ සලාත්හි යෙදෙනවාට වඩා පැයක කාලයක් තුළ දැනුම සෙවීම උසස් වේ.'' අල්ලාහ්ගේ නාමයෙන් සමාජ සේවා කටයුතුවල හා සාමූහික ක්‍රියාවල නිරත වීම වතාවත්හි අංගයක් වෙතියි රසූලුල්ලාහ් (සල්) තුමාණෝ දක්වති. ''සිනහමුසු මුහුනින් යුතුව ඔබගේ මිත්‍රයා පිළිගැනීමද 'සදකා' හෙවත් දානයකි. කෙනෙකුගේ සැහැල්ලුව ඔසවා ඔහුගේ සතාගේ පිටට පැටවීමෙහිලා උපකාර වීමද දානයකි. අසල් වැසියාගේ භාජනයකට වතුර පුරවා දීමද දානයකි.''

ස්වකීය වගකීම නිසි සේ ඉටුකිරීමද ඉබාදත් ක්‍රමයක් වේ. පවුලේ සාමාජිකයන් වෙනුවෙන් කරන ඕනෑම වියහියදමක් දානයක් වශයෙන් රසූලුල්ලාහ් (සල්) තුමාණෝ දක්වති. එකී වස්තුව නීත්‍යානුකූලව උපයා ඇත්නම්, ඔහුට සම්මාන පිරිනැමෙන්නේය. පවුලේ සමාජිකයන් කෙරේ කාරුණික වීම ද ඉබාදත් ක්‍රමයක් වේ. සිය භාර්යාවගේ මුව තුලට කෑම පිඩක් දැමීමද එබඳු කරුණාවකැයි රසූලුල්ලාහ් (සල්) තුමා නිදසුන් දක්වති.

එපමණක් නොවේ. රසූලුල්ලාහ් (සල්) තුමාගේ අනුශාසනාවන්ට බඳී, විනෝදශ්වාදය පිණිස කරන සියලුම ක්‍රියා ඉබාදත් වේ. එතුමාණෝ තම සහාභාවරුන් අමතා, ඔවුනොවුන් තමතමන්ගේ භාර්යාවන් සමග සංසර්ගයේ යෙදීමද ඔවුන්ගේ ඉබාදත් ගණයට වැටෙන බවත්, ඒ සඳහා ඔවුන්ට සම්මාන හිමිවන බවත් පැවසූහ. මෙහිදී මවිතයට පත් සහාභාවරු '' අපි අතිශයින් ආශ්වාදය ලබන්නා වූ ක්‍රියාවකට සම්මාන හිමිවන්නේ කෙසේ දැයි විමසූ''හ. එකල රසූලුල්ලාහ් (සල්) තුමා, ''ඔබ ඔබේ ආශාවන් නීති විරෝධී ලෙස සංතර්පනය කරගනිතැයි සිතන්න. ඒ සඳහා ඔබට දඬුවම් විඳීමට සිදුවනවා නොවේද''යි. සහාභාවරුන්ගෙන් විමසූහ. ''සැබෑ'' යැයි පිළිතුරු ලැබුණෙන්, එතුමා, ''එනිසා එය නීත්‍යානුකූල ලෙස ඔබගේ භාර්යාව සමග සංතර්පනය කරගත්තේ නම් සම්මාන ලැබෙන්නේය''යි පිළිතුරු දුන්හ. මෙයද ඉබාදත් ක්‍රමයක් බව, එහි අදහස වේ.

මෙසේ ලිංගිකාශ්වාදය අපවිත්‍ර වූවකැයි ඉස්ලාමයෙන් නොසැලකේ. එය අපවිත්‍ර හා පාපයක් වන්නේ, විවාහ ජීවිතයෙන් පරිබාහිරව සංතර්පනය කරගන්නා විට පමණි.

ඉහත සදහන් කරුණු වලින් පැහැදිලිව ප්‍රත්‍යක්‍ෂ වන්නක් නම්, කෙනෙකුගේ ජීවිතය හා සම්බන්ධ සෑම ක්‍රියා කටයුත්තක්ම ඉස්ලාමීය ඉබාදත් වලට ඇතුලත් වන බවයි. ඉස්ලාමහි සවි සංයුක්ත ජීවන රටාවට, සැබැවින්ම මෙය එකඟ වේ. මිනිස් ජීවිතයක පෞද්ගලික, සාමාජික ආර්ථික, දේශපාලනික හා ආධ්‍යාත්මික වශයෙන් වූ සෑම

ක්ෂේත්‍රයක්ම මෙ මගින් ආවරණය වේ. මිනිස් ජීවිතයක අල්පමාත්‍ර විෂයයන් හි දී වුවද, ඉස්ලාම් මගින් ම පෙන්වනු ලබන්නේ එබැවිනි. නිශ්චිත විෂයයෙහිලා එකී මාර්ගෝපදේශය පිළිපැදීම, ඉස්ලාමීය උපදෙස් පිළිපැදීමක් වශයෙන් සැලකේ. තමාගේ සෑම කටයුත්තක්ම අල්ලාහ් ගේ අවධානය ලක්වී ඇතැයි යන වැටහීම මිනිසා තුළ ජනිත වූකල, ඔහුට ඉමහත් ධෛර්යයක් දැනේ. මෙ නිසා තනි වී සිටියත්, නිරීක්ෂකයන් යටතේ වුවත්, ස්වකීය ක්‍රියාවන් මගින්, නිරන්තරයෙන්ම අල්ලාහ්ගේ ප්‍රසාදය පැතීමටත්, හැකි පමණින් උසස් තම ආකාරයෙන් එකී කාර්යයන් ඉටුකිරීමටත් ඔහු පෙළෙඹෙනු ඇත. 'නිත්‍ය නිරීක්ෂකයෙක් සිටී. ඔහු සියල්ල දකියි. ඒ අල්ලාහ්ය.

චාරිත්‍රානුකූල නොවන, ඉබාදත් සම්බන්ධයෙන් සාකච්ඡා කරන කල, චාරිත්‍රානුකූල ඉබාදත් වල වැදගත් කම සුළුකොට තැකීමක් නොකෙරේ. සත්තකින්ම, සිතට එකඟව පුරන්නාවූ චාරිත්‍රානුකූල වතාවත් නිසා මිනිසාගේ සදාචාරාත්මක හා අධ්‍යාත්මික තත්වය උසස් වේ. ඒ හේතුවෙන්, ජීවිතයේ සෑම අංශයක් ක්ෂේත්‍රයක් තුලදී ම, ඔහු අල්ලාහ්ගේ මග පෙන්වීම් වලට බැඳී ක්‍රියා කරනු ඇත. චාරිත්‍රානුකූල ඉබාදත් අතරින් අස්සලාත් (නැමදුම) හේතු දෙකක් නිසා ප්‍රමුඛස්ථානය ගනී. පළමුව, එය මුස්ලිම් වරයෙකුගේ අනන්‍යතාවය දක්වන සංකේතයකි. දෙවනුව, දිනකට පස් වතාවක්, අල්ලාහ් හා ඍජු හමුවක් සලසා ගැනීම, නොකඩවා යළි යළිත් සම්බන්ධතාවය නැවුම් කර ගැනීම, 'ඔබට පමණක් නමදිමු, ඔබෙන් පමණක් පිහිට පතමු, අප යහමගෙහි යොමු කරන්නයි' පුනපුනා ආයාචනා කිරීමත් නිසා සැදැහැවතෙකු පවට හා වරදට යොමුවීම වලකී. ඇත්තෙන්ම භක්තියේ ප්‍රථම ප්‍රායෝගික අවශ්‍යතාවය වන්නේ අස්සලාත්ය. සැදැහැවතුන්ගේ ජයග්‍රහණයට ආදළ වූ, මූලික වැදගත් කොන්දේසිය වන්නේ ද එයයි. ''තම සලාත්හි තිසි ලෙස නිරත වන්නා වූ මු'මින් වරු සත්තකින්ම ජයග්‍රාහකයෝය.'' (අල්කුර්ආනය 23:1-2).

මෙ අදහසම රසූලුල්ලාහ් (සල්) තුමාණෝ වෙනත්ක්‍රමයකින් අවධාරණය කරති. ''මහත් සැලකිල්ලෙන් හා වේලාව නොවරදවා, සලාත් හි නිරත වන්නන්ට එය ආලෝකයක් වී, තම භක්තිය සනාථ කිරීමේ සාක්ෂියක්ද, කියාමත්ද (විනිශ්චය දිනය) ගැලවීම පිණිස වූ හේතුවක්ද වන්නේය.''

අස්සලාත් වලට අනතුරුව අස්සකාත් ඉස්ලාමහි වැදගත් ස්ථම්භකයක් වේ. අල් කුර්ආනය බොහෝ තැන්හි සලාත්හා සකාත් ළඟ ළඟින් ම සඳහන් කෙරේ. සලාත් මෙන් සකාත් මගින්ද, විශ්වයේ සෑම සංස්කාරයකම එකම හිමිකරු අල්ලාහ් බවත්, මිනිසුන් විසින් පරිහරණය කෙරෙන්නා වූ සියල්ලක්ම අල්ලාහ්ගේ මනාපයට අනුව වැය කරනු පිණිස පවරා දෙන ලද දේ බවත් සනාථ කරවන්නා වූ, භක්තියේ වැදගත් ලක්ෂණයකි.

"අල්ලාහ් සහ ඔහුගේ නබිවරයා ( මුහම්මද් ( සල් ) ) කෙරේ විශ්වාසය පිහිටුවන්න. ඔබ ගේ භාරකාරත්වයට පත්කර ඇති දෙයින් වියදම් කරන්න." (57:7)

මේ අනුව සකාත් ද සලාත් මෙන්ම මු'මින් වරුන් අල්ලාහ්ට සමීපවත් කරන්නා වූ සැදැහැවත් ක්‍රියාවකි.

මේ හැර සකාත් මගින් අපේක්ෂා කරන්නේ පංති හා කණ්ඩායම් අතර භවභෝග සම්පත් හා දුප්පත් පොහොසත් සම්බන්ධයෙන් පවත්නා පරතරය ලිහිල් කරවීමයි. සමාජ ස්ථාවරත්වය උදෙසා, මෙමගින් විශාල මෙහෙයක් ඉටුවේ. ධනවතුන්ගේ සිතින් ආත්මාර්ථකාමීත්වය ත්, දිළින්දන්ගේ සිතින් සමාජ විරෝධී ඊර්ෂ්‍යා ක්‍රෝධයත් තුරන් කරමින්, පංති භේදයට තුඩුදෙන්නා වූ හේතු සාධක ඉවත් කෙරේ. එක්සත්ව හා එක්සිත්ව පෙරට යා හැකි වේ. මේ ස්ථාවරත්වය සථාපනය වන්නේ හුදෙක් ධනවතුන් ගේ පෞද්ගලික අදහස් මත පිහිටා නොවේ. ධනවතුන් සකාත් දීම ප්‍රතික්ෂේප කළේ නම්, අවශ්‍යතාවය අනුව, එය බලයෙන් හෝ පවරා ගැනීමේ හැකියාව මත අස්සකාත් වගකීම ස්ථාවරව ස්ථාපනය වී ඇත. අස්සවම් ( රමළාන් මාසයේ දිවාභාගයේ උපවාසයෙහි යෙදීම) ඉස්ලාම් හි තවත් ස්ථම්භකයක් වේ. මෙකී උපවාසය නිසා මුස්ලිම් වරු අභ්‍යන්තර වශයෙන් පිවිතුරු වෙති. සෙසු ෂරීආත් ( ආගමික නීති රීති) වන්ගෙන් සිදුවන්නේ බාහිර පවිත්‍රතාවයයි. අභ්‍යන්තර පවිත්‍රතාවයෙන්, ඔහුට නිවැරදි හා යහපත් දෙයට නැඹුරු වීමටත්, වැරදි හා අයහපත් දෙයින් ඈත් වීමටත් පුළුවන. කුර් ආනයේ සඳහන් වන පාඨයෙන් අපට වටහා ගත හැක්කේ මෙයයි. "මූ'මින් වරුනි, ඔබට පෙරාතුව විසූවන්ට මෙන්ම පවිත්‍ර තාවය අත්කර ගනු පිණිස ඔබටත් උපවාසය පවරා ඇත." (2:183)

රසූලුල්ලාහ් ( සල්) තුමාණෝ මෙසේ දක්වති. "මා ( අල්ලාහ්) වෙනුවෙන් ආහාර පාන හා ලිංගික ආශාවන් කලකට නතර කරතියි අල්ලාහ් පවසයි" මේ අනුව, අල්ලාහ්ගෙන් ලබන සම්මාන අසීමිත වන්නේය.

මුළු මහත් සමාජයම එක ම වකවානුවක් තුල සාමූහිකව නිරත වන බැවින්, උපවාසය නිසා පුද්ගල සිත් සතන් පිබිදේ, සෑම පුද්ගලයකු තුලම නව ජීවයක් පිවිසේ. තවද උපවාසය හේතුවෙන්, මසක් මුළුල්ලේ ම ශරීර යන්ත්‍රයට අනිවාර්ය විවේකයක් ලැබේ. එමෙන් ම පීඩිත ජනතාවට දිවිහිමියෙන් විඳින දුක ( හා ඔවුන් ගේ අවශ්‍යතා) වටහා ගැනීමටද මගක් සැලසේ. සෙසු අභාග්‍යවත් සහෝදර මුස්ලිම් වරුන්ගේ දුක අවබෝධ කර ගැනීමටත් ඔවුන් කෙරෙහි කරුණා දයාව උපදවා ගැන්මටත් උපවාසය ඉවහල් වේ.

අවසාන වශයෙන් අල්හජ් මක්කාවට යන වන්දනා ගමන ගැන සලකා බලමු.

ඉස්ලාමහි මෙකී වැදගත් ස්ථම්භකය වූ කලී, විවිධ භේද දුරලා, මුස්ලිම් වරුන් එකම ඒකකයක් වශයෙන් එක්සත් කරන්නකි. ලෝකයේ නන් දෙසින් සංක්‍රමණය වන මුස්ලිම් වරු, එක සමාන වස්ත්‍රයෙන් සැරසී, එකම හඬකින් හා භාෂාවකින් 'ලබ්බයික් - අල්ලාහුම්ම ලබ්බයික්' (මෙන්න යා අල්ලාහ්, මම ඔබේ සේවය පිණිස පැමිණියෙමි) යි රාවදෙති. හජ් මෙහෙයයේ දී, බලගතු ආත්ම සංයමයක් හා ආත්ම දමනයක් විද්‍යමාන වේ. එහි දී පූජනීය වස්තූන් පමණක් නොව, පක්ෂීන්, පැලෑටින් ට පවා හානියක් නොකළ යුතු බැවින්, ඒවා සුරක්ෂිත ව පවතී.'' තවද අල්ලාහ් ගේ පූජනීය වස්තූන්ට පමණක් නොව, පක්ෂීන්, පැලෑටින් ට පවා හානියක් නොකළ යුතු බැවින්, ඒවා සුරක්ෂිත ව පවතී.'' තවද අල්ලාහ්ගේ පූජනීය වස්තූන්ට ගරුසරු කරන්නා - ඔහු ට අල්ලාහ් හා සිටීම වඩාත් වටී.'' (22:30)

හජ් වන්දනා ගමන මගින්, සමස්ත මුස්ලිම් ලෝකයේ සෑම කාණ්ඩයකටම, පංතියකටම, සංවිධානයකටම හා රජයකටම අවුරුදු පතා දැවැන්ත සම්මේලනයකට සහභාගි වීමේ අවස්ථාව උදාවේ. මේ මහා සම්මේලනය පවත්වනු ලබන ස්ථානය, කාලය, ඔවුන්ගේ අල්ලාහ් විසින් නිශ්චය කෙරේ. එය වළක්වාලීමට කිසිවෙකුට බලයක් නැත. මෙයට සහභාගි වන සෑම මුස්ලිම් වරයකුටම- ඔවුන් එය කඩ නොකරන තාක්- අවශ්‍ය සම්පූර්ණ ආරක්ෂාව හා නිදහස අල්ලාහ් විසින් සහතික කෙරේ. මෙසේ චාරිත්‍රානුකූල හෝ චාරිත්‍රානුකූල නොවූ ඉස්ලාමීය වතාවත් මගින්, කෙනෙකුට ස්වකීය මැවුම් කාරයා කෙරේ සෙනෙහස ජනිත කරවීමටත්, මානව සංහතියේ සියලුම දෙස් දෙමනස් හිංසාවන් දුරුකිරීමෙහිලා අධිෂ්ඨාන බලයත්, ආත්ම ශක්තියක් හා උට්ඨාන වීර්යයක් ඇති කොට, ලොව පුරා අල්ලාහ්ගේ වදන් වල ආධිපත්‍යය තහවුරු කරවීමටත් පුහුණුවක් දෙනු ලැබේ.

# 9

# ඉස්ලාමහි ඒකදේවවාදය

දෙවියන් වහන්සේ හෝ ඇතැම් විට සුළු දෙවිවරුන් හඳුන්වණු පිණිස, සෑම භාෂාවකින්ම කිසියම් පදයක් හෝ පද කිහිපයක් භාවිතා කෙරේ. අල්ලාහ් සම්බන්ධයෙන් එසේ නොවේ. අල්ලාහ් යනු එකම සැබෑ දෙවිකෙනෙකුගේ අන්වර්ථ නාමයයි. අල්ලාහ් යන පදය සෙසු කිසිවක් සඳහා යෙදිය හැකි නොවේ. මෙයට බහු වාචික පදයක් හෝ ලිංග භේදයක් හෝ නැත. මේ පදයෙන් අල්ලාහ් ගේ අනුපමේය භාවය හුවා දැක්වේ. දෙවියන් (God) යන පදයට දේවිවරුන් (Gods) යන බහුවචනයක්ද, දේවතාවිය (Goddess) යන ස්ත්‍රී ලිංග පදයක්ද ඇත. යේසුස් වහන්සේගේ භාෂාව වූයේ අරාමික් Aramaic භාෂාවයි. ඇත්තෙන්ම, අරාබි භාෂාවේ සහෝදර අරාමික් භාෂාවෙන්ද දෙවියන් වහන්සේ යන්න (God) හඳුන්වනු ලැබුණේ අල්ලාහ් යනුවෙනි.

ඉස්ලාම් හී ව්‍යවහාර වන්නාක් මෙන්, එකම සැබෑ දේවියන් වහන්සේ අනුපමේය, අසම සම වූවකි. මුස්ලිම්වරයෙකුට අල්ලාහ්, විශ්වයේ සර්ව බලධාරියෘ මැවුම්කාරයාය; ආරක්ෂකයාය; පෝෂකයාය; ඔහු කිසිවකට සම නැත; ඔහුට කිසිවක් සම නැත. තත්කාල දනෝ, මුහම්මද් (සල්) තුමාගෙන්, අල්ලාහ් ගැන විමසූහ. අල්ලාහ් විසින්ම අදාළ පිළිතුර- කුර් ආනීය වදනක් වශයෙන් - සපයන ලදී. එය ඒකියත්වයේ හරය හෝ ඒක දේව වාදයේ හරය වශයෙන් සැලකේ. එය අල්කුර්ආනයේ 112 පරිච්ඡේදයේ මෙසේ සඳහන් වේ.

"අති කාරුණික හා පරම දයාබර වූ අල්ලාහ් ගේ නාමයෙන් පවසන්න. (මුහම්මද්

නබිවරයාණෙනි!) ඔහු අල්ලාහ්ය. එකම අල්ලාහ්ය. සදාකාලික. ආරක්ෂකයාය. ඔහුට උපතක් නැත. ඔහු උපදවන්නේද නැත. ඔහුට සමවූ කිසිවෙක් නැත."

ඉස්ලාමහි, අල්ලාහ් තද පරුෂ කෲර දෙවියකු වශයෙන්ද, තමන් කෙරේ සම්පූර්ණ අවනත භාවය අපේක්ෂා කරන්නෙකු වශයෙන් ද ඇතැම් නොමුස්ලිම්වරු පවසති. ඔහු කරුණික හෝ දයාබර නොවන්නෙකු වශයෙන් ඔවුහු දෙස් පවරති. මීට වඩා, සත්‍යයට පටහැනි වූ අභූත චෝදනාවක් වෙනත් නැත. අල් කුර්ආනයේ එකම එක් පරිච්ඡේදයක් හැර, සෙසු පරිච්ඡේද 113 ම ඇරඹෙන්නේ "අති කාරුණික හා පරම දයාබර වූ අල්ලාහ් ගේ නාමයෙන්" යනුවෙනි . ඒ තරම් දැනගත්තත් ප්‍රමාණවත් වේ. මුහම්මද් රසූලුල්ලාහ් (සල්) තුමාගේ එක්තරා හදීසයක (නබි වදනක)"දරුවෙකු කෙරෙහි මවක් දක්වන සෙනෙහසට වඩා අල්ලාහ් ගේ කරුණාව හා ස්නේහය වැඩිය" යි සඳහන් වේ.

නමුත්, අල්ලාහ් සාධාරනදවේ. ඒ නිසා දුෂ්ක්‍රියා හා අකුශල් පුරන්නන්ට අදාළ විපාකයද, සිල්වතුන්ට අදාළ සම්මානද ඔහු ගෙන් දයාව සම්බන්ධ පරම ගුණාංගයද, සාධාරණත්වය පිළිබඳ පරම ගුණාංගයෙහිලා පැහැදිලිව ප්‍රත්‍යක්ෂ වේ. අල්ලාහ් වෙනුවෙන් දිවිහිමියෙන් කැප වී දුක් පීඩා විඳින වුන්ද, දිවිහිමියෙන් ජනතාව තලා පෙළා හිංසා කරන්නා වූ හා සෙස්සන් සූරා කන්නා වූ අයද, ඔවුන්ගේ ස්වාමියාගෙන් එක සමාන ඵල විපාක ලැබිය යුතු නොවේ. එසේ සමාන ප්‍රතිඵල අපේක්ෂාකිරීම වනාහී, මරණින් මතු ජීවිතයද, මෙලෝ වශයෙන් සදචාරාත්මක සිල්වත් ජීවිතයක් ගත කළයුතු යන සත් ක්‍රියාවද පිටුදැකීමක් වන්නේය. මේ සම්බන්ධයෙන්, යට සඳහන් කුර්ආනිය පාඨය ඉතා පැවහැදිලියැ සෘජුය.

ඇත්තෙන්ම, සිල්වතුන්ට ඔවුන්ගේ ස්වාමියා හමුවේ සතුට උතුරන උයනක් ඇත. එවිට සැදැවතුන්ට ද අපි පාපීන්ට මෙන් සලකන්නෙමු ද? ඔබට සිදුව ඇත්තේ කුමක්ද? ඔබ කෙසේ විනිශ්චය කරන්නේහුද? (කුර්ආනය 68:34-36)

අල්ලාහ්ට කිසිදු මානව චරිතයක් ආරෝපනය කිරීමේ ක්‍රියාව, ඉස්ලාම තරයේ හෙළා දකී. ඓශ්වර්ය්‍යය, ශක්තිය හා ජාතින් වශයෙන් හෝ කිසියම පිරිසකට, ජාතින්ට අනුග්‍රහ දක්වති'යි යන පදනමකින් රූප ඇඹීමේ ක්‍රියාවද, ඉස්ලාම හෙළා දකී. අල්ලාහ් විසින් මනුෂ්‍ය සත්වයා මවනු ලැබුවේ අංගසම්‍ය වශයෙනි. ඔවුහු තම තමන්ගේ අනන්‍යතාවය වෙත්කොට හදුනාගත යුතුය. අල්ලාහ්ගේ පිළිසරණ පැතිය යුත්තේ ශීලයෙ න් හා ශ්‍රද්ධාවෙන් පමණි.

ඉස්ලාමීය දෘෂ්ඨි කෝණයෙන් සලකා බලන කල, අල්ලාහ් ස්වකීය මැවීම් ක්‍රියාවලින් ඉක්බිති සත්වන දිනයෙහි විවේක ගත්තේයැයි හෝ ස්වකීය සෙබළෙකු සමඟ සටන්

කළේ යැයි හෝ දෙවියන් වහන්සේ මානව වර්ගයාට එරෙහිව කුමන්ත්‍රණය කළේ යැයි හෝ දෙවියන් වහන්සේ ඔතැම මනුෂ්‍යාත්මයක් ලබා පැමිණෙතියි යනාදි පිළිවෙත් තරයේ වැරදි සහගත වේ.

අල්ලාහ් යනුවෙන් ඔහුගේ අනුපමෙය අත්වර්ථ නාමයෙන්ම ව්‍යවහාර කරමින්, ඉස්ලාම් එහි පවිත්‍රත්වය ප්‍රත්‍යක්ෂ කරයි. එහි සාරධර්මය ද එය ම වේ. සෑම නබිවරයෙකුම නිවේදනය කළේ ද එයයි. මෙ නිසා, අල්ලාහ්ට සෙසු කිසි දිව්‍යමය වස්තුවක් හෝ පෞද්ගලිකත්වයක් ආරෝපනය කිරීම. ආදේශ කිරීම හෝ උපමා කිරීම, ඉස්ලාම් හි දරුණු පාපයක්වශයෙන් සලකනු ලැබේ. සෙසු කවර පාපයකට සමාව දෙතත්, අල්ලාහ් මෙවැන්නක් කිසිසේත් කමා නොකරන්නේය.

මැවුම් කාරයා, අවශේෂ මවන ලද වස්තූන්ට වඩා වෙනස් ස්භාවයක් දැරිය යුතුය. මවන ලද්ද වූ වස්තුවකට හෝ ස්භාවයකට සමවේනම් ඔහු ද අනිත්‍යය විය යුතුය. එවිට ඔහුගේ ද, නිර්මාතෘවරයෙකු සිටිය යුතුය. මෙයින් හැඟෙන්නේ ඔහු කිසිවකට සම නොවන වගයි. ඔහු තාවකාලික නොවේ නම් සදකාලික විය යුතුයි. අනිත්‍යය නොවේ නම් නිත්‍ය විය යුතුයි. ඔහු සදකාලික නම් ඔහුට කාරකයක් නැත. ඔහුගේ පැවැත්මට කාරකයෙකු නොවේ  නම් ඔහුගේ අනවරත පැවැත්මට ද බාහිර කාරක කිසිවක් නැත. එයින් හැඟෙන්නේ ඔහු ස්වයංපෝෂිත බවයි. නවද ඔහුගේ පැවැත්ම පිණිස ඔහු කිසිදු ආධාරකයක් මත රැඳී නැත්නම්, එකල ඔහුගේ පැවැත්මට නිමක් නැත. ඒ අනුව මැවුම්කාරයා, සනාතනය : සදකාලිකයා: නිත්‍යය. ආරම්භය ඔහුය. අවසානයද ඔහු මය.

ඔහු සවයං පෝෂිතය, නොහොත් ස්වයංරක්ෂිතය. කුර්ආනීය පදයකින් පවසතොත්, ඔහු "අල් බයියූම්"ය. මැවුම්කාරයා, ස්වකීය මැවීම් හුදු පැවැත්ම සඳහා පමණක් මවන්නේ නැත. ඔහු ඔවුන් රක්ෂා කරයි. ඔවුන්ගේ පැවැත්ම සමාප්ත ද කරයි. මවන ලද සංස්කාරයන්ට කුමක් සිදුවෙතත්, ඊට සම්පූර්න හේතුසාධකය වන්නේ අල්ලාහ්ය.

සකල සංස්කාරයක ම නිර්මාතෘවරයා, අල්ලාහ්ය. ඔහු සකල සංස්කාරයකම ආරක්ෂකයාය, ආකාශ හා භූ තලයේ යතුරු හිමිවන්නේ ඔහුටය . අල්ලාහ් ගෙන් ආහාර පාන නොලැබෙනම, මහ පොළෝ තලය මත කිසිදු ජීවියකු ගැවසෙන්නේ නැත. ඒවායේ සෙවණ හා නිවහන් ගැන දැන සිටින්නේ ඔහුය.

## අල්ලාහ්ගේ පරම ගුණාංග

මැවුම්කාරයා සනාතන හා සදකාලික නම්, ඔහු ගේ පරම ගුනාංගද සනාථන හා

සදාකාලික විය යුතුය. ඔහුගේ කිසිදු පරම ගුනාංගයක් ගිලිහී යා නොහැකිය. පරම ගුණාංගයක් අලුතින් පිවිසියද නොහැකිය. මෙය මෙසේ නම්, ඔහුගේ පරම ගුණාංගය සවි සම්පූර්ණ වේ. මෙසේ, සවි සම්පූර්ණ පරම ගුනාංග සහිතව මැවුම් කරුවන් දෙදෙනකු සිටිය හැකිද? සවි සම්පූර්ණ බල සහිතව, මැවුම්කරුවන් දෙදෙනකු සිටිය හැකිද? මොහොතක් සිතා බැලුවත්, එබඳු දෙදෙනකුගේ පැවැත්මක් විය නොහැකි බව පැහැදිලි වේ. මෙකී තර්කය අල්කුර්ආනයෙන් ලුහුඩින් දක්වෙන්නේ මෙසේය. "අල්ලාහ් විසින් තමාට කියා පුතෙකු වද ගත්තේ නැත. ඔහු සමග සෙසු දෙවියෙක්ද නැත. එබඳු දෙවියන් වූයේනම්, ඔවුන් එකිනෙකා තමන් මැවූ දේ ආපසු ගන්නවා ඇත. තවද ඔවුන් එකිනෙකා සෙස්සන් අභිබවා සිටින්නට තැත් කරනු ඇත. අල්ලාහ් හැර, මහ පොළොව හා ආකාශයන්හි වෙනත් දෙවියන් සිටියේ නම්, මහපොලොව හා ආකාශ නිසැක වශයෙන්ම විනාශ වී යනු ඇත.

## අල්ලාහ්ගේ ඒකීය භාවය

සෙසු සුළු දෙවිවරුන්ගේ ව්‍යාජභාවය ගැන කුර්ආනය මෙසේ මෙනෙහිකරේ. "මිනිසා විසින් නිපදවන ලද වස්තූන්ට, වන්දනා මාන කරන්නන්ගෙන් මෙසේ විමසේ" ඔබ විසින්ම අභාගන්නා ලද වස්තූන්ට, ඔබ පුද සත්කාර කරන්නේහුද? ඔබ අල්ලාහ් හැර දමා, ආත්මාරක්ෂාව පවා සලසා ගත නොහැකි මේවා ඔබේ ආරක්ෂකයින් වශයෙන් තෝරා ගත්තේහුද?

ආකාශ වස්තූන්ට, පුදසත්කාරයෙහි යෙදෙනවුන් වෙනුවෙන්, අල්කුර්ආනයේ ඉබ්‍රාහිම් නබි- අලෛ හිස්සලාම් තුමන් පිළිබඳ පුවතක් මෙනෙහි කැරවේ.

හාත්පසින්ම අන්ධකාරය- රාත්‍රිය- වෙළාගත්විට තාරකාවන් දුටු ඔහු මෙසේ කීය. "මේ මගේ ස්වාමියා" එහෙත් එය බැස ගිය විට "මම බැසයන්නන් අප්‍රිය කරමි" යි කිවේය. චන්ද්‍රයා පායනු දුටු විට "මේ මගේ ස්වාමියාය"යි කීය. එහෙත් සඳ බැසයනවිට මෙසේ කිවේය. 'මගේ ස්වාමියා මට(යහ) මග නොපෙන්වන්නේනම්, මම නිසැක වශයෙන්ම නොමග ගියවුන් රැලට වැටෙන්නෙමි'. ඉර පායා එනු දුටු විට ඔහු මෙසේ කිවේය. 'මේ මගේ ස්වාමියාය මෙය වඩාත් ශ්‍රේෂ්ඨය' එහෙත් එය බැස ගිය විට, ඔහු මෙසේ කිවේය. " අනේ මගේ ජනයිනි, ඔබ විසින් ආදේශ කෙරෙන දේ මම ඉවත් කරමි. ආකාශයන් හා මහ පොලොව මැවූ ඔහු දෙසට හැරෙමි. පිවිතුරු බැතිමතෙකු වී ප්‍රතිමා වන්දකයෙක් නොවෙමි".

## ශ්‍රද්ධාවන්තයින්ගේ තත්ත්වය

මුස්ලිම්වරයකු බවට පත්වීම්- එනම් අල්ලාහ්ට අවනතවීම පිණිස අල්ලාහ් එකම මැවුම්කාරයාය. රක්ෂාවරණය සලසන්නාය, පෝෂකයාය යන ඈ ලෙසින් ඔහුගේ ඒකීයත්වය පිළිගත යුතුය. එහෙත් තව්හිද්-ආර්-රුබූබිය්යා සලසා ගනු පිණිස තව්හිද්- අල් උලූහිය්යාද් අවශ්‍යය. එනම් පිදුමට සුදුසු වන්නේ අල්ලාහ් පමණක් බව අදහමින් සෙසු ජීවීන්ට හෝ වස්තූන්ට පුදසත්කාර කිරීමේ ක්‍රියාවෙන්ද වැළකිය යුතුය.

එකම සැබෑ අල්ලාහ් පිළිබඳ මෙකී දැනුම අත්කර ගෙන ඔහු කෙරේ නිරන්තරයෙන්ම විශ්වාසය තහවුරු කරගත යුතුය. එකී සත්‍යය පිටුදැක්ම පිණිස කෙරෙන කිසිදු පෙළෙඹවීමකට ඉඩ නොහල යුතුය.

කෙනෙකුගේ සිතට මෙකී භක්තිය පිවිසිවිට,එමගින් කිසියම් මානසික විපර්යාසයක් සිදුවේ. ක්‍රියා කලාපයන්හි වෙනසක්ද ඇති වේ. මේ චෛතසික හා ක්‍රියාත්මක වෙනස යාවූ කල එමගින් සැබෑ භක්තිය සනාථ වේ. රසූලුල්ලාහ් (සල්)තුමා 'භක්තිය වූ කලී සිතෙහි අවධාරණය වී, ක්‍රියාවන් පිළිබිඹුවන්නේකි'' යි වදාළහ. අල්ලාහ් පිළිබඳ කෘතඥතා පූර්වක හැඟීම ඉබාදත්- වන්දනාවත්- හි සාරය වේ.

මේ කෘතඥතා පූර්වක හැඟීම අතිශයින් වැදගත් වේ. එය නොඅදහන්නෝ කාෆිර් වශයෙන් හඳුන්වනු ලබත්. ''සත්‍යය පිටුදකින්නා''යනු එහි අදහසයි. 'ගුණමකු තැනැත්තා' යන්නද එයින් හැඟවේ.

තමාට අත්වී ඇති ආශිර්වාදයන් නිමිත්තෙන් මුවින් - සැබෑ අදහන්නා - අල්ලාහ්ට සොහොස දක්වයි.කෘතඥතා පූර්වකද වෙයි. නමුත්, මානසික හා කායික වශයෙන් ඔහු කුශල් පිරවද එලෝ හෝ මෙලෝ වශයෙන් තමා, අල්ලාහ්ගේ අඩුවමට ලක්වෙතියි යන වකිතය, ඔහු තුළ නිරතුරුව ම පවතී. එමනිසා ඔහු අල්ලාහ්ට බියවෙයි, ඔහුට කැපවෙයි. අතිශය බැගෑපත් විලසින් අල්ලාහ් වෙනුවෙන් සේවය කරයි. සෑම අවස්ථාවකම, සෑම මොහොතකම, අල්ලාහ් පිළිබඳ සිහිය නොපවතී නම්, මෙබඳු මානසික පසුතලයක් ඇති නොවේ. මෙනෙයින්, අල්ලාහ් පිළිබඳ නිරන්තර මතකය, ජීවන බලවේගය බවට පත්වෙයි.

අල්ලාහ්ගේ පරම ගුණාංගයන්, පුන පුනා වැණීමෙන්, මෙකී කෘතඥතා පූර්වක හැඟීම ප්‍රගුණ කරවනු පිණිස අල්කුර්ආනයෙන් වෙර දරනු ලැබේ. පහත සදහන් පාඨයෙන්, යථෝක්ත පරම ගුණාංගයන් එකම වර දැක්වීමට තැත් කෙරේ.

''ඔහු අල්ලාහ්ය, ඔහු හැර සෙසු දෙවියකු නැත. අදෘශ්‍යමාන හා නුදුටු දේ ගැන

දත්තේය. සියලු කරුණාවෙන් හා දයාවෙන් යුක්තය. ඔහු අල්ලාහ්ය. ඔහු හැර සෙසු දෙවියෙක් නැත. ඔහු පරම අධිරාජ්‍යයාය; සර්ව පූජනීයය; ශාන්තියය; භක්තියේ රක්ෂකයාය; සර්ව ආරක්ෂකයාය; සර්වබලධාරීය; සර්ව බලවේගකාරීය; සර්ව ශ්‍රේෂ්ඨත්වය; හවුල්කාරීය; සර්ව බලවේගකාරීය; සර්ව ශ්‍රේෂ්ඨත්වය හවුල්කරුවන් ඇතිකරනවුන්ට එරෙහිව ඔහුට පැසසුම්! ඔහු අල්ලාහ්ය. මැවුම්කාරයාය; නිෂ්පාදකයාය; නිමාව සලසන්නාය; අති රමණීය නාම ඔහුට හිමිවේ. ආකාශ හා පොළෝතලය මත සෑම වස්තුවක් විසින්ම ඔහු සම්මානනීය කෙරේ. ඔහු සර්ව බලධාරීය; සර්වඥතා ඥානීය. (අල්කුර්ආනය 59: 22-24)

"ඔහු හැර සෙසු දෙවියෙක් නැත. ඔහු ජීවමානීය; සදාකාලිකය, ඔහුට නිදිමතය නොදැනේ. ඔහු නිදන්නේද නැත. ආකාශ හා මහ පොළොව මත සකල සංස්කාරයම ඔහු සතුය. ඔහුගේ කටයුතුවලට (ඔහුම හැර) හරස්විය හැක්කේ කාටද? මිනිසුන්ගේ අබියස-වත්මන්හි සිදුවන දේත්, ඔවුන්ගෙන් පසු අනාගතයේ සිදුවන දේත් ඔහු දනී. මිනිසුන් තේරුම ගන්නේ ඔහුගේ මනාපයට අදාළ වූ කොටස පමණි. ඔහුගේ දිව්‍යාසනය ආකාශ හා මහ පොළොව තරම විශාලය. ඒවා ආරක්ෂාකිරීමෙහිලා ඔහු විඩාපත් නොවේ. ඔහු පරමෝත්තම වේ.උත්කෘෂ්ඨ වේ."(අල්කුර්ආනය 2: 255)

"පොත හිමි මිනිසුනි, (ඔබ) ඔබේ ධර්මයේ සීමාවන් ඉක්මවා නොයන්න. අල්ලාහ් සම්බන්ධයෙන් සත්‍යය හැර, අන් කිසිවක් නොතෙපලන්න. මර්යම ගේ මසීහ් (Jesus) අල්ලාහ්ගේ දූතයකු පමණි. ඔහු මසීහ් මර්යම්ට පැවසූ දේ ඔහුගේ සාරයෙන් ලැබුණකි. එනිසා, අල්ලාහ් සහ ඔහුගේ නබි වරුන් අදහන්න. තවද 'තුනක්' යි නොකියන්න. වළකින්න. එය ඔබට වඩාත් හොඳ වේ. අල්ලාහ් එකම අල්ලාහ්ය. සියලු පැසසුම ඔහුටය. තමාට දවා පුතෙකු ඇතැයි යන මතය ඔහු හෙළා දකී." (අල්කුර්ආන් 4: 171)

# 10

# ඉස්ලාම්හි මානව අයිතිවාසිකම්

සමස්ත මනුෂ්‍ය වර්ගයාගේ සහ විශ්වත් මණ්ඩලයේ අසහාය ස්වාමියාද, ඒ සියල්ලකම ආරක්ෂක, පෝෂක හා ස්වාමියා අල්ලාහ් වන කල ඔහු විසින් මවන ලද සෑම මිනිසෙකුම සමානය. ඔහු සවිසතට මෙන් වඩයි. ඔහුගේ දයා මහිමයෙන් ජීවිත් හටගති. පොදුවේ සෑම මිනිසෙකුටම පෞරුෂත්වය හා ගුරුත්වය පිරිනමා ඇත. ස්වකීය සාරයෙන් ප්‍රාණය පිඹ ඇත. එනම්, ඔහු අබියස, සෑම මිනිසකුම සමස්ථයකි. මිනිසුන්ගේ පෞද්ගලික ගුණාංග හැර සංස්කාරයන් වශයෙන් කවරුත් එක සමානය. කුලය, ජාතිය, දේශය, වර්ණය වශයෙන් ඔවුනොවුන්ගේ ආයාශයෙන් පිහිටුවාගත් භේදයක් විනා, අල්ලාහ්ගේ මැවීම සම්බන්ධයෙන් කිසිදු භේදයක් නැත. මේ අනුව සෑම මිනිසෙකුම එකිනෙකා, අනෙකාට අයත්වෙයි. සෑම මිනිසෙකු ම ආත්ම ගරුත්වයෙන් හා හිතාදර ස්වාමියා වෙනුවෙන් හිතැහි කැපවීමක් සහිතව එක ම සහෝදර සාමාජයකට අයත් වෙති. මෙබඳු ප්‍රසන්න පරිසරයක් තුළ අල්ලාහ් ගේ ඒකීයත්වය පිළිබඳ පිළිවෙත බලගතු ලෙස කේන්ද්‍රගත වේ. මානව සංහතියද, මානව සහෝදරත්වයද ඒ හා සමාන බව අවධාරනය කෙරේ.

පෘථිවිය මත කවර තැනක වුවද ඉස්ලාමීය රජයක් ස්ථාපනය වී ඇතිවිට, එයට භෞමික වශයෙන් ප්‍රාන්ත සීමාවන් පිහිටුවා මානව නිදහස මර්දනය කිරීමට ඉස්ලාම් නොපෙළඹේ. ඉස්ලාම් මගින්, මානව සංහතිය උදෙසා ඇතැම් පොදු මූලික අයිතිවාසිකම් කිහිපයක් ඉදිරිපත් කෙරේ. ඉස්ලාම් රජයක බල ප්‍රදේශය තුල හෝ පිටත කවර තැනක වාසය කළත්, රජයක් සමග සාමයෙන් පසුවෙතත්, සංග්‍රාමයක පැටලී සිටියත්, සෑම අවස්ථාවකදීම එකී අයිතිවාසිකම්වලට ගරු කළ යුතුය. ඒවා පිළිපැදිය යුතුය. මෙය අල්කුර්ආනයේ ඉතා පැහැදිලිව විග්‍රහ කෙරේ.

"මුඃමින් වරුනි, ඔබ අල්ලාහ් ට යුතුකම් ඉටු කරන්නේකු වන්න. යුක්ති ගරුක ලෙස සාක්ෂි කියන්න. සෙස්සන් කෙරේ ඔබට ඇති වෛරය නිසා යුක්තියෙන්

ඉවත්වන්නෙකු නොවන්න. සාධාරණ වන්න. එය අල්ලාහ් කෙරේ බියැත්තෙකු ගේ තත්වය ට ඔබ සමීපවත් කරයි.'' (අල්කුර්ආනය 5:8)

මනුෂ්‍ය රුධිරය පවිත්‍ර වස්තුවක් ලෙස ආරක්ෂා කෙරේ. එය අසාධාරණ අන්දමින් සෙලවිය නොහැකිය. මනුෂ්‍ය රුධිරයට පිරිනමා ඇති මෙ පූජ්‍ය භාවය උල්ලංඝනය කරමින්, යමෙකු අන් කිසිවෙකු ඝාතනය කළේ නම්, එය මුළු මාන ව සංහතිය ම ඝාතනය කළා හා සමාන වේ. රුධිර වත්දිය පිණිස නොව්, යම කිසිවෙකු පොළොතලය මත මනුෂ්‍ය ඝාතනයෙන් දූෂණයෙහි යෙදේ නම්, ඒ වූ කලී මුළු මානව සංහතියම ඝාතනය කිරීමක් බඳු වේ. කාන්තාවන්, දරුවන්, වැඩි මහළුන්, රෝගීන් හා ආබාධිතයන්ට හිංසා උපද්‍රව සිදුකිරීම තහනම් වේ. සෑම අවස්ථාවක දීම කාන්තාවන් ගේ පතිවතයට ගරු කළ යුතුය. දිළින්දන්ට ආහාර පාන පිළිගැන්විය යුතුය. අඳිවත් නැත්තවුන්ට වස්ත්‍රාදිය පිදිය යුතුය. තුවාල ලැබවුන්ට හා රෝගීන්ට ඔවුන් ඉස්ලාමීය සමාජයට අයත් වූවත්, සතුරු පිළෙහි සිටියත් අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලාබාදිය යුතුය.

ඉස්ලාමහි මානව අයිතිවාසිකම සමබන්ධයෙන් කතිකා කිරීමෙදී එහි සැබෑ අදහස වනුයේ එකී අයිතිවාසිකම, අල්ලාහ් විසින් ප්‍රදානය කළාවූ දේ බවයි. එනම මුළු උරුමක්කාරයා අල්ලාහ් විතරම ය. ඒවා කිසියම රජකු හෝ රාජ්‍ය සභාවකින් ප්‍රදානය කෙරුණේ නොවේ. රජුන් හෝ රාජ්‍ය සභාවිසින් පුදන ලද අයිතිවාසිකම පෙරළා ඔවුන් විසින්ම අවලංගු කළ හැකිය. ආඥාදායක පාලකයන් විසින් හිමිකෙරෙන අයිතිවාසිකම සමබන්ධයෙන් ද තත්ත්වය එසේ ම වේ. ඔවුන්ගේ අභිමතය පරිදි අයිතිවාසිකම පිදීමත්, පෙරළා අවලංගු කිරීමත් එමෙන් ම ඒ තිතිරිතින් ප්‍රසිද්ධියේ තමන් විසින් ම කඩ කිරීමත් ඔවුන්ට සුළු දෙයකි. එහෙත්, ඉස්ලාමහි දැක්වෙන මිනිස් අයිතිවාසිකම අල්ලාහ් විසින් ම ප්‍රදානය කරන ලද්දක් බැවින්, ලොවැති කවර රාජ්‍ය සභාවකට හෝ රජයකට ඒවායේ වෙනස් කම හෝ සංශෝධනයක් සිදු කිරීමට, කිසිදු උරුමයක් නැත. බලයක් නැත. මෙ වූ කලී හුදෙක් නාම මාත්‍රයෙන් ප්‍රදර්ශනය කිරීමෙ අරමුණින්, ලේඛන වලට පමණක් සීමා කළ මානව අයිතිවාසිකම නොවේ. දර්ශනික සිද්ධාන්ත මෙන්, ස්වභාවික ජීවිතයෙන් ඈත් කොට පනවන ලද මානව අයිතිවාසිකම ද නොවේ.

අල්ලාහ් විසින් පනවන ලද මෙය, එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම පිළිබඳ ප්‍රකාශනයට සමකළ නොහැකිය. හේතුව එක්සත් ජාතීන් විසින් සමපාදිත ප්‍රඥප්තිය මිනිසුන් කෙරේ ආදේශ කළ නොහැකි නමුත්, අල්ලාහ්ගේ නීතිය සෑම ඊමාන්ධාරියෙකුටම විශ්වාසවන්තයකුට ම පොදු වෙයි. එය ඉස්ලාමීය භක්තියේ අංගයකි. මුස්ලිමවරු යයි හඳුන්වා ගන්නා වූ සෑම මුස්ලිමවරයෙකුම පාලකයෙකු ම එය පිළිගත යුතු අතර, මැනවින් වටහා ගෙන ක්‍රියාත්මක කළ යුතුය. අල්ලාහ්ගේ

සහතිකයක් සහිත, එකී අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම අතපසු කිරීම හෝ ඒවා ප්‍රතික්ෂේප කිරීමට පෙළඹීම නො එසේ නම්, ඒවායේ සංශෝධන වෙනස්කම් සිදුකිරීමට තැත් කිරීම හෝ නාම මාත්‍රයෙන් පිළිගෙන, ප්‍රායෝගික වශයෙන් ඒවා කඩකිරීම වරදක් වේ. එබඳු වරදක් සිදුකරන රජයකට අත්වන අඩුවම අල්කුර්ආනයේ පැහැදිලිව සඳහන් වේ.

"අල්ලාහ් විසින් පහළකළ දෙයට අනුකූල ව යුක්ති විනිශ්චය නොකරන්නෝ මු'මින්වරු නොවෙති."
(අල් කුර්ආනය 5:44)

## ඉස්ලාමීය රජයක් තුළ මානව අයිතිවාසිකම්

(1) දේපල සම්පත්වල ආරක්ෂාව අවසාන හජ් මෙහෙය සමයේ දී රසූලුල්ලාහ් (සල්) තුමා කළ දේශනයේ මෙසේ සඳහන් කළේය. "කියාමත් දවසේ යළි මතුව් ස්වාමියා හමුවන තාක්, කෙනෙකුගේ ප්‍රාණය හා දේපළ සම්පත් අනෙකාට තහනම් වේ". ඉස්ලාමීය රජයක් තුළ වසන නොමුස්ලිම්වරුන් දිම්මිවරුන් ගැන ද රසූලුල්ලාහ් (සල්) තුමා සඳහන් කරයි. "සම්මුතියට බැඳී සිටින වුන්, දිම්මිවරුන් ඝාතනය කරන්නාට ස්වර්ගයේ සුවඳ හෝ නොදැනෙන්නේය."

(2)ගරුත්වයේ ආරක්ෂාව

අල් කුර්ආනයේ, මෙසේ සඳහන් වේ,

1.මු'මින්වරුන්, ඔබ අතුරින් පිරිසක්,සෙසු පිරිසකගේ උපහාසයට ලක් නොකරන්න.

2.ඔබ එකිනෙකා අපහාස නොකරන්න.

3.පටබැඳි නම්වලින් අනුන්ට නිග්‍රහ නොකරන්න.

4.ඕපාදූපවල නොයෙදෙන්න. අනුන් නැති තැන ඔවුන්ගේ වැරදි කතා නොකරන්න.(අල් කුර්ආනය 49:11-12).

(3) පෞද්ගලික ජීවිතය පිළිබඳ ආරක්ෂාව.

අල් කුර්ආනයේ මේ අණපනත් පැනවේ.
1.අනුන්ගේ රහස් නොසොයන්න.

2.ගෙහිමියාගේ අනුමැතිය ඇතිබැව් තිශ්චය වනතාක් ඔහුගේ ගෙතුළට නොපිවිසෙන්න.

(4) පෞද්ගලික නිදහසට ආරක්ෂාව.

විවෘත උසාවියක තඩු විභාගයකින් තොර ව කිසිදු පුද්ගලයෙකු සිරගත කිරීම ඉස්ලාමයෙන් තහනම් වේ. කෙනෙකු සැකපිට අත්අඩංගුවට ගෙන, ඔහුගේ නිදහසට හා ආරක්ෂාවට කරුණු ඉදිරිපත් කිරීමේ සැලකිය යුතු අවස්ථාවක් ලබා නොදී, බන්ධනාගාර ගත කිරීම ඉස්ලාමයෙන් සපුරා තහනම් වේ.

(5) ආඥාදායකත්වයට එරෙහිවීමේ උරුමය

ඉස්ලාමයෙන් හිමිකර දී ඇති මානව අයිතිවාසිකම් අතර රජයක ඒකාධිපති වාදයට එරෙහි ව නැගී සිටීමේ අයිතිවාසිකම ද අඩංගු වේ. මේ පිළිබඳ ව අල් කුර්ආනයේ මෙසේ සඳහන් වේ.''කෙනෙකුට තුවාල සිදුකිරීමක් වූ කලෙක විනා ප්‍රසිද්ධියේ වරදක් කතාකිරීමේ ක්‍රියාව අල්ලාහ් නොරුස්සයි''.

පෙර සඳහන් කළාක් මෙන්, සෑම බලයක් ම ආධිපත්‍යයක් ම අල්ලාහ් සතු වේ. මිනිසා සතු වන්නේ,හුදෙක් නියෝජිතයෙකුට හිමිවන තරමේ සීමිත බලයකි. මෙබඳු වගකීමක්, බලයක් දරන්නා එය මහ ජනතාවගේ සේවය පිණිස යොදා ගත යුතු අතර මහ ජනතාව හමුවේ ගරුසරු ව පෙනී සිටිය යුතුය. මෙය, හස්රත් අබූබක්කර් (රලි) තුමා විසින් ආදර්ශයෙන් සනාථ කරන ලදී. එතුමා කලීෆා වීමෙන් පසු කළ කුළුදුල් දේශනයේ දී'මා නිවැරදි ව සිටිනතාක් කල් මට සහයෝගය දක්වන්න. මා වරදක් කරන කල එය නිදෙස් කරවන්න. මා, අල්ලාහ් සහ රසූලුල්ලාහ් (සල්) තුමාගේ අණපනත්, හා අවවාදනුශාසනා පිළිපදින තාක් කල් මට කීකරුවන්න. මා එයින් බැහැර වනකල මගෙන් ඉවත් වන්න.''

(6) කතා කිරීමේ නිදහස.

වැරැදි හා ප්‍රචණ්ඩ ක්‍රියා පැතිරවීමට නොව, සිල්වත් බව හා සත්‍යය ස්ථාපනය කිරීමේ අරමුණින්, ඉස්ලාමීය රජයක සෑම පුරවැසියෙකුටම සිතීමේ හා කතාකිරීමේ නිදහස ඉස්ලාමයෙන් ප්‍රදානය කෙරේ. ඉස්ලාමීය කතා කිරීම නිදහස වූ කලී, වත්මන්හි බටහිර රටවල පවත්නා එකී නිදහස් පිළිවෙතට වඩා අතිශයින් උසස්ය. කිසිදු හේතුවක් මත, වැරැදි හා ප්‍රචණ්ඩකම් ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලට

ඉස්ලාමයෙන් අනුමැතිය නොලැබේ. විවේචනය කිරීමේ මුවාවෙන්, නොමනා හා අසංවර ලෙස කතා කිරීමට කිසිවෙකුට අයිතිවාසිකමක් නැත. යම්යම් අවස්ථාවල, නිශ්චිත කරුණු සඳහා `වහි´ පහළ වූවා දැයි රසූලුල්ලාහ් (සල්) ගෙන් විමසීම සහාබාවරුන්ගේ සිරිත විය. එබඳු `වහි´ පහළ වීමක් නොවීණැයි එතුමා පළ කළා තම එකී කරුණු සම්බන්ධයෙන්, මුස්ලිමුන් තම නිදහස් අදහස් ප්‍රකාශ කිරීමද සිරිත විය.

## (7) සමිති සමාගම සඳහා නිදහස

සමිති, සමාගම හෝ පක්ෂ සංවිධාන යනාදිය ස්ථාපනය කරගැනීම පිණිස ඉස්ලාමය, ස්වකීය ජනතාවට නිදහස ප්‍රදානය කරයි. මෙම නිදහස ද යම්යම් පොදු නීතින් ට යටත් වේ.

## (8) සිතීමේ හා ඇදහීමේ නිදහස

ඉස්ලාම්හි මෙසේ ප්‍රකාශ වේ. ශ්‍රද්ධාව පිළිබඳ ව බලපෑමක් නොතිබිය යුතුය. මෙයට පටහැනි ලෙස, ඒක පාක්ෂික සමාජයන්හි මෙකී පුද්ගල නිදහස ඉඳුරා අහිමි කර ඇති රජයක මෙකී අයුතු බලපෑම මගින් මිනිසා එක්තරා වහල් බැම්මකට නතු කොට ඇත. එක්තරා අවධියක, මිනිසුන් වහල් භාවයේ තබා ගැනීමේ ක්‍රියාව, මිනිසා මත මිනිසා ඉඳුරා ආධිපත්‍යය පවත්වා ගැනීමක් වශයෙන් සලකනු ලැබුණි. එබඳු වහල් වෘත්තිය, දැන් නීතියෙන් තහනම් කර ඇත. නමුත්, ඒ වෙනුවට ඒක පාක්ෂික රාජ්‍යයන්හි ඒ හා සමාන රාජ්‍ය තාන්ත්‍රික නීති මගින් මිනිසුන් පාලනය කෙරේ.

## (9) ආගමික නිදහස හා ආරක්ෂාව

සිතීමේ හා ඇදහිලි පිළිබඳ නිදහස අනුව කෙනෙකුගේ ආගමික දෘෂ්ටියට අදාළ ගරුත්වය ඉස්ලාම මගින් ප්‍රත්‍යක්ෂ කෙරේ. මෙකී අයිතිවාසිකමට පටහැණිව කිසිවක් කිරීම හෝ ප්‍රකාශ කිරීමක් කළ නොහැකිය.

## (10) වැරැදි සිර දඬුවමින් ආරක්ෂාව

සෙස්සෙකු කළ වරදක් අපරාධයක් සඳහා අනෙකෙකු සිරගත කිරීමේ ක්‍රියාවෙන් ඉස්ලාම් ආරක්ෂාව සලසා දෙයි. මෙම පිළිවෙත, අල් කුර්ආනයේ මෙසේ විග්‍රහ කෙරේ. ''කෙනෙකුගේ බරක් තවත් කෙනෙකු මත නොපැටවිය යුතුය.''

(11) මූලික අවශ්‍යතා සඳහා වූ අයිතිවාසිකම.

දිළින්දන්ට උදව් උපකාර කරමින් සහ යෝගය දක්විය යුතුය. මෙය දිළින්දන් සඳහා වූ අයිතිවාසිකමකි. "තවද ඔවුන්ගේ වස්තුවෙන් නැති බැරි දනන්ට උරුමයක් ඇත".

(12) අධිකරණය හමුවේ සමානාත්මතාවය.

ඉස්ලාම, ස්වකීය බැතිමතුන්ට නීතිය හමුවේ සම්පූර්ණ සමානාත්මතාවය පිරිනමයි.

(13) නීතියට පිටුපා නොයන පාලකයන්

එක්තරා ප්‍රභූ කාන්තාවක් සොරකමක් කළෙන්, අත් අඩංගුවට ගනු ලැබුවාය. මෙ නඩුව රසූලුල්ලාහ් (සල්) තුමා හමුවට ගෙනෙන ලදී. ඇයට දඬුවම් නොකළයුතුයැයි සෙස්සෝ එතුමා ට නිර්දේශ කළහ. රසූලුල්ලාහ් (සල්) තුමාගේ පිළිතුර වූයේ මෙයයි. "ඔබට කලින් විසූ ජාතීන් විනාශයටපත්වූයේ, ඔවුන් සාමාන්‍ය පුරවැසියන්ට දඬුවම් කළ අතර, තමන්ගේ උසස් ඥතීන් කළ අපරාධනයට දඬුවම් නොකළ හෙයිනි. මා ජීවත් කරවන ඔහුගේ නාමයෙන්, මුහම්මද් ගේ දූ ෆාතිමා (තම දියණිය) මෙ අපරාධය කළත් මම ඇයගේ අත කපන්නේමි."

(14) රාජ්‍ය කටයුතු වල නිරතවීමෙ අයිතිවාසිකම්

"තවද, ඔවුන්ගේ කාර්‍යපරිපාටින් ඔවුනතර කෙරෙන සාකච්ඡාවන් මගින් සිදුවේ." (අල් කුර්ආනය 42:38) 'ෂූරා' හෙවත් ව්‍යවස්ථාදායක සභාව යන්නෙහි අරුත එයයි. අනෙකක් නොවේ. රජයේ විධායක නායකයා හා සෙසු සාමාජිකයෝ, මහජනතාවගේ නිදහස් ඡන්දයෙන් තේරී පත්විය යුත්තාහ.

අවසාන වශයෙන්, ඉහතසඳහන් කළ හා නොකළ මානව අයිතිවාසිකම් අත්කරගැත්මෙහි ලා ඉස්ලාම ක්‍රියාකරන්නේ ඒවා ආරක්ෂා කිරීමෙන් පමණක් නොව, ප්‍රධාන වශයෙන් ම පවුල් මහත්තත්වය (රදළවාදය), භාෂාමය අහංකාරකම, හා ආර්ථික වරප්‍රසාද බඳු පහත් කිරිසන් ආකල්ප වලින් මිදීමට ද මිනිසාට ඇරයුම් කරමිනි. ඉස්ලාම මානව වර්ගයාට ආරාධනය කරන්නේ, උදර මනසක් සහිතව, මහඟු පැවැත්මක් හා එමගින් සහෝදරත්වයේ ශ්‍රේෂ්ඨත්වය අවබෝධ කරගැත්මෙහි ලා ඉවහල් වන්නානු ජීවිතයක් පවත්වා ගැනීමටයි.

مطبعة النرجس التجارية
NARJIS PRINTING PRESS
تلفون : ٢٣١٦٦٥٣ / ٢٣١٦٦٥٤
فاكس : ٢٣١٦٨٦٦ الرباض

**هذا الكتاب عبارة عن تجميع لمطويات الندوة العالمية للشباب الإسلامي ويحتوي على العناوين التالية :**

١ – نبذة مختصرة عن الإسلام.

٢ – ماذا قالوا عن القرآن.

٣ – ماذا قالوا عن محمد ﷺ.

٤ – ماذا قالوا عن الإسلام.

٥ – حكمة النظام الإسلامي.

٦ – البعث بعد الموت.

٧ – النبوة في الإسلام.

٨ – مفهوم العبادة في الإسلام.

٩ – مفهوم الإله في الإسلام.

١٠ – حقوق الإنسان في الإسلام.

# نبذة عن الإسلام

## باللغة السنهالية

إعداد وتجميع

المكتب التعاوني للدعوة والإرشاد بالبديعة

حقوق الطبع ميسرة لكل مسلم يريد توزيعه لوجه الله أما من أراد
بيعه فعليه الإتصال بالمكتب هاتف « ٤٣٣٠٨٨٨ ـ ٤٣٣٠٤٧٠ »

## පොත තුළ

ඉස්ලාම් යනු කුමක්ද?
ඒකදේව වාදය
අල්කුර්ආනය ගැන
වක්තෘත්වය
මුහම්මද් නබි තුමා
ඉස්ලාමීය වන්දනාමාන
මරණින් මතු ජීවිතය

## محتويات الكتاب

ما هو الإسلام.
التوحيد.
ما هو القرآن.
النبوة.
الرسول صلى الله عليه وسلم.
العبادة في الإسلام.
الحياة بعد الموت.

طبع على نفقة
محمد بن إبراهيم بن عثمان الحميد رحمه الله
غفر الله له ولوالديه

للمساهمة في طباعة الكتاب
شركة الراجحي - ٢٠٤٠١٠٩٠٩٢

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بحي الروضة بالرياض
تحت إشراف وزارة الشئون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف ، ٢٤٩٢٣٢٧ فاكس ، ٢٤٠١١٧٥ البريد الإلكتروني ، mrawdhah@hotmail.com ص.ب ٨٧٢٩٩ الرياض ١١٦٤٢